සිව්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම් වලට අදාල 1996 ප්‍රධාන නීති අණපනත්

		පිටුව
1.	1996 අංක 1 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත	I
2.	1996 අංක 5 දරණ ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත	VIII
3.	1996 අංක 6 දරණ මුද්දර ගාස්තු (සංශෝධන) පනත	XII
4.	1996 අංක 7 දරණ සුරාබදු (සංශෝධන) පනත	XIII
5.	1996 අංක 11 දරණ ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත	XIV
6.	1996 අංක 16 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත	XV
7.	1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත	XXIV
8.	1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසාය පුනරුත්ථාපනය කිරීමේ පනත	XXXI
9.	1996 අංක 34 දරණ භාණ්ඩ හා සේවා බදු පනත	XXXV
10.	1996 අංක 35 දරණ විසර්ජන පනත	LXVII
11.	1996 අංක 36 දරණ ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත	LXIX
12.	1996 අංක 37 දරණ ජාතිය රැකගැනීමේ දයක මුදල් (සංශෝධන) පනත	LXXI
13.	1996 අංක 38 දරණ මුද්දර ගාස්තු (සංශෝධන) පනත	LXXII

1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පනත

[සහතිකය සටහන් කළේ 1996 ජනවාරි මස 09 වන දින]

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

I කොටස

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම

2. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ කොමිෂන් සභාව (1) වන උප වගන්තියේ ඊට දෙනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීමද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. :-

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් දෙදෙනෙක් : එනම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා : සහ

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, එක් සාමාජිකයකු රජයේ නිලධරයකු විය යුතු, හතරකට නොඅඩු සහ හයකට නොවැඩි සාමාජික සංඛ්‍යාවක්

(2) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කළ යුතුය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ ධුර කාලය සහ කොමිෂන් සභාවේ සාමජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සම්බන්ධයෙන්ද කොමිෂන් සභාවේ රැස්වීම් සහ මුද්‍රාව සම්බන්ධයෙන් ද මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලපැවැත් විය යුතු ය.

II වන කොටස

කර්තව්‍ය සහ බලතල

4. පහත දැක්වෙන අරමුණු ඇතිව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය පිළිබඳව රජයට උපදෙස් දීම සහ සහායවීම් කොමිෂන් සභාවේ කර්තව්‍ය විය යුතුය :-

(අ) රටේ ආර්ථික සංවර්ධනය නංවාලීම සහ කඩිනම් කිරීම :

(ආ) ආර්ථිකයේ කාර්යක්ෂමතාම සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම :

(ඇ) නව තාක්ෂණය සහ විශේෂඥ දැනුම අත්කරගැනීමෙන් තරගකාරිත්ව පදනමක් මත අන්තර් ජාතික වෙළෙඳ පොළ වලට ප්‍රවේශය සහිතව නිෂ්පාදනය සහ සේවා උසස් තත්ත්වයකට පත් කිරීම :

(ඈ) ප්‍රාග්ධන වෙළෙඳ පොළ දියුණු කිරීම හා පුළුල් කිරීම සහ දීර්ඝ කාලීන පුද්ගලික ඉතිරි කිරීම් සංචලනය කිරීම :

(ඉ) පෞද්ගලික අංශයේ උනන්දුව ඇති කිරීම :

(ඊ) සමාජ කටයුතු වඩා හොඳින් ඉටු කළ හැකි වීම සඳහා රජයේ ආදායම් වර්ධනය කිරීම :

5. කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය:-

(අ) ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය රාජ්‍ය ව්‍යවසාය නිශ්චය කර තීරණය කිරීම සඳහා සමීක්ෂණ සහ අධ්‍යයන පැවැත්වීම

(ආ) පවත්වාගෙන යා හැකි සහ ස්ථායි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන උපක්‍රමයක් සඳහා රාමු සැකිල්ලක් සකස් කිරීම :

(ඇ) ලාභ උපදවන්නා වූ ද ජාතික වැදගත්කමක් ඇත්තා වූ ද රාජ්‍ය ව්‍යවසායන් අවිච්ඡින්නව පවත්වාගෙන යාම සහ ඒවායේ කාර්යක්ෂමතාව ගැන රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම :

ඈ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය තෝරා ගැනීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම :

(ඉ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්වල කොටස් හෝ වත්කම් මහජනයාට විකිණීම හෝ බැහැර කිරීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම :

(ඊ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද කොටස් සියල්ලම භාණ්ඩාගාරයේ ලේකම්වරයාට අයිති වූ ද සමාගම් රජය වෙනුවෙන් කළමනාකරණය කිරීම :

(උ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද කොටස් බහුතරයක් රජය හැර වෙනත් තැනැත්තන් විසින් දරනු ලබන්නා වූ ද සමාගම්වල කාර්ය සාධනය සෝදිසි කිරීම හා ඒවායේ කාර්ය සාධනයෙහි දුර්වලතා හඳුනාගැනීම සහ මේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම :

ඌ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් විධිමත් කිරීමේ දී රජයට උපදෙස් දීම සහ සහාය වීම :

(එ) රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සඳහා වූ රජයේ ප්‍රතිපත්ති සහ වැඩ සටහන්වලට කැපවීමේ හැඟීමක් මහජනයා තුළ දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ මහජනයා තුළ දැනුවත් බව ඇති කිරීමට රජයට සහාය වීම :

(ඒ) ඒ ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ (ඉ) ඡේදයේ සඳහන් සමාගම්වල කොටස් අයිතියෙහි ලද සේවක සහභාගිත්වය තහවුරු කිරීම :

(ඔ) කොමිෂන් සභාවේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් රීති සෑදීම :

(ඕ) එහි කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමට අවශ්‍ය යයි සැළකෙන ගිවිසුම්වලට එළඹීම :

(ක) කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමට අවශ්‍ය නිලධරයන්, සේවකයන් හෝ අනුයෝජිතයන් පත් කිරීම, ඔවුන් සේවයේ නියුක්ත කරවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම :

(ග) සේවා පිරිස් හුවමාරු කිරීම, උපදේශක සේවා සහ සේවා පිරිස් පුහුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශවල අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග සහයෝගිතාව සඳහා ගිවිසුම්වලට එළඹීම :

(ච) යම් බැංකුවක හෝ බැංකුවල, ජංගම ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම :

(ජ) කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සුභ සිද්ධිය සඳහා අර්ථ සාධක අරමුදල් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ඇති කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම :

(ට) එහි කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ණයට ගැනීම :

(ඩ) එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ දක්ෂතා වර්ධනයට අවශ්‍ය විය හැකි ක්‍රියා මාර්ග ගැනීම :

(ණ) ප්‍රකාශන, චක්‍රලේඛ සහ පුවත්පත් දැන්වීම් නිකුත් කිරීම :

(ත) තත් කාර්ය සඳහා බලය ලැබී ඇත්නම්, රජයේ අනුයෝජිතයා වශයෙන් යම් කාරණයක හෝ ගනුදෙනුවක කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශවල කටයුතු කිරීම :

(ද) කොමිෂන් සභාවේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පහසු කිරීම සඳහා කොමිෂන් සභාවේ මතය පරිදි අවශ්‍ය සියලු කටයුතු භාර ගැනීම.

III වන කොටස
මුදල්

6\. (1) කොමිෂන් සභාවට, කොමිෂන් සභාවේ අරමුදලක් තිබිය යුතුය.

(2) (අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් :

(ආ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේදී, කොමිෂන් සභාව ලබන්නා වූ සියලු මුදල් :

(ඇ) දේශීය හෝ විදේශීය කවර වූ හෝ ප්‍රභවයකින් ගාස්තු, ප්‍රදාන, දීමනා, ත්‍යාග, තෙස්තමේන්තු දායාද වශයෙන් කොමිෂන් සභාව ලබන්නා වූ සියලු මුදල් :

(ඈ) කොමිෂන් සභාව විසින් ණයට ගන්නා සියලු මුදල් කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේදී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

7\. කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

8\. (1) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

IV වන කොටස
සාමාන්‍ය විධිවිධාන

9\. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ උපදේශය මත (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික හා අනිකුත් ප්‍රතිලාභ ඔහුට ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවට වගකිව යුතුය. උපදේශක තත්ත්වයකින් කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගී වීමට ඔහුට හිමිකම තිබිය යුතුය. නමුත් එම රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරනු ලබන බලතල, කර්තව්‍ය හා කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

10\. (1) කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන්, සේවකයන් සහ උපදේශකයන් කොමිෂන් සභාව විසින් පත් කළ හැකි අතර, එසේ පත් කරන ලද නිලධරයන්ට, සේවකයන්ට සහ උපදේශකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ද ඔවුන්ගේ සේවා කොන්දේසිද කොමිෂන් සභාව විසින් නිශ්චය කළ යුතුය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය : නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින්, ආණ්ඩුව සමග ගිවිසුමකට එළැඹුණු යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා කොමිෂන් සභාවට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

11. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වනු ලබන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු, නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උප වගන්තිය යටතේ තාවකාලිකව හෝ ස්ථිරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක ඔහු කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත්වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

12. (1) මේ පනතේ 5 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිවීම සඳහා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින්, යම් තැනැත්තෙකුට, යම් රාජ්‍ය ව්‍යවසායක ව්‍යාපාරික කටයුත්තක් හෝ ගනුදෙනුවක් පිළිබඳව එම තැනැත්තා දන්නා හෝ එම තැනැත්තාගේ සන්තකයෙහි ඇත්තාවූ සහ එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වාර්තා හෝ තොරතුරු එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත කොමිෂන් සභාවට හෝ බලය දෙන ලද තැනැත්තාට හෝ සපයන ලෙස නියම කළ හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකු ඒ වාර්තාව සැපයීමෙන් හෝ ඒ තොරතුරු හෙළිකිරීමෙන් යම් නීතියක විධි විධාන යටතේ වළක්වනු ලැබ ඇත්නම් මිස, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) අධිකරණයක් විසින් නියම කරනු ලැබුවහොත් හෝ කොමිෂන් සභාවේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා හැර, කොමිෂන් සභාව විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද යම් වාර්තා හෝ තොරතුරු යම් තැනැත්තකුට හෙළි කිරීම හෝ භාවිත කිරීම නොකළ යුතු ය.

13. කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

14. අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උප ලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එපරිද්දෙන් ඒ පනතේ විධි විධාන තේරුම් ගත යුතු ය.

15. කොමිෂන් සභාවේ වැඩ කටයුතු පිළිබඳ අවශ්‍ය වන වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අවශ්‍ය ආකෘතියකින් තමාට සපයන ලෙස ජනාධිපතිවරයා විසින් කලින් කල කොමිෂන් සභාවට විධාන කළ හැකි අතර කොමිෂන් සභාව විසින් එවැනි සෑම විධානයක්ම ඉටු කළ යුතු ය.

16. (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන යම් ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සද්භාවයෙන් කරනු ලැබුවේ යම් අධිකරණයක් අදහස් කරන්නේ නම් ඒ ක්‍රියාව සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් සිවිල් හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අය කර ගෙන නොමැති නම්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

17 (1) (අ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව යම් වාර්තා හෝ තොරතුරු සැපයීම පැහැර හරින :

(ආ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයන්ට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන :

(ඇ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක යම් කාරණයක් උවමනාවෙන්ම සඳහන් නොකර හරින :

(ඈ) 12 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධි විධාන උල්ලංඝනය කරන :

(ඉ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ සේවකයකුට උවමනාවෙන් ම බාධා කරන :

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකුම ද,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල් කරුවකු ඒ වරදට වරදකරුවකු ලෙස සැලකිය යුතු ය :

එසේ වුවද, ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද වැළැක්වීමට තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ විසින් නැතහොත් ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

18. (1) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය යටතට කොමිෂන් සභාව ඇතුළත් කිරීමේ සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 9 වන වගන්තිය යටතට කොමිෂන් සභාව ඇතුළත් කිරීමේ සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාවේ සෑම නිලධරයකුගේ, සේවකයකුගේ සහ උපදේශකයකුගේ පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(3) කොමිෂන් සභාවට මුදලින් හෝ වෙනත් ආකාරයකින් දෙන ලද පරිත්‍යාගයක්, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් දෙන ලද පරිත්‍යාගයක් වශයෙන් 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

19. කොමිෂන් සභාව විසින් 5 වන වගන්තියේ (ඉ) ඡේදය යටතේ කරන ලද නිර්දේශය අනුව, අවස්ථාවෝචිත පරිදි, එක් එක් විකිණීම අවසානයේ දී හෝ බදු දීම මගින් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම අවසානයේ දී ඒ විකිණීමට හෝ බැහැර කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් වූ වාර්තාවක් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

20. ජනාධිපතිවරයා විසින් පත් කරන ලද විශේෂ කාර්ය සාධක බලකාය විසින් 1995 මාර්තු මස 1 වන දිනයෙන් ආරම්භව නියමිත දිනයෙන් අවසාන කාල පරිච්ඡේදය ඇතුළත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සඳහා කරන ලද ක්‍රියාවක් ඒ ක්‍රියාව කිරීමට ඒ කාර්ය සාධක බලකායට නීත්‍යානුකූලව බලය දී නොතිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

21. (1) කොමිෂන් සභාව වෙත පැවරුණු නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී කර්තව්‍ය සහ කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට මේ පනතින් බලය ලැබී ඇති කරුණු සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව රීති සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

22. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් (අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"සභාපති" යන්නෙන්, 3 වන වගන්තිය යටතේ නම් කරන ලද කොමිෂන් සභාවේ සභාපතිවරයා අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටු වන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"රාජ්‍ය ව්‍යවසාය" යන්නට සංස්ථාවක් හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනයක් හෝ සියලුම කොටස් හෝ කොටස් වලින් බහුතරය හෝ රජය විසින් දරනු ලබන සමාගමක් ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

(3 වන වගන්තිය)

උපලේඛනය

කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අදාළ විධි විධාන

1. යම් තැනැත්තකු -

(අ) තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වතකු හෝ වස්තු භංගත්වයට පත්වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් නොකළ බුන්වතකු හෝ වස්තු භංගත්වයට පත්වූවකු වේ නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් විඳින හෝ විඳ ඇත්නම් ;

ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු වන්නේ ය.

2. කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු විසින්, තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයාට යොමු කරන ලිපියක් මගින් කොමිෂන් සභාවෙන් ඉල්ලා අස්විය හැකි ය.

3. අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදන්වා කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු ඉවත් කළ හැකි ය.

4. (1) නිල බලයෙන් පත්වන සාමාජිකයා, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරව ද ඒ ධුරය දරන තාක් කල් සාමාජිකයකු වශයෙන් ධුරය දැරිය යුතුය.

(2) කොමිෂන් සභාවේ සෑම පත් කළ සාමාජිකයකුම මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුවද, මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා හෝ අන්‍යාකාරයකින් ස්වකීය ධුරය අත් හරින සාමාජිකයකු වෙනුවට පත්කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයකු, කලින් ධුරය අත්හැරියහොත් මිස, තමා අනු ප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවූ කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයෙහි කටයුතු කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු හෝ අවස්ථාවෝචිත පරිදි ඒ සභාපති වරයා හෝ කොමිෂන් සභාවේ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

5. සභාපතිවරයාට සහ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

6. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ධුර කාලය කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ කාල පරිච්ඡේදය විය යුතු ය.

(2) සභාපතිවරයා විසින් තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති වශයෙන් වූ තම ධුරයෙන් කලින් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක, හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසාන කළ හැකි ය.

7. (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගත් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(2) පනතින් කොමිෂන් සභාවට පැවරී, නියමකර හෝ වෙන්කර දී ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමිෂන් සභාව විසින් සභාපතිවරයාට පැවරිය හැකි ය.

(3) යටත් පිරිසෙයින් සෑම ලිත් මාස හයකට වරක් කොමිෂන් සභාව රැස්විය යුතු ය.

(4) රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙක් විය යුතු ය.

(5) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම සහ එවැනි රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳව කාර්ය පරිපාටිය විධිමත් කෙරෙන රීති සෑදිය යුතු ය.

8. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේ දී හැර, නොකළ යුතු ය.

(4) කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් කොමිෂන් සභාව විසින් තබාගත යුතු ය.

9. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය තිබිය යුතු අතර එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.

1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 20 වන දින]

1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා ම ජාතිය රැක ගැනීමේ දායක මුදලක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.

1. මේ පනත 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ පනතේ විධිවිධාන-

(අ) (1) ශ්‍රී ලංකා පොලිස් සේවයේ සාමාජිකයකු වශයෙන් : හෝ

(11) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන්

වන යම් ධූරයකින් හෝ සේවානියුක්තියකින් ලබන ලාභ කිසිවක් හැර, (දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ අර්ථානුකූලව ලාභ වන) යම් ධූරයකින් හෝ යම් සේවානියුක්තියකින් ලාභ ලබන (මෙහි මින් මතු "සේවානියුක්තයකු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු; හෝ

(ආ) (ඇ) ඡේදයෙහි සඳහන් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වශයෙන් හැර යම් වෘත්තියක්, රක්ෂාවක් හෝ ස්වාධීන ස්වරූපයකින් යුත් සමාන රැකියාවක් කර ගෙන යන හෝ ක්‍රියාත්මක කරන (මෙහි මින් මතු "ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු : හෝ

(ඇ) යම් වෘත්තියක් : රක්ෂාවක් හෝ ස්වාධීන ස්වරූපයකින් යුත් සමාන රැකියාවක් වෙනත් තැනැත්තන් සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් කර ගෙන යන හෝ ක්‍රියාත්මක කරන (මෙහි මින් මතු "හවුල්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු : හෝ

(ඈ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හෝ සේවානියුක්තයකු සහ හවුල් කරුවකු නැතහොත් ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු : හෝ

(ඉ) සේවානියුක්තයකු හා ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු

වන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුට ම අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු ම, මේ පනතෙහි මින් මතු, "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

3. (1) මේ පනතේ පසුව සඳහන් විධිවිධානවලට යටත්ව, (මේ පනතෙහි මින් මතු "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සෑම කාර්තුවක් සඳහා ම, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති උචිත අනුප්‍රමාණ අනුව, මේ පනත අදාළ වන සෑම තැනැත්තකුගේ පඩිනඩි මත ගණන් බලනු ලබන (මේ පනතෙහි මින් මතු "දායක මුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතිය රැක ගැනීමේ දායක මුදලක්" ඒ තැනැත්තාගෙන් අය කර ලබා ගත යුතු ය.

(2) මේ පනතේ පසුව සඳහන් විධිවිධානවලට යටත්ව, යම් අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකු විසින් ගෙවිය යුතු දායක මුදල, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

4. සේවානියුක්තයකු වන මේ පනත අදාළ වන්නා වූ සෑම තැනැත්තකුගේ ම සේවායෝජක විසින්, අදාළ කාර්තුවක සෑම මාසයක් සඳහා ම ඒ මාසය සඳහා ඒ සේවායෝජක විසින් ඒ තැනැත්තාට ගෙවිය යුතු පඩිනඩිවලින් -

(1) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ මාසික පඩිනඩි වල මුළු එකතුව රුපියල් හතලිස් පන් දහසක් ඉක්මවන එහෙත් රුපියල් අනූදහසක් නොඉක්මවන්නේ නම්, ඒ මාසය සඳහා ඒ තැනැත්තාගේ පඩිනඩිවලින් සියයට දෙකකට : නැතහොත්

(11) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ මාසික පඩිනඩිවල මුළු එකතුව රුපියල් අනූදහස ඉක්මවන්නේ නම්, ඒ මාසය සඳහා ඒ තැනැත්තාගේ පඩිනඩිවලින් සියයට තුනකට

සමාන මුදලක් අඩුකර, ඒ මුදල එසේ අඩුකර ගන්නා ලද මාසය අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර

හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

5. අදාළ කාර්තුවක යම් මාසයක් සඳහා යම් සේවායෝජකයකු විසින් 4 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ වගන්තිය යටතේ අඩුකර ප්‍රේෂණය කිරීමට නියම කර ඇති යම් මුදලක්, අඩුකර ගැනීම ගැනීම පැහැර හරින හෝ අඩුකර ගෙන ප්‍රේෂණය කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ මුදල් ඒ සේවායෝජක ගෙන් අයකර ගනු ලැබිය හැකි ය. ඒ සේවායෝජක විසින් අඩු කර ගෙන ප්‍රේෂණය කිරීමට එසේ නියම කර ඇති ඒ මුදල් තක්සේරු කිරීම, ගෙවීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් සහ ඒ මුදල් ගෙවීම පැහැර හැරීම සඳහා වූ දණ්ඩන මුදල් සම්බන්ධයෙන්, දේශීය ආදායම් පනතේ 107, 108, 109 සහ 110 වන වගන්ති වල හා XXI වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

6. සේවානියුක්තයකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් 4 වන වගන්තිය යටතේ, අදාළ කාර්තුවක් සඳහා අඩු කර ප්‍රේෂණය කරනු ලැබූ මුදල්වල මුළු එකතුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු දයක මුදලට වඩා අඩුවන අවස්ථාවකදී ඒ දායක මුදල සහ එසේ අඩු කර ප්‍රේෂණය කරන ලද මුදලේ මුළු එකතුව අතර වූ වෙනස ඒ කාර්තුව අවසානයේ සිට දින පහළොවක් ඇතුළත, ඒ තැනැත්තා විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු'ය.

7. (1) මේ පනත අදාළ වන තැනැත්තකු විසින් ගෙවිය යුතු දායක මුදලක් හෝ එහි කොටසක්, ඒ දායක මුදල ගෙවීම සඳහා 3 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් දින හෝ එදිනට පෙර ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල හෝ එහි කොටස නැතහොත්, යම් අදාළ කාර්තුවක් සඳහා තක්සේරු කරුවකු විසින් තක්සේරු කරනු ලැබ, යම් දායක මුදලක් හෝ එහි කොටසක් තක්සේරු දැන්වීමෙහි සඳහන් දිනයේදී හෝ එදිනට පෙර ගෙවන ලෙස නියම කර තිබිය දී ඒ දායක මුදල හෝ එහි කොටස ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල හෝ එහි කොටස, අවස්ථාවෝචිත පරිදි 3 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් දිනයේ සිට හෝ තක්සේරු දැන්වීමෙහි සඳහන් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ඒ දිනයෙහි සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් දායක මුදලක් හෝ එහි කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, පැහැර හරිනු ලැබූ ඒ දායක මුදල හෝ එහි යම් කොටසට අමතරව, පැහැර හරින්නා විසින් -

(i) පැහැර හරිනු ලැබූ මුදලින් සියයට දහයකට සමාන මුදලක දණ්ඩන මුදලක් ; සහ

(ii) ඒ දායක මුදල ගෙවීම පැහැර හරිනු ලැබීමට පත්වීමෙන් පසුව දින තිහක් ඉකුත්වීමට පෙර ඒ දායක මුදල් ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දායක මුදල ගෙවීම පැහැර හරිනු ලැබ පවත්නා කාලය තුළ දින තිහක එක් එක් වැඩිපුර කාලයක් හෝ එහි කොටසක් සම්බන්ධයෙන් පැහැර හරිනු ලැබූ දායක මුදලින් සියයට දෙකකට සමාන මුදලක වැඩිපුර දණ්ඩන මුදලක්

ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩන මුදලක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, කිසිම අවස්ථාවකදී, ගෙවීම පැහැර හැර ඇති දායක මුදලින් සියයට පනහක් නොඉක්ම විය යුතු ය.

8. වාර්තාවලට, තක්සේරු කිරීම්වලට, තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවයට සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන වලට, ආදායම් බදු අයකර ගැනීම හා ආපසු ගෙවීමට අදාළ දේශීය ආදයම් පනතේ (94 වන සහ 95 වන වගන්තිය හැර) XIII වන පරිච්ඡේදයේ සහ XVII, XIX, XXI සහ XXIII වන පරිච්ඡේදවල විධිවිධාන ද ආදායම් බදුවලට එරෙහිව වූ අභියාචන වලට අදාළ ඒ පනතේ XVIII වන පරිච්ඡේදය ද, විවිධ කරුණු දණ්ඩන හා වැරදි සහ ඒ පනත යටතේ වූ පොදු කාරණාවලට අදාළ ඒ පනතේ XXII, XXIV හා XXVI වන පරිච්ඡේද ද, ඒ පනතේ පරිපාලනයට අදාළ ඒ පනතේ XXV පරිච්ඡේදයද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වූ තක්සේරු කිරීම්වලට, තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවයට වැරදි වාර්තාවලට, දායක මුදල් අයකර ගැනීමට සහ ආපසු ගෙවීමට, ඒ දායක මුදල්වලට එරෙහිව වූ අභියාචනාවලට, විවිධ කරුණුවලට, දණ්ඩනවලට හා වැරදිවලට සහ පොදු කාරණාවලට ද, මේ පනතේ පරිපාලනයට ද අදාළ විය යුතු ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"කොමසාරිස් ජනරාල්වරයා", "තැනැත්තා" සහ "ප්‍රමුඛ හවුල්කරු" යන යෙදුම්වල දේශීය ආදායම් පනතෙහි ඒවාට දී ඇති ඒ ඒ අර්ථ ම ඇත්තේ ය ;

"සේවා යෝජක" යන්නෙන්-

(අ) සේවා නියුක්තයකු ලෙස යම් පුද්ගලයකු සේවා ඉටු කරන්නේ යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් සඳහා ද ඒ තැනැත්තා, ඒ හවුල් ව්‍යාපාරය, ඒ පුද්ගල මණ්ඩලය හෝ ඒ සංවිධානය

(ආ) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ අර්ථානුකූලව සේවානියුක්තියෙන් වන යම් ලාභ ගෙවන යම් තැනැත්තකු හවුල් ව්‍යාපාරයක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් ;

(ඇ) කලින් සේවානියුක්තයකුව සිටි සේවානියුක්තයකුගේ පූර්ව සේවා සඳහා ඒ සේවානියුක්තයාට හෝ වෙනත් යම් තැනැත්තකුට යම් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් යම් පාරිශ්‍රමිකයන් ගෙවන යම් තැනැත්තකු හවුල් ව්‍යාපාරයක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් අදහස් වන අතර, මෙහි පහත I වන තීරයෙහි සඳහන් මණ්ඩලයක්, ආයතනයක් නැතහොත් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, II වන තීරයෙහි අනුරූප සටහනෙහි සඳහන් තැනැත්තා ඊට ඇතුළත් වේ:-

	I වන තීරය	II වන තීරය
1	සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක්	ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්වරයා, කළමනාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධාරියා
2.	හවුල් ව්‍යාපාරයක්	ප්‍රමුඛ හවුල්කරු හෝ ශ්‍රී ලංකාවෙහි පදිංචි යම් සක්‍රිය හවුල්කරුවකු සහ කිසිම සක්‍රිය හවුල්කරුවකු ශ්‍රී ලංකාවෙහි පදිංචිව නොසිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා.
3.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා	පඩිනඩි ගෙවීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තා
4.	පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකු , පළාත් ආණ්ඩුකාරවරයකු, පළාතක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු , පළාත් සභාවක මන්ත්‍රීවරයකු .	- එම -
5.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ අර්ථ කථනය කර ඇති පරිදි, යම් අධිකරණ නිලධරයකු	- එම -
6.	දේශීය ආදායම් පනතේ 9(1) (ආආ) (x) වන වගන්තියේ සඳහන් තැනැත්තකු	- එම -

"පඩිනඩි" යන්න, යම් අදාළ කාර්තුවක් සඟ-

(අ) සේවා නියුක්තයකු වන, මේ පනත අදාළ වන්නා වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, දේශීය ආදායම් පනතේ 4(1) (අ) (1) වන වගන්තියේ අර්ථානුකූලව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ සේවානියුක්තියෙන් වන අතිකාල ගෙවීම් හැර (ශ්‍රී ලංකාව තුළදී උද්ගත වන, උපචිත වන හෝ ගෙවනු ලබන) ලාභ ඉන් අදහස් වේ :

(ආ) ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තා කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන වෘත්තියෙන්, රක්ෂාවෙන් හෝ ස්වාධීන ස්වරූපයකින් යුත් සමාන රැකියාවෙන් ඒ කාර්තුව සඳහා ලැබෙන, 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ අර්ථානුකූලව පිරිවැටුමෙන් සියයට පනහක් ඉන් අදහස් වේ.

(ඇ) හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ හවුල්කරු, හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයේ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ අර්ථානුකූලව ඒ කාර්තුව සඳහා වන පිරිවැටුමෙන් සියයට විසිපහක ප්‍රමාණයක්, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන් අතර, ඒ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභ බෙදා හරිනු ලබන අනුපාතය අනුව බෙදාහරිනු ලබන්නේ නම්, ඒ හවුල්කරුට ආරෝපණය කළ හැකි ඒ පිරිවැටුමේ ඒ කොටස ඉන් අදහස් වේ :

(ඈ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු නැතහොත් සේවානියුක්තයකු සහ හවුල්කරුවකු හෝ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු සහ හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, අවස්ථාවෝචිත පරිදි, (අ) ඡේදයෙහි සඳහන් ලාභ සහ (ආ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ ප්‍රතිශතය යන්නෙහි මුළු එකතුව හෝ (අ) ඡේදයෙහි සඳහන් ලාභ සහ (ඇ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව හෝ (ආ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ ප්‍රතිශතය සහ (ඇ) ඡේදයේ සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව ඉන් අදහස් වේ :

(ඉ) සේවානියුක්තයකු සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හා හවුල්කරුවකු වන, මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, (අ) ඡේදයෙහි සඳහන් ලාභ සහ (ආ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ ප්‍රතිශතය හා (ඇ) ඡේදයෙහි සඳහන් පිරිවැටුමේ කොටස යන්නෙහි මුළු එකතුව ඉන් අදහස් වේ :

"දේශීය ආදායම් පනත" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ.

උපලේඛනය (3 වන වගන්තිය)

අදාළ කාර්තුවක් සඳහා වූ පඩිනඩි	අනුප්‍රමාණය
අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි, රුපියල් හතලිස් පන් දහසක් නොඉක්මවන අවස්ථාවක	නැත.
අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි, රුපියල් හතලිස් පන්දහසක් ඉක්මවන එහෙත් රුපියල් අනූදහසක් නොඉක්මවන අවස්ථාවක	ඒ පඩිනඩිවලින් සියයට 2
අදාළ කාර්තුවක් සඳහා මේ පනත අදාළ වන තැනැත්තකුගේ පඩිනඩි රුපියල් අනූදහසක් ඉක්මවන අවස්ථාවක	ඒ පඩිනඩිවලින් සියයට 3

1996 අංක 6 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින]

1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත 1996 අංක 6 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1993 අංක 63 දරන පනතින් අවසන් වරට සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තියේ (23) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"(24) ණය සුරැකුම්පතක් පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය :

(25) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථය ඇතුළත වූ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය හෝ ඒ පනතේ 59 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අධිකරණයක ගොනු කරන ලද ලේඛනය : සහ

(26) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථය ඇතුළත වූ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක සාමාජිකයකු විසින්, ඒ ලියාපදිංචි කළ සමිතියේ වාසියට සහ එහි ව්‍යාපාරයට අදාළව ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය." .

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ71 වන වගන්තියේ "ණය පත් සමාගම" යන පාඨයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-
"ණය සුරැකුම්පත" යන්නෙන් ලැයිස්තුගත පොදු සමාගමක බැඳීමක් ඇති කරන්නාවූ, ලේඛනගත කරන්නා වූ හෝ පිළිගන්නා වූ ද, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකදී විකිණිය හැකි හෝ පැවරිය හැකි වූ ද, යම් බැඳුම්කරයක්, නෝට්ටුවක්, ඍණ පත්‍රයක්, ණය මුදලක්, ව්‍යාපාර වස්තුවක් හෝ වෙනත් සුරැකුම්පතක් හෝ සාධන පත්‍රයක් අදහස් වේ.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 25 වන දින]

සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1996 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තියේ (ඇ) ජේදයේ "බෲවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෲවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) එහි (අ) ජේදයේ "ඉස්කාගාර සහ බෲවරි" යන වචන වෙනුවට "ඉස්කාගාර, බෲවරි සහ මත්පැන් නිෂ්පාදනාගාර" යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) එහි (ඇ) ජේදයේ "බෲවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෲවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බෲවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෲවරියක්, මත්පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ජේදයේ "ඉස්කාගාරයක හෝ බෲවරියක" යන වචන වෙනුවට "ඉස්කාගාරයක, බෲවරියක හෝ මත්පැන් නිෂ්පාදනාගාරයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (ඇ) ජේදයේ (1) අනුජේදයේ "ඉස්කාගාරයේ හෝ බෲවරියේ" යන වචන වෙනුවට "ඉස්කාගාරයේ, බෲවරියේ හෝ මත්පැන් නිෂ්පාදනාගාරයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (ඉ) ජේදයේ "බෲවරියක් හෝ ගුදමක්" යන වචන වෙනුවට "බෲවරියක්, මත් පැන් නිෂ්පාදනාගාරයක් හෝ ගුදමක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 11 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූනි මස 20 වන දින]

1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත 1996 අංක 11 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 4 වන වගන්තියේ (ට) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ-

(අ) (අ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන" යන වචන වෙනුවට "මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ආ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන වෙනුවට "(203 වන අධිකාරිය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ ඡේදයේ (11) වන අනුඡේදයේ-

(අ) (අ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන" යන වචන වෙනුවට "මේ අනු ඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) (ආ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන වෙනුවට "(203 වන අධිකාරිය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 6 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"6. 1996 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 1997 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා-

(i) මේ අයිතමයේ (11) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත සියයට 4.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම මත සියයට 2".

5. මේ පනතේ 2, 3 හා 4 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1995 දෙසැම්බර් 29 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 17 වන දින]

1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධන කිරීම සඳහා වූ පනතකි

1. මේ පනත 1996 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම පනතේ 8 වන වගන්තියෙහි (ඈ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එම ඡේදයේ (Lxix) වන අනුඡේදයේ "ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදලේ ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන්) ;

(2) එම ඡේදයෙහි (Lxx) වන අනුඡේදයේ "ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන්

(3) එම ඡේදයේ (Lxx) වන අනුපාතයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :-

"(Lxx) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවක පිරිස් කළමනාකරණ ආයතනයේ ලාභ සහ ආදායම"

(Lxxii) 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(අඅඅ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලසමග1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ගිවිසුමකට ඇතුළත් වූ සමාගමක් විසින් එම ගිවිසුමේ නියමයන්ට අනුව එම සමාගමේ ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් වන්නා වූ කාල පරිච්ඡේදය තුල හෝ ඊට පසු එක් වර්ෂයක් ඇතුළත. ආදායම් බද්දෙන් නිදහස් වන්නා වූ ලාභ සහ ආදායමෙන් එම සමාගමේ යම් කොටස් හිමියෙකුට ගෙවන ලද යම් ලාභාංශයන් "

(2) එම වගන්තියේ (ආ) ඡේදයෙහි "17ඒ, 18" යන ඉලක්කම් වෙනුවට "17 ඒ වන, 17 ඔ වන සහ 18 වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ඇ) ඡේදයේ "(අ) හෝ (ආ) ඡේදයෙහි" යන වචන වෙනුවට "(අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන්

(4) එම වගන්තියේ (ඇඇ) ඡේදයේ "(අ) හෝ (ආ) ඡේදවල" යන වචන යෙදෙන කවර තැනෙක වුවද "(අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන්

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (න) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(නන) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසා දෙනු ලැබූ හෝ ලබා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයෙකු වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ලබාගත් මුදලේ රුපියල් දෙදහසක් නොඉක්මවන කොටස",

(2) ඒ වගන්තියේ (ප) ඡේදයේ "අර්ථානුකූල යම් ලාභ සහ ආදායම; සහ" යන වචන වෙනුවට "අර්ථානුකූල යම් ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (බ) ඡේදයේ "මුදල්වල එකතු වන කොටස" යන වචන වෙනුවට "මුදල් වල එකතු වන කොටස; සහ " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (බ) ජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ජේදය එකතු කිරීමෙන් ;

"(ම) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් පවත්වනු ලබන ගොවිසෙත ලොතරැයියෙන් ලැබෙන ලාභ සහ ආදායම."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඒ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඕ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

දියුණු තාක්ෂණය අත්කර ගන්නා සහ භාවිතා කරන ව්‍යවසායක ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම

17ඕ. (1) යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා හෝ යම් සේවයක් සැළසීම සඳහා වූ ද (2) වන උපවගන්තියේ සඳහන් වන්නා වූද යම් ව්‍යවසායක නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම, අදාළ දිනයෙහි සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) අදාළ දිනයෙන් ආරම්භ වන මාස 12 ක කාල පරිච්ඡේදයක් ඇතුළත දියුණු තාක්ෂණය අත්කර ගැනීම සහ භාවිත කිරීම සඳහා රුපියල් මිලියන දහයකට නොඅඩු නව ප්‍රාග්ධන වියදමක් දරා ඇත්තා වූ ද ව්‍යවසායක් :

(ආ) තත් කාර්ය සඳහා 1996 සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, මේ වගන්තිය අදාළ වන ව්‍යවසායක් බවට 1997 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද;

(ඇ) ඒ ව්‍යවසාය විසින් අදාළ දිනයෙන් අවසාන වන වර්ෂය ඇතුළත සේවයේ නියුක්ත කරගනු ලැබූ සේවා නියුක්තයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පනස් දෙනකුට නො අඩු සේවා නියුක්තයන් සංඛ්‍යාවක් අදාළ දිනයේ දී හෝ ඒ දිනයේ සිට මාස හයක් ඉකුත් වීමට පෙර සේවයේ නියුක්ත කරගන්නා වූ සහ, එකී සංඛ්‍යාවට එකී අවුරුදු පහක කාල පරිච්ඡේදය ඉකුත් වන තෙක් දිගටම සේවයේ නියුක්ත කර ගන්නා වූ ද :-

යම් ව්‍යවසායකට අදාළ විය යුතු ය.

එසේ වුව ද (1) වන උපවගන්තියේ සඳහන් එකී අවුරුදු පහක කාලපරිච්ඡේදය ඇතුළත යම් තක්සේරු වර්ෂයක් තුළ දී, එම ව්‍යවසායේ සේවයේ නියුක්ත කරගෙන සිටින්නා වූ සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව, එකී සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පණහකින් වැඩි නොවන අවස්ථාවක, ඒ ව්‍යවසායේ (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ එම ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු ය.

මේ උපවගන්තියේ "සේවා නියුක්තයා" සහ "සාමාන්‍ය සංඛ්‍යාව" යන යෙදුම්වල 16 ඇ වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ජේදයේ (4) වන අනුජේදයේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා-

(අ) යම් තක්සේරු වර්ෂයකට සහ යම් ව්‍යවසායකට අදාළව "නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම" යන යෙදුමින් -

(1) එම තක්සේරු වර්ෂයට අදාළ කළ හැකි ලෙස මේ ජේදයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති උචිත ප්‍රතිශතය අඩු කළ ඒ ව්‍යවසායේ එම තක්සේරු වර්ෂය සඳහා (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීමෙන් ලැබුණු යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ජේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායමෙහි,

(11) එම ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථාවක අදාළ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන සඳහා ගණන් බලන ලද, නැතහොත්, එම ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනකට අඩු කාලයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථා වක එසේ ව්‍යාපාරය කරගෙන ගිය මුළු කාල පරිච්ඡේදය සඳහා ගණන් බලන ලද ඒ ව්‍යවසායේ සාමාන්‍ය ලාභ සහ ආදායම් ඉක්මවන අතිරික්ත ප්‍රමාණය අදහස් වේ.

එහෙත් එකී අතිරික්ත ප්‍රමාණය නව ප්‍රාග්ධන වියදමේ සහ අදාළ දිනයේ දී එම ව්‍යවසාය විසින් යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හෝ සෑදීමට හෝ යම් සේවා සැලසීමට හෝ භාවිත කරනු ලබමින් තිබුණු -

(1) යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ :
සහ
(11) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර)
(1) වන අනුජේදයේ සඳහන් නොවන යම් වත්කමක්

අත්කර ගැනීමේ අවස්ථාවේදී වටිනාකමේ එකතුවට නව ප්‍රාග්ධන වියදම දරන අනුපාතයට වන අනුපාතයක් (යම් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලදී ගෙන නැවත විකිණීමෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් හැර) (3) වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව එකී ව්‍යවසායයේ එකී තක්සේරු වර්ෂය සඳහා වූ ලාබ සහ ආදායමට යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද එම මුදල් ප්‍රමාණයෙන් සියයට එකසිය විස්සක් නොඉක්මවිය යුතු ය :-

එසේ වුවද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ව්‍යවසාය 17 ඊ වගන්තියේ විධිවිධාන අදාළ වන ව්‍යවසායක් ද වන අවස්ථාවක බැඩි සහනය සඳහා විධිවිධාන සලස්වන වගන්තියේ විධිවිධාන එම තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

උපලේඛනය

	(සියයට)
අදාළ දිනය යෙදෙන තක්සේරු වර්ෂය ... (එම තක්සේරු වර්ෂය මේ උපලේඛනයේ ''අදාළ වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලැබේ)	10 යි
අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පළමු වන වර්ෂය	10 යි
අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන දෙවන වර්ෂය	12.5 යි
අදාළ වර්ෂයට ඉක්බිතව එළඹෙන තුන්වන වර්ෂය	15 යි
අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන හතරවන වර්ෂය	17.5 යි
අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පස්වන වර්ෂය	20 යි

(අ) ''අදාළ දිනය'' යන යෙදුමෙන් 1995 නොවැම්බර් මාසයට පෙර නොවූ සහ 1997 අප්‍රේල් මාසයට පසු ව නොවූ යම් ලිත් මාසයක පළමු වන දිනය වූ ද එම ව්‍යවසාය විසින් තෝරා ගනු ලැබ එම මාසයේ අන්තිම දින සිට දින තිහක් ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබුවා වූ ද දිනය අදහස් වේ :

එසේ වුව ද අදාළ දිනය එසේ කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී නැති අවස්ථාවක, අදාළ දිනය 1996 අප්‍රේල් මස 1 වන දිනය ලෙස සැලකිය යුතු ය;

(ආ) ''නව ප්‍රාග්ධන වියදම'' යන යෙදුමෙන් ව්‍යවසාය විසින් දියුණු තාක්ෂණය අත්කර ගැනීම හා භාවිත කිරීම සඳහා යම් අලුත්-

(i) පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ සහ

(ii) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර)
(i) වන අනුඡේදයේ ඇතුළත් නොවූ වත්කමක්

මිලදී ගැනීමෙහි ලා ව්‍යවසාය විසින් දරන ලද වියදම් අදහස් වේ:

එසේ වුවද ද අදාළ දිනයේ හෝ ඊට පෙර එම ව්‍යවසායේ වත්කම්වල කොටසක් වූ යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ අදාළ දිනයෙන් පසු ප්‍රතියෝජනය කිරීම සඳහා දරන ලද යම් වියදමක් නව ප්‍රාග්ධන වියදම් වශයෙන් නොසැලකිය යුතුය.''

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇඇ වගන්තියේ ''ගණන් බලන ලද අවුරුදු පහක කාලයක් සඳහා'' යන වචන වෙනුවට ''ගණන් බලන ලද අවුරුදු හතක කාලයක් සඳහා'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (5) වන උපවගන්තියේ අතුරු විධානයේ ''අදාළ නොවිය යුතු ය'' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''අදාළ නොවිය යුතු ය :

එසේ ම තව දුරටත් (අ) ඡේදයේ (1) අනුඡේදයේ විධිවිධානවල කිසිවක් ප්‍රාග්ධන වත්කම් කුලියට දීමේ ව්‍යාපාරයෙහි නිරත වූ සමාගමක් විසින් 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු කුලියට දෙන ලද යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.''

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය (2) වන උප වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"මේ ඡේදයේ කාර්ය සඳහා, 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පොලිය" යන යෙදුමෙන්

පහත දැක්වෙන යම් කාර්යයක් සඳහා ලබාගත් ණයක් වෙනුවෙන් ගෙවන යම් පොලියක් අදහස් වේ :-

(i) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ මිළ දී ගැනීම හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යම් බිම් කොටසක් මිළ දී ගැනීම ;

(ii) යම් නිල ලැයිස්තු ගත පොදු සමාගමක යම් කොටසක් මිළ දී ගැනීම;

(iii) යම් වෙළෙඳමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රකෂාවක භාවිතය සඳහා යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීම්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (අඅඅඅඅ) ඡේදයේ "හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හැටදහසක දීමනාවක්, සහ" යන වචන වෙනුවට "හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් හැටදහසක දීමනාවක්", යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (අඅඅඅඅ) ඡේදයට ඉක්බිතිව මු පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(අඅඅඅඅඅ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂයක දීමනාවක්; සහ";

(ඇ) එම වගන්තියේ අතුරු විධානයේ-

"(අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅ) ඡේදයෙහි හෝ යන වචන වෙනුවට "(අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅ) ඡේදයෙහි හෝ" යන වචන ආදේශ කිරීමෙන්

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උප වගන්තියේ පළමුවන අතුරු විධානයේ -

(i) (උ) ඡේදයෙහි "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ii) එම අතුරු විධානයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

(ඌ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂයක දීමනාවක්."

(ආ) එම උප වගන්තියේ දෙවන අතුරු විධානයෙහි -

(i) එම අතුරු විධානයේ (ii) වන අනුඡේදයේ -
"1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතලිස් දෙදහසකට ; සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට" 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතලිස් දෙදහසකට ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ අතුරු විධානයේ (iii) වන අනුඡේදයෙහි "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් හැටදහසකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1955 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් හැට දහසකට ; සහ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) ඒ අතුරු විධානයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

(iv) ඒ තක්සේරු වර්ෂය 1996 අප්‍රේල් මස 1 වන දිනය හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් එක් ලක්ෂයකට".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(i) ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) ඒ වගන්තියේ (5ඇ) උපවගන්තියේ -

" 1990 අප්‍රේල් මස1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් " යන වචන හා ඉලක්කම් වෙනුවට "1990 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) (5ඇ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් -

"(5ඉ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(අ) සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම -

(i) (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) සහ (ට) ඡේදවල සඳහන් ගෙවීම් හැර ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් විසිපන්දහසක් යන දෙකින් කවර වූ හෝ අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යැයි සැළකෙන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් විසිපන්දහසක් නොඉක්මවිය යුතු ය.

(iii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැලකෙන (2) වන උපවගන්තියේ (ට) ඡේදයෙහි සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතු ය.

(iv) මේ උපවගන්තියේ (1) වන සහ (11) වන ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල සමස්තය සම්බන්ධයෙන්, රුපියල් විසි පන්දහසක් නොඉක්මවිය විය යුතු ය :-

(ආ) සමාගමක තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමේ (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් හැර, එම තක්සේරු වර්ෂයේ දී එම සමාගම විසින් කරන ලද හෝ එම සමාගම විසින් කරනු ලැබූ වේ යයි සැලකෙන සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් එම තක්සේරු කළ හැකි ආදායමෙන් පහෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය :-

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (8) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(ix) 1996 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11උ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;":

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ -

(අ) එම අතුරු විධානයේ (1) වන අනුඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් හතලිස් දෙදහසක්; සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට ;

"1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මය 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතලිස් දෙදහසක්;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්

(ආ) එම අතුරු විධානයේ (6) වන අනුඡේදයේ "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක්" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක් ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) එම අතුරු විධානයේ (6) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(vii) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂයක්;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ මුදලෙහි රුපියල් පහළොස් ලක්ෂය ඉක්මවන්නා වූ යම් කොටසක් හැර යම් මුදලක්; හෝ" යන වචන වෙනුවට, "ඒ මුදලෙහි රුපියල් පහළොස් ලක්ෂයක; හෝ

ඒ පුද්ගලයාට ඒ පාරිතෝෂිකය ගෙවන සේවායෝජකයා යටතේ යම් සේවා නියුක්තියකින් විශ්‍රාම ලැබීමට පෙරාතුවම වූ අවුරුදු තුන තුළ දී ගෙවන ලද සාමාන්‍ය මාසික වැටුප හෝ වේතනය සේවා කාලයේ සම්පූර්ණ කළ අවුරුදු ගණනින් වැඩි කළ විට ලැබෙන ගණනට සමාන මුදලක් යන මේ කවර හෝ වැඩි මුදල ;

ඉක්මවන්නා වූ කොටස හැර යම් මුදලක්;හෝ

(ආ) "1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඒ වගන්තියේ (8) ජේදයේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11 ර් කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ම ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11 ර් කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව, හෝ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (8) වන ජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ජේදය එකතු කිරීමෙන් :-

"(ix) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11උ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව".

12. පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:-

"ශ්‍රී ලංකාවේ සේවයේ යෙදී සිටින පුරවැසියකු නොවන තැනැත්තකුගේ සේවානියුක්තියෙන් ලැබෙන ලාභ මත, යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා, ආදායම් බදු අනුප්‍රමාණය

32 ඇඇ (1) 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අවුරුදු තුනක කාලයක් නිර්වාසික වශයෙන් සලකනු ලබන පුද්ගලයකු එම කාලය ඉකුත් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ දිගටම සේවයේ නියුක්තව සිටින අවස්ථාවක, ඒ අවුරුදු තුනක කාල පරිච්ඡේදයේ අවසානයෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා එම පුද්ගලයාගේ එම සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනු ප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය; .

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති 11 වන වගන්තියේ (අ) ජේදයේ අර්ථානුකූලව ජලාග්ශිප් සමාගමක් වන සමාගමක සේවයේ යෙදී සිටින්නා වූ ද, 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ අවුරුදු පහක කාලයක් නිර්වාසිකයකු වශයෙන් සලකනු ලබන්නා වූ ද පුද්ගලයකු, එම කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසුව එම ජලාග්ශිප් සමාගමේ දිගටම සේවයේ නියුක්තව සිටින අවස්ථාවක, එකී අවුරුදු පහක කාලපරිච්ඡේදයේ අවසානයෙන් ආරම්භව එම ගිවිසුමේ නියමයන් යටතේ එම ජලාග්ශිප් සමාගමේ ලාභ සහ ආදායම් නිදහස් කිරීම අවසාන වන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය සඳහා ඒ පුද්ගලයාගේ එම ජලාග්ශිප් සමාගමේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ සහ ආදායම, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඉඉ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ඇ) ජේදයේ "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය වන අවස්ථාවක" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :

උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඈ) ඒ තක්සේරු වර්ෂය 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ ප්‍රමාණය -

(i) රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහස නොඉක්මවන අවස්ථාවක-

රුපියල් හාරදහස් අටසිය පණහක් හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක් ;

(ii) රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහස ඉක්මවන නමුත් රුපියල් එක් ලක්ෂ පණස් දහස නො ඉක්මවන අවස්ථාවක

රුපියල් තුන්දහස් දෙසිය හතළිස් අටෙන්, ඒ පුද්ගලයාගේ ඒ තක්සේරු වර්ෂය සඳහා අදාළ සේවා නියුක්ති ලාභ එක්ලක්ෂ හතලිස් හතර දහස ඉක්මවන ප්‍රමාණයෙන් සියයට පණස් හතරක් අඩු කල විට ලැබෙන මුදල : හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල

යන දෙකෙන් කවර හෝ අඩු මුදලට සමාන මුදලක්

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඕ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (3) වන ඡේදයේ "ඒ සමාගම විසින් පළමුව කී ලාභාංශ ලබාගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්දා වූ ලාභාංශයක්" යන වචන වෙනුවට, "පළමුව සඳහන් ලාභාංශය දෙවනුව සඳහන් ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් ඇතුළත හෝ ඊළඟ වර්ෂය ඇතුළත ගෙවනු ලැබුවේ නම් එම ලාභාංශය". යන වචන ආදේශ කිරීමෙන් ,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (1) ඡේදයේ (අ) අනුඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) 32ඌ හෝ 32ජ වගන්තිවල සඳහන් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමෙන් : හෝ

32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ සඳහන් ලාභ සහ ආදායමෙන්

"සියයට පහළොවක අනුප්‍රමාණය අනුව බදු අයකළ හැකිවන්නේ යම් කාලසීමාවක් තුළ ද ඒ කාලය තුළ දී හෝ ඉනික්බිතිව එක් වර්ෂයක් ඇතුළත ගෙවනු ලබන ලාභාංශයක්;".

(ආ) ඒ උපවගන්තියේ (3) වන ඡේදයේ "ඒ සමාගම් විසින් පළමු කී ලාභාංශය ලබාගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්දා වූ ලාභාංශයක්" යන වචන වෙනුවට, "පළමුව සඳහන් ලාභාංශය දෙවනුව සඳහන් ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් ඇතුළත හෝ ඊළඟ වර්ෂය ඇතුළත ගෙවනු ලැබුවේ නම් එම ලාභාංශය"; යන වචන ආදේශ කිරීමෙන්.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ "32ඊ වගන්තිය යටතේ හෝ 32ඌ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් යෙදෙන සෑම තැනකම "32ඊ වගන්තිය යටතේ හෝ 32ඌ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ හෝ 32ක වගන්තිය යටතේ හෝ 32 ග වගන්තිය යටතේ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උප වගන්තියේ "32ඌ වගන්තිය හෝ 32ඔ වගන්තිය" යන වචන හා ඉලක්කම් යෙදෙන සෑම තැනකම "32ඔ වගන්තිය 32ක වගන්තිය 32ග වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඇ වගන්තියේ (2) වන ඡේදය එම ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(ආ) (i) 32 ඊ වගන්තිය යටතේ ;
(ii) 32 ඌ වගන්තිය යටතේ ;
(iii) 32 ඔ වගන්තිය යටතේ ;
(iv) 32ක වගන්තිය යටතේ ;
(v) 32ග වගන්තිය යටතේ ;
(vi) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් නොවන අනුප්‍රමාණයන් අනුව බදු අය කළ හැකි ලාභ සහ ආදායම්; සහ".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2අ) උප වගන්තියේ (111) වන ඡේදයේ "32ඌ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ වූ බද්ද සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "32ඌ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ හෝ 32ක වගන්තිය යටතේ හෝ 32ග වගන්තිය යටතේ වූ බද්ද සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උප වගන්තියේ (4) වන ඡේදයේ "ආරම්භක වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක්. යන වචන වෙනුවට. "ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක්" සහ යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උප වගන්තියේ (6) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(vii) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂයක්"

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අඅ) උප වගන්තියේ "තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඇතුළත තක්සේරු කරුවකු විසින් "යන වචන වෙනුවට "තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඉකුත් වීමට පෙර තක්සේරුකරුවකු විසින්"යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) (අ) මාසයකට රුපියල් අට දහස් තුන්සිය තිස් තුනකට හෝ වර්ෂයකට රුපියල් එක් ලක්ෂයකට වැඩි පාරිශ්‍රමිකයන් ලබන යම් පුද්ගලයකු; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූ පහකට හෝ වර්ෂයකට රුපියල් එක් දහසකට වැඩි පාරිශ්‍රමිකයන් ලබන නිර්වාසික පුද්ගලයකු,

සේවයෙහි නියුක්ත කරන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107ඇ වගන්තිය යටතේ හෝ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දීමක් කර නොමැත්තා වූ ද සෑම සේවායෝජකයකු විසින්ම, (මේ පරිච්ඡේදයේ මින් මතු "නියමිත සේවා නියුක්තයා"යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගලයකු තම සේවයෙහි සිටින බව, 1996 සැප්තැම්බර් මස 30 වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීම කළ යුතු ය.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදයේ (1) අනුඡේදයෙහි වූ "එකතුව රුපියල් තිස් දහසකට නො අඩු නිශ්චිත ගාස්තුවක් ;" යන වචන වෙනුවට "රුපියල් තිස්දහසකට නො අඩු නිශ්චිත ගාස්තුවක් හෝ එකතුව රුපියල් තිස්දහසකට නොඅඩු වන නිශ්චිත ගාස්තු ;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ -"1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්" යන වචනය ආදේශ කිරීමෙන් : සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඈ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ සේවානියුක්තයාගේ එකී පඩිනඩිවලින් රුපියල් එක් ලක්ෂයක් අඩු කිරීමෙන් පසු මේ පනතේ පළමුවන උප ලේඛනයේ 11ළ කොටසේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ අනුව ඒ මත ගණන් බලන ලද ආදායම් බද්ද විය යුතු ය".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපලේඛනයේ 11ඊ කොටසේ "1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1994 අප්‍රේල් මස 1 වන දින සහ 1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ දෙක සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ 11ඊ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

II උ කොටස

1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය.

බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 35,000 මත	සියයට 10
බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 35,000 මත	සියයට 15
බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 35,000 මත	සියයට 25
බදු අයකළ හැකි ආදායම් ශේෂය මත	සියයට 35

24. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනයේ "32ඔ වගන්තියේ හෝ 33ක වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ඇති සෑම තැනකම ඒ වෙනුවට "32 ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. (1) මේ පනතේ 4 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කර ඇති සංශෝධනය 1990 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(2) මේ පනතේ 7 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කර ඇති සංශෝධනය 1995 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) මේ පනතේ 13 වන, 14 වන, 15 වන, 16 වන සහ 23 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඕ, 33අ, 33ඇ, 38 වන වගන්තිවලට සහ හත්වන උපලේඛනයට කර ඇති සංශෝධන 1994 ඔක්තෝබර් මස 31 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(4) මේ පනතේ 20 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තියට කර ඇති සංශෝධනය 1992 නොවැම්බර් මස 18 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 1996 ජුලි මස 26 වන දින]

ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.

1. මේ පනත 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

I කොටස

සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන් ගෙන් සමන්විත වන්නා වූ ද, සමාජ ආරක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

   (2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද මණ්ඩලය විසින් ද මණ්ඩලයට විරුද්ධව ද එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

3. (1) මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් එක් අධ්‍යක්ෂවරයෙක් භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් විය යුතු ය.

   (2) අධ්‍යක්ෂවරුන් අතුරෙන් එක් අධ්‍යක්ෂවරයෙක් මණ්ඩලයේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

   (3) අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාල සහ අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ මණ්ඩලයේ මුද්‍රාවට අදාළව, මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

4. පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ කර්තව්‍ය වනුයේ, ධීවර හා කෘෂිකර්ම නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුපක් සහ (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම විය යුතු ය.

5. ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට -

   (අ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ, උකස් කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ ;

   (ආ) එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට කෙලින්ම හෝ යම් නිලධරයකු හෝ ඒ වෙනුවෙන් බලය දෙන ලද අනුයෝජිතයකු මගින් ඇතුළත් වීමේ සහ ඒවා ඉටු කිරීමේ ;

   (ඇ) එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, පාරිශ්‍රමික, විනය පාලනය සහ ඔවුනට නිවාඩුදීම ද ඇතුළුව ඔවුනට අදාළ රීති සෑදීමේ ;

   (ඈ) යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ;

   (ඉ) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ නියමිත ජීවන ගණක, මූල්‍ය සහ මෙහෙයුම් වාර්තා පවත්වාගෙන යාමේ ;

   (ඊ) යෝජනා ක්‍රමය යටතේ යම් දායකයකුට ගෙවිය යුතු ප්‍රතිලාභ නිශ්චය කිරීමේ ;

   (උ) එහි කර්තව්‍ය නියමාකාරයෙන් ඉටුකිරීම සඳහා හෝ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍යවන වෙනත් සියලු දේවල් කිරීමේ

බලය තිබිය යුතු ය.

6. යෝජනා ක්‍රමය පරිපාලනමය කිරීමේ හැකියාව සහ ස්වයං රැකියාවල යෙදෙන තැනැත්තන් විසින් කරගෙන යනු ලබන වෘත්තීන් වලට සම්බන්ධ වෘත්තීය අනතුරු සැලකිල්ලට ගනිමින්, යෝජනා ක්‍රමයට දායකවීමේ හිමිකම ඇති ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් පිළිබඳ වර්ග නිශ්චය කිරීම, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ කරන ලද නියමයක සඳහන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ වර්ගයට ඇතුළත් වන යම් ස්වයං රැකියා තැනැත්තකු මෙහි මින් මතු "මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු" වශයෙන් හඳුන්වනු ලැබේ.

II වන කොටස

ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

7. නියමිත සුදුසුකම් ඇත්තා වූ ද, වයස අවුරුදු දහඅටට නො අඩු වයස අවුරුදු පනස් නවයට නොවැඩි වන්නා වූ ද සහ මේ පනත අදාළ වන්නා වූ ද යම් තැනැත්තකු යෝජනා ක්‍රමයට බැඳීම සඳහා සුදුස්සකු වන්නේ ය.

8. (1) (මෙහි මින් මතු "දායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූද මේ පනත අදාළ වන්නා වූදයම් තැනැත්තකු, නියම කරනු ලැබිය හැකි යම් පදනමක් මත යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභවලට හිමිකම් තිබිය යුතු ය:-

(අ) නියමිත මුදලක් වූ නියත කාලීන විශ්‍රාම වැටුපක් ;

(ආ) ස්ථිර වශයෙන්ම අර්ධ ආබාධිත තත්ත්වයකදී පාරිතෝෂික වශයෙන් ගොනු මුදලක් හෝ ආබාධිත තත්වයට පත්වීමෙන් පසු ඔහු දායක මුදල් ගෙවීම නොකඩවා කරතොත් ගෙවිය යුතු අවස්ථාව වන විටෙක පාරිතෝෂිකයක් වශයෙන් ගොනු මුදලක් සහ විශ්‍රාම වැටුපක් ;

(ඇ) ස්ථිර වශයෙන් ම පූර්ණ ආබාධිත තත්ත්වයක දී, පාරිතෝෂික වශයෙන් ගොනු මුදලක් හෝ නියමිත මුදලක් වූ නියත කාලීන දීමනාවක් ;

(ඈ) මරණ පාරිතෝෂිකයක්.

(2) විශ්‍රාම වැටුප්, දීමනාවක් හෝ පාරිතෝෂිකයක් ගෙවීමේ පදනම වෙනත් දේ අතර, දායකයාගේ දායක කාල පරිච්ඡේදය වයස සහ දායකයා විසින් දෙන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙන් නියම කරනු ලැබිය යුතු ය.

9 (1) වයස අවුරුදු හැටට එළඹීමේ දී දායකයකු විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය. කෙසේ වුවද, වයස අවුරුදු පනස් පහට එළඹීමෙන් පසුව දායකවීම ආරම්භ කරන දායකයකු නියම කරනු ලැබිය හැකි ඔහුගේ මුළු දායක මුදල ගෙවීමෙන් පසුව සහ යෝජනා ක්‍රමයට බැඳීමේ දින සිට අවුරුදු පහක් අවසානයේ දී පමණක් විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය.

(2) දායකයකු මියයන මාසයේ අවසානය දක්වා පමණක් විශ්‍රාම වැටුප් ගෙවනු ලැබිය යුතු ය.

10. මේ පනත අදාළ වන තැනැත්තන් යෝජනා ක්‍රමයට බැඳීම ධෛර්යමත් කිරීමේ අදහසින්, දායකයන් විසින් ගෙවනු ලබන දායක මුදල් මත ප්‍රතිදානයක් හෝ වට්ටමක් දිය යුතු යයි අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

11. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර ස්ථිර වශයෙන් සහ අර්ධ වශයෙන් අබලතාවකට පත්වන යම් දායකයකුට නියමිත පදනම මත ගණන් බැලූ එකවර ලැබෙන පාරිතෝෂිකයක් ලැබිය යුතු අතර, යෝජනා ක්‍රමයෙන් ඉවත්වීම හෝ ඉතුරු දායක මුදල් ගෙවමින් යෝජනා ක්‍රමයේ රැඳී සිට විශ්‍රාම වැටුප ගෙවිය යුතු වන අවස්ථාවේ දී එය ලබා ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

12. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර, ස්ථිර වශයෙන් සහ සම්පූර්ණයෙන් ම අබලතාවයකට පත් වන යම් දායකයකු, ස්වකීය මනාපය පරිදි නියමිත පදනම මත ගණන් බැලූ එකවර ලැබෙන පාරිතෝෂිකයක් ලැබිය යුතු අතර, යෝජනා ක්‍රමයෙන් අස්වීම හෝ නියමිත පදනම මත ගණන් බැලූ කාලීන දීමනාවක් ලබාගෙන තවදුරටත් දායක මුදල් නොගෙවා යෝජනා ක්‍රමයේ රැඳී සිටීම හෝ කළ යුතු ය.

13. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර, දායකයකුගේ මරණය සිදුවූ විටක නියම කරනු ලැබිය හැකි යම් පදනමක් මත ගණන් බැලූ මරණ පාරිතෝෂිකයක් ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට සහ නීත්‍යානුකූල දරුවන්ට හෝ ඔහුගේ ලේ ඥාතීන්ට, මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් පරිදි යම් අනුපාතිකවලට අනුව සහ ප්‍රමුඛතා අනු පිළිවෙලට ගෙවනු ලැබිය යුතු ය.

14. මණ්ඩලය විසින් යම් තැනැත්තකු බඳවා ගැනීමේ දී යෝජනා ක්‍රමයට දායකයකු වශයෙන් ඔහු විසින් දිය යුතු දායක මුදල් දැක්වෙන ඔප්පුවක් මණ්ඩලය විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඔප්පුවේ නියම සහ කොන්දේසි ද ඔහු වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ ඔහු හිමිකම් ලබන ප්‍රතිලාභ ද එහි දැක්විය යුතු ය.

15. (1) දායකයකු විසින් දායක මුදල් ගෙවිය යුත්තේ කවර දිනයකට ප්‍රථමයෙන් ද යන වග ඔප්පුවේ නිශ්චිතව සඳහන් කළ යුතු අතර, අනුක්‍රමික වාරික දහයක් ගෙවීම පැහැර හරින යම් දායකයකුට, ඔහු වෙත නිකුත් කර ඇති ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි විය යුතු ය.

(2) තමා වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ වූ ප්‍රතිලාභ යම් දායකයකුට අහිමි වී ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් එම දායකයා වෙත ඒ බවට දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(3) තමාගේ ඔප්පුව නැවත වලංගු කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනය කිරීමට දායකයකුට අයිතිවාසිකම් ඇති අතර, වාරික ගෙවීමට අපොහොසත්වීම, දායකයාගේ පාලනය ඉක්මවා ගිය හේතු නිසා සිදු වී ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, මණ්ඩලය විසින් එම ඔප්පුව වලංගු කළ යුතු ය.

(4) ඔප්පුවක් වලංගු කිරීමට මණ්ඩලය තීරණය කරන අවස්ථාවක, හිඟ වාරික ගෙවිය යුත්තේ කවර දිනයකට පූර්වයෙන් ද යන වග දායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය. එම ගෙවීම කරන දිනය ඔප්පුව වලංගු කරන දිනය විය යුතු ය.

(5) මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් දායකයකුට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති අතර ඒ පිළිබඳව ඔහුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

16. මෙම යෝජනා ක්‍රමය යටතේ යම් දායකයකු වෙත ප්‍රතිලාභ ප්‍රදානය කිරීම, මණ්ඩලය විසින් යෝජනා ක්‍රමයට අනුකූලව සහ එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සාදන ලද නියෝග වලට අනුකූලව නිශ්චය කළ යුතු ය.

17. යම් දායකයකු විසින්, යෝජනා ක්‍රමයට දායකයකු ලෙස බඳවා ගනු ලැබීමට හෝ දායකයකු ලෙස සිටීමට ඔහුට ඇති යුදුසුකම සම්බන්ධයෙන් සපයා තිබෙන තොරතුරුවල සත්‍යතාව තහවුරු කර ගැනීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දී තිබෙන මණ්ඩලයේ යම් නිලධරයකු විසින් සේවා නියුක්තිය පවත්නා පරිශ්‍රයට හෝ ස්ථානයට දවසේ කවර හෝ වේලාවක ඇතුළු වී එම ස්ථානය පරීක්ෂා කළ හැකි ය.

18. (1) මණ්ඩලය විසින් නිශ්චය කළ යම් ප්‍රතිලාභ ප්‍රදානයක් පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයකු විසින්, එම ප්‍රදානය පිළිබඳව දැන්වීම ලැබී දවස් තිහක් ඇතුළත, අභියාචනයට හේතු දක්වමින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය.

(2) එවැනි යම් අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

19. යෝජනා ක්‍රමයෙන් ගෙවිය යුතු කිසි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක් පැවරීම හෝ මාරු කිරීම නොකළ යුතු අතර, එවැනි සෑම පැවරීමක් ම හෝ මාරු කිරීමක් ම මුළුමනින් ම ශුන්‍ය හා බලරහිත හා බලපෑමෙන් තොර විය යුතු ය. එවැනි කිසි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක් ඒ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හේතුවෙන්, තහනමට ගැනීම හෝ ඇස්කිසියක් මගින් අයකර ගැනීම හෝ නොකළ යුතුය.

III වන කොටස

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

20. (1) සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සහ යෝජනා ක්‍රම පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කිරීමටත්, එසේ පත් කරන කවර හෝ නිලධරයකු අනුයෝජිතයකු හෝ සේවකයකු විෂයෙහි විනය පාලනය පැවැත්වීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීමටත් මණ්ඩලයට බලය ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ගෙවීම් ප්‍රමාණයන් අනුව, එසේ නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට යටත්ව, පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, කවර හෝ රජයේ නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය

කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා තාවකාලිකව පත් කළ හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කළ හැකි ය.

(5) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(7) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලය යටතේ සේවය කරන යම් කාලසීමාවක්, එම එකඟවීම යටතේ වූ බැඳීම් ඉටුකිරීම සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු ය.

IV වන කොටස
මුදල්

21. (1) මණ්ඩලයට මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් විය යුතු ය.

(2) මෙහි පහත සඳහන් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :-

(අ) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) යෝජනා ක්‍රමයට දායක මුදල් වශයෙන් දායකයන් විසින් ගෙවනු ලබන සියලු මුදල් ;

(ඇ) අරමුදලට ත්‍යාග සහ පරිත්‍යාග වශයෙන් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු මුදල් ;

(ඈ) මණ්ඩලයේ ආයෝජනවලින් පොලී හෝ ලාභ වශයෙන් උපයන සියලු මුදල් ;

(ඉ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සහ අරමුදලින් ගෙවනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

22. මණ්ඩලයට වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදලෙහි ඇති සියලු මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, බලය දෙනු ලබන, යම් ආකාරයකින් හා එසේ බලය දෙනු ලබන යම් සුරැකුම්පත්වල මණ්ඩලය විසින් ආයෝජනය කළ හැකි ය.

23. (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ ඒ සමාන එකඟත්වයක් ඇතිව දෙන ලද යම් පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව මණ්ඩලයේ බැඳීම ඉටුකිරීම සඳහා සහ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල්, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ණයට ගැනීම හෝ කොන්දේසි සාකච්ඡා කොට ණය වශයෙන් ලබාගැනීම කළ හැකි ය.

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද යම් ණය මුදල් සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති මුදල්වල එකතුව, කිසිම අවස්ථාවකදී, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ නොඉක්මවිය යුතුය.

(2) මණ්ඩලය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව පහත දැක්වෙන සියලු කාර්ය හෝ ඉන් යම් කාර්යයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ණය මුදල් වශයෙන් හැර අන්‍යාකාරයෙන් මුදල් ණයට ලබා ගත හැකි ය.

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපළවල භුක්තිය බලකර ලබාගැනීම හෝ අත්කර ගැනීම ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගන්නා ලද යම් මුදල් ආපසු ගෙවීම.

24. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

25. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා අරමුදල ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලක් විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

26. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන මණ්ඩලයට අදාළ විය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

V වන කොටස
සාමාන්‍ය

27. මණ්ඩලයේ සියලු අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

28. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධි විධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතුය.

29. (1) මණ්ඩලයේ බලතල සහ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ නිලධරයකුට නැතහොත් සේවකයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරන ලද සෑම තැනැත්තකු විසින් ඒ බලය හෝ කාර්යය මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

30. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද වියදම් කිසිවක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම් ඒ නඩු කටයුත්තේ දී ඔහු විසින් අයකර ගනු ලබතොත් හැර, අරමුදලින් ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබිය යුතු ය.

31. අමාත්‍යවරයා විසින් -

(අ) යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) මේ පනත අදාළ වන තැනැත්තකුට යෝජනා ක්‍රමයට බැඳීම පිණිස හිමිකම් ඇති කරවන සුදුසුකම් :

(ඇ) මේ පනත අදාළ වන තැනැත්තකුට යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලැබෙන කොන්දේසි සහ යටත් විය යුතු සීමාකිරීම් ;

(ඈ) දායකවන්නන් විසින් ගෙවිය යුතු දායක මුදලේ ප්‍රමාණය නිශ්චය කිරීම :

(ඉ) යෝජනා ක්‍රමය යටතේ දායකවන්නන් හට විශ්‍රාම වැටුප්, පාරිතෝෂිත හෝ දීමනා ගෙවිය යුතු පදනම නිශ්චය කිරීම :

(ඊ) දායකවන්නන් විසින් දායක මුදල් ගෙවීම පැහැර හැරීම, ඔප්පුව පවාරණය කිරීම සහ දායකයකුගේ යෝග්‍යත්වය නැතිවීම පාලනය කෙරෙන කොන්දේසි :

(උ) මණ්ඩලය විසින් වැඩ කටයුතු කිරීමේ කාර්ය පටිපාටිය :

(ඌ) මේ පනත යටතේ නිකුත් කරන ලද ඔප්පුවක් අවලංගු කිරීම හෝ අහිමි කිරීම : සහ

(එ) දායකවන්නකුගේ අර්ධ හෝ පූර්ණ අබලතාව තීරණය කිරීමේ පදනම

ඇතුළුව මේ පනතින් නියෝග සෑදීමට බලය දී ඇති හෝ නියම කරනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

32. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"සභාපතිවරයා" යන්නෙන් 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා අදහස් වේ :

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයකු අදහස් වේ :

"පළාත් පාලන ආයතනයක්" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ද රට ඇතුළත් වේ :

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියමිත බව අදහස් වේ :

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

පළමුවන උපලේඛනය (3 (4) වගන්තිය)

මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට අදාළ විධිවිධාන

යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු වේ නම් : හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම් : හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු නම් : හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් (අත්හිට වූ දණ්ඩන නියමයක් ඇතුළුව) බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් පනවනු ලැබූ තැනැත්තකු වේ නම් : හෝ

(ඉ) අධ්‍යක්ෂවරයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවයක් වේ නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ පත් කළ අධ්‍යක්ෂවරයකු වශයෙන් දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් අධ්‍යක්ෂවරයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

3. අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කළ හැකි අතර ඊට ආඥාවක් මගින් හෝ වෙනත් ආකාරයකින් එය යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

4. (1) සෑම අධ්‍යක්ෂවරයකු ම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබ සිටින්නේ නම් මිස, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුසුසෙක් විය යුතු ය.

එසේ වුව ද මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කර ඇති අධ්‍යක්ෂවරයකු වෙනුවට පත්කරනු ලබන තැනැත්තකු ඔහු කලින් ධුරය හිස් කළහොත් මිස ඔහු අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතුයි.

(2) සභාපතිවරයාට හෝ වෙනත් යම් අධ්‍යක්ෂවරයකුට අසනීප වීම, අබලතාවට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් යම් අධ්‍යක්ෂවරයකු හෝ එම අධ්‍යක්ෂවරයා වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකු හෝ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

5. සභාපතිවරයාට සහ අධ්‍යක්ෂවරුන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරුනු ලබන පාරශ්‍රමිකයන් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

6. මණ්ඩලය විසින් එළඹෙන හෝ එළඹීමට යෝජිත ගිවිසුමකට කෙළින්ම හෝ අනියමින් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී අනාවරණය කිරීම කළ යුතු ය. මේ අනාවරණය කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල වාර්තා කළ යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා එම ගිවිසුම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය. එසේ වුව ද යම් අධ්‍යක්ෂවරයකු රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වීමේ හේතුවෙන් ගිවිසුමකට ඒ අධ්‍යක්ෂවරයාට ඇති සම්බන්ධතාව මේ ඡේද යටතේ අර්ථානුකූලව සම්බන්ධතාවය වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

7. (1) තත්කාර්යය සඳහා අමාත්‍යවරයාට යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපතිවරයා විසින් සභාපති වශයෙන් වූ ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ වේලාවක හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වයේ කාලය විය යුතු ය.

8. (1) මේ ඡේදයේ අනෙකුත් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් එහි රැස්වීම පිළිබඳව සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳව කාර්ය පටිපාටිය විධිමත් කරගත හැකිය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය අධ්‍යක්ෂවරුන් හතර දෙනකු විය යුතු ය.

9. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එකී යම් අධ්‍යක්ෂවරයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

10. (1) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතුය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) තමන් පැමිණි සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් කළ යුතු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඉදිරියේ හැර, මණ්ඩලයේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳව ලේඛනයන් මණ්ඩලය විසින් පවත්වා ගත යුතු ය.

දෙවන උපලේඛනය

(13 වන වගන්තිය)

මරණ පාරිතෝෂිකය ගෙවිය යුතු අනුපාත සහ ප්‍රමුඛත්ව අනු පිළිවෙල පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) මරණ පාරිතෝෂිකයෙන් අඩක් හෝ සියයට පණහක් ජීවත්ව සිටින කාලත්‍රයාට සහ

(ආ) ඉතිරි සියයට පනහ මියගිය දයකයාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමසේ කොටස් කරනු ලැබිය යුතු ය.

(ඇ) කාලත්‍රයා ජීවත්ව නොසිටී නම් මරණ පාරිතෝෂිකය සම්පූර්ණයෙන්ම මියගිය දයකයාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමසේ බෙදා දෙනු ලැබිය යුතු ය ;

(ඈ) ජීවත්ව සිටිනු සුජාත දරුවන් නොමැති නම් සම්පූර්ණ මරණ පාරිතෝෂිකයම ජීවත්ව සිටින සිටින කලත්‍රයාට ගෙවිය යුතු ය.

(ඉ) මියගිය දයකයාගේ ජීවත්ව සිටින කලත්‍රයකු හෝ ජීවත්ව සිටින සුජාත දරුවන් නොමැති නම් මරණ පාරිතෝෂිකය පහත දැක්වෙන පරිදි ගෙවනු ලැබිය යුතුය :-

(i) මව්පිය දෙදෙනාගෙන් එක්කෙනෙකුට වඩා ජීවත්ව සිටී නම් එය ජීවත්ව සිටින මව්පියන්ට සමසේ ගෙවිය යුතුය ;

(ii) දෙමව්පියන්ගෙන් එක් තැනැත්තකු පමණක් ජීවත්ව සිටී නම් එය සම්පූර්ණයෙන්ම එම තැනැත්තාට ගෙවිය යුතුය ;

(iii) ජීවත්ව සිටින එක් සහෝදරයකුට සහ සහෝදරියකට වඩා සිටී නම්, එය ජීවත්ව සිටින සහෝදරයන්ට සහ සහෝදරියන්ට සමසේ ගෙවිය යුතු ය ;

(iv) ජීවත්ව සිටින එක් සහෝදරයකු හෝ සහෝදරියක පමණක් සිටී නම් එය සම්පූර්ණයෙන්ම ඒ සහෝදරයාට හෝ සහෝදරියට ගෙවිය යුතුය.

XXX

1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසායය පුනරුත්ථාපනය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 12 වන දින]

පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායය පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ඇතැම් රාජ්‍ය සංස්ථා සහ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පොදු සමාගම් බවට පරිවර්තනය කරන ලද හෙයින් සහ ඒ සමාගම් වල සියළු කොටස්, රජය සඳහා හා වෙනුවෙන් දැරීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම්වරයාට වෙන් කරන ලද හෙයින්ද :

තවද, පුද්ගලිකරණ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමේහි ලා එවැනි සමාගම් සමහරක ආණ්ඩුව විසින් දරණ කොටස් සියල්ලම හෝ වැඩි කොටස් ප්‍රමාණයක් වෙනත් තැනැත්තන්ට පවරනු ලැබූ හෙයින් හෝ එවැනි සමාගම් සමහරක කළමනාකරණය හා පරිපාලන විෂයයෙහි හෝ එවැනි සමාගම්වලට අයිති දේපළ විෂයයෙහි ආණ්ඩුවේ පාලනයක් තිබීම අවසන් වී ඇති හෙයින්ද :

තවද එවැනි සමාගම් සමහරක ව්‍යාපාර ආයතන අසාර්ථක වී ඇති හෙයින් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි සමාගම් වල කම්කරුවන් සේවයෙහි නියුක්ත නොකිරීම, කම්කරුවන් අඩු කිරීම, ඔවුන්ගේ වේතන සහ ව්‍යයස්ථාපිතව අයවිය යුතු මුදල් නොගෙවීම සිදු වී ඇති හෙයින්ද :

ජාතික ආර්ථිකයේ යහපත සඳහා ද, ඒ සමාගම්වල කම්කරුවන් ගේ අයිතිවාසිකම් පිළිගැනීම් සහ ඒවාට ගරු කිරීම සුරක්ෂිත කිරීමේ හා ප්‍රජාතන්ත්‍ර වාදී සමාජයක පොදු ශුභ සිද්ධියේ සාධාරණ අවශ්‍යතාවන් සපුරාලීම පිණිස ඒ සමාගම්වල නිෂ්පාදනය නංවාලීමේ කාර්යය සඳහා ද, ඒ සමාගම් පුනරුත්ථාපනය කිරීම පිණිස උචිත පියවර ගැනීම අවශ්‍ය හා යෝග්‍ය වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසාය පුනරුත්ථාපනය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2.. (1) යම් පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක -

(අ) ඒ ව්‍යවසායේ ව්‍යාපාර ආයතනය සංයුක්ත වන ඒකක කිසිවක වැඩ නතරවීමක් හෝ සැලකිය යුතු ප්‍රමාණයක වැඩ අඩුවීමක් සහ

(ආ) ඒ ව්‍යවසායේ කම්කරුවන් හෝ එයින් සැලකිය යුතු කම්කරුවන් ගණනක් සේවයෙහි නියුක්ත නොකිරීම හෝ අඩු කිරීම හෝ ඒ කම්කරුවන්ගේ හෝ එයින් සැලකිය යුතු කම්කරුවන් ගණනකගේ වේතන හෝ ව්‍යවස්ථාපිතව අයවිය යුතු මුදල් නොගෙවීම

පුද්ගලිකරණය කරන ලද යම් රාජ්‍ය ව්‍යවසායක අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන බව හෝ සිදුවීමට ඉඩ ඇති බව ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින්, ඒ පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායේ කටයුතු පරිපාලනය සහ කළමනාකරනය ආණ්ඩුව වෙත සතු කළ හැකි අතර, ඒ නියමය බලපවත්නා තාක් කල් ඒ පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායේ සියළු නිශ්චල හා චංචල දේපළ වල සන්තකය හා පාලනය සහ එහි සියලු අයිතිවාසිකම් හා බැරකම් ආණ්ඩුව සතු විය යුතු ය.

(2) පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක, ඒ ව්‍යවසායේ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීම පිණිස පත් කරන ලද නිසි බලධරයාට, ඒ ව්‍යවසායේ සියලු නිශ්චල හා චංචල දේපළවල සහ වත්කම්වල සන්තකය හා පාලනය පවරා ගැනීමට සහ ඒ දේපළ ඒ ව්‍යවසායේ කාර්ය සඳහා භාවිත කිරීමට බලය දීමේ ප්‍රතිඵලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, ඒ නියමය අනුමත කළ යුතු බවට වූ යෝජනාවක් මගින් ඒ නියමයේ සඳහන් දිනයේ සිට මාස හතරක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද පාර්ලිමේන්තුවේ සභාවාර නොපැවැත්වේ නම්, ඊළඟට පවත්වනු ලබන සභාවාරය ආරම්භවීමෙන් දින පනහක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (අ) (3) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අනුමත කිරීම, පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක :

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් (3) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද නමුත්, (3) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඉකුත්වීමේ සිට ගණන් බලනු ලබන මාස හතරක කාලයක් ඇතුළත එය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ අවස්ථාවක :

(ඇ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් (3) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක

අවස්ථාවෝචිත පරිදි, පාර්ලිමේන්තුව විසින් ඒ නියමය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද දිනයේ හෝ (3) වන උපවගන්තියේ හෝ මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කාලය ඉකුත් වූ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, (4) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නිසා ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලබන අවස්ථාවක, ඒ නියමය කරන ලද්දේ යම් පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක් සම්බන්ධයෙන් ද, ඒ පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායේ අයිතිවාසිකම් සහ බැරකම් ආණ්ඩුව වෙත සතු නොවූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පිණිස පත් කරන ලද නිසි බලධරයා විසින් ඒ ව්‍යවසායේ කළමනාකරණය ඒ ව්‍යවසායේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට හෝ ඒ සභාපතිවරයා විසින් බලය දෙන ලද තැනැත්තකුට වහා ම භාරදිය යුතු ය. ඒ භාරදීම සිදු වූ අවස්ථාවේ ඒ ව්‍යවසායේ පැවති නිශ්චල දේපළ, පිරියත, යන්ත්‍ර සහ වෙළෙඳ බඩු තොගය පිළිබඳ දේපළ ලැයිස්තුවක් පිළියෙල කිරීමට නිසි බලධරයා විසින් සැලැස්විය යුතු ය.

3. (1) පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක කළමනාකරණය හා පාලනය 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යවසායේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් නිසි බලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පිණිස (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිසි බලධරයකු විසින්, ඒ ව්‍යවසායේ දේපළ තම සන්තකයට ගෙන, ඒ භාර ගැනීම සිදුවූ අවස්ථාවේ දී, ඒ ව්‍යවසායේ පැවති නිශ්චල දේපළ, පිරියත යන්ත්‍ර සහ වෙළෙඳ බඩු තොගය පිළිබඳ දේපළ ලැයිස්තුවක්, ඒ ව්‍යවසායේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඉදිරියෙහි හෝ ඔහු විසින් නිසි පරිදි බලය දෙන ලද යම් අනුයෝජිතයකු ඒ අවස්ථාවේ දී සිටී නම්, ඒ අනුයෝජිත ඉදිරියෙහි පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය.

(3) නිසි බලධරයා විසින්, මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී හා බලතල ක්‍රියාත්මක කිරීමේදී, ඒ ව්‍යවසායේ කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඒ අයිතිවාසිකම් පිළිගැනීම කෙරෙහි සැලකිල්ල දක්වමින් ජනාධිපතිවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හා විශේෂ විධානවලට යටත් විය යුතු ය.

(4) පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම, නිසි බලධරයා විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක, නිසි බලධරයා විසින් -

(අ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ නීතිය යටතේ නැතහොත් ඒ ව්‍යවසායේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් ඒ ව්‍යවසායේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරුනු හෝ නියම වූ හෝ වෙන්කර දෙන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු ය;

(ආ) ක්‍රියාත්මක වීම නතර වී ඇති ඒ ව්‍යවසායේ ව්‍යාපාර කටයුතු කිසිවක් නැවත ආරම්භ කළ යුතු ය;

(ඇ) ඒ ව්‍යවසායේ වාණිජ ප්‍රරෝහණතාව වඩාලීම සඳහා ඒ ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කළ යුතු ය;

(ඈ) (ආ) ඡේදයේ සහ (ඇ) ඡේදයේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් යෙදිය යුතු ය;

(ඉ) ඒ ව්‍යවසායේ නිසි ගිණුම් තැබීමේ ක්‍රම පවත්වා ගෙන යන බව සහතික කළ යුතු ය;

(ඊ) ඒ ව්‍යවසායේ කම්කරුවන්ට යථා පරිදි වැටුප් ගෙවනු ලබන බවට හා ඒ කම්කරුවන් සම්බන්ධයෙන් එහි සියලු ව්‍යවස්ථාපිත අයවීම් ඒ ව්‍යවසාය විසින් ඉටු කරනු ලබන බවට ආරක්ෂා සැලසිය යුතු ය.

(උ) ඒ ව්‍යවසායේ කටයුතු කළමනාකරණය කිරීමේ දී හා පරිපාලනය කිරීමේ දී දරන ලද සියලු ගාස්තු හා වියදම් ගෙවිය යුතු ය;

(ඌ) ඉහත සඳහන් කරුණු එලගැන්වීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් ක්‍රියා කළ යුතු ය.

(5) පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීම නිසි බලධරයා විසින් පවරාගෙන ඇත්තේ යම් කාලයක් සඳහා ද ඒ කාලය තුළ, නිසි බලධරයා විසින් තත් කාර්යය සඳහා ප්‍රකාශිතවම බලය දී ඇත්නම් මිස, ඒ ව්‍යවසායේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු විසින් ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

4. 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක්, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ (4) (ආ) උපවගන්තියේ සඳහන් කාලය ඇතුළත පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමය කිරීමට විෂය වූ පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායේ කොටස් හිමියන් විසින් දරන ලද කොටස්, ඒ කොටස් එවකටත් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් දරනු ලබන අවස්ථාවල හැර, ඒ අනුමතයේ දින සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු විය යුතු ය.

5. (1) මේ පනතේ කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින් ප්‍රධාන තක්සේරුකරුගෙන් ද, දේපළ තක්සේරු කිරීමෙහි ලා පෘථුල පළපුරුද්දක් ඇති බවට සහ හැකියාවක් පෙන්නුම් කර ඇති බවට, ජනාධිපතිවරයාට පෙනී යන වෙනත් තැනැත්තන් දෙදෙනකුගෙන් ද, සමන්විත වන්දි මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) පුද්ගලීකරණය කරන ලද ව්‍යවසායක කොටස් 4 වන වගන්තිය යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු වූ දිනයට ඉහතින් වූ දිනයේ ඒ ව්‍යවසායේ වූ කොටස් හිමියන්, ඒ පැවරීම වෙනුවෙන් සාධාරණ වන්දියකට හිමිකම් ලැබිය යුතු ය.

(3) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුව නිසා ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සලකනු ලබන අවස්ථාවක, ඒ නියමය කිරීමට විෂය වූ පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායට ඒ නියමයේ දිනයෙන් ආරම්භව ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සලකනු ලබන දිනයෙන් අවසාන වන කාලය තුළ දී සිදු වූ යම් ලාභ අහිමිවීම සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට ඒ රාජ්‍ය ව්‍යවසාය හිමිකම් ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් ලබන කොටස් හිමියන්ට සහ (3) වන උපවගන්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් ලබන පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායවලට ගෙවිය යුතු වන්දිය තක්සේරු කළ යුතු ආකාරය සහ ඒ වන්දිය ගෙවිය යුතු අන්දම හා ආකාරය සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) මේ පනත යටතේ වන්දි සඳහා වූ සියලු හිමිකම් පෑම්, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද වන්දි මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ මණ්ඩලය වෙත හිමිකම් පෑමක් ලැබුණු දිනයේ සිට මාස හයක් ඇතුළත ඒ මණ්ඩලය විසින් ඒ ප්‍රදානය සෑම හිමිකම්පෑමක් සම්බන්ධයෙන් ම කළ යුතු ය.

(6) වන්දි මණ්ඩලය විසින් කරන ලද ප්‍රදානයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අභියාචනාධිකරණයේ අවසරය කලින් ලබාගෙන හා ඇතිව, ඒ ප්‍රදානය ඒ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයේ සිට දින දහහතරක් ඇතුළත, නීතිය පිළිබඳ වූ ප්‍රශ්නයක් මත, ඒ ප්‍රදානයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය. දිසා අධිකරණවල ආඥාවලින් අභියාචනාධිකරණයට ඉදිරිපත් කරනු ලබන අභියාචනා වලට අදාල සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ අභියාචන ඉදිරිපත් කිරීම සහ විභාග කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) මේ පනත යටතේ වන්දි වශයෙන් ප්‍රදානය කරන ලද සියලු මුදල්, ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබිය යුතු ය.

6. (අ) මේ පනත යටතේ වූ නියමයක් මගින් කටයුතු කළමනාකරණය හා පරිපාලනය ආණ්ඩුව සතු කරනු ලැබුවේ යම් පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායක් ද, ඒ රාජ්‍ය ව්‍යවසායේ යම් දේපළක සන්තකය, නිසි බලධරයා වෙත භාර දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(ආ) එවැනි යම් ව්‍යවසායක යම් දේපලක් සිතාමතාම හෝ නොසැලකිලිමත් ලෙස විනාශ කරන, ඊට හානි කරන හෝ එය අක්‍රිය කරන නැතහොත් විනාශ කිරීමට හානි කිරීමට හෝ අක්‍රිය කිරීමට සලස්වන හෝ සිතාමතාම සඟවන හෝ ඉවත දමන හෝ සැඟවීමට හෝ ඉවත දැමීමට සලස්වන;

(ඇ) එවැනි යම් ව්‍යවසායක කළමනාකරණය භාර ගැනීමෙන් හෝ එහි යම් දේපළක සන්තකය හෝ පාලනය භාර ගැනීමෙන් නිසි බලධරයා වළක්වන හෝ ඔහුට බාධා කරන හෝ කෙළින් ම හෝ අන්‍යාකාරයකින් වෙනත් යම් තැනැත්තකු ලවා නිසි බලධරයා වැළැක්වීමට හෝ ඔහුට බාධා කිරීමට සලස්වන

යම් තැනැත්තකු , මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

7. 1966 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පනතේ විධිවිධාන, 4 වන වගන්තිය යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත කොටස් සතුවී ඇති පුද්ගලීකරණය කරන ලද යම් රාජ්‍ය ව්‍යවසායකට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

8. (1) නියෝග සෑදීමට නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි

හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

9. මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට මාස හයක කාලයක් ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

10. මේ වගන්තියේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව අදාළ වන ගිවිසුමකට හෝ සම්මුතියකට ශ්‍රී ලංකාව සමග ඇතුළත්ව ඇති යම් රටක -

(අ) නීතිය යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද ; හෝ

(ආ) වැසියකු යම් කොටස්හිමියකු වන

පුද්ගලීකරණය කරන ලද යම් රාජ්‍ය ව්‍යවසායකට අදාළ නොවිය යුතු යයි, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"නිසි බලධරයා" යන්නෙන්, 3 වන වගන්තිය යටතේ පත් කරන ලද නිසි බලධරයකු අදහස් වේ;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසාය" යන්නෙන්, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය අනුව, කොටස් සියල්ල ම භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත වෙන්කර ඇත්තා වූ ද-

(අ) තදනන්තර පැවරීම් කිසිවක් ඇතොත් ඒවා නොසලකා ඒ කොටස් සියල්ල ම හෝ ඉන් වැඩි කොටසක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, 1996 ජනවාරි මස 10 වන දිනට පෙරාතුව වෙනත් යම් තැනැත්තකුට පවරා ඇත්තා වූ ; හෝ

(ආ) ඒ සමාගමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය විෂයයෙහි බලාත්මක පාලනයක් ආණ්ඩුව වෙත තිබීම නතර වී ඇත්තා වූ ද

සමාගමක් අදහස් වේ;

රාජ්‍ය සංස්ථාව"යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවන ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 23 වන දින]

ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා මත බද්දක් පනවා අයකර ගැනීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

I වන පරිච්ඡේදය

භාණ්ඩ හා සේවා බද්ද පැනවීම

2. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සැපයුම කරන අවස්ථාවේ දී -

(අ) ලියාපදිංචි තැනැත්තකු විසින්, බදු අය කළ හැකි කාලසීමාවක් තුළ ශ්‍රී ලංකාවේ බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යාමේ දී හෝ කිරීමේ දී කරනු ලබන භාණ්ඩ හෝ සේවා සැපයුමක් මත :

සහ

(ආ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම මත,

(මෙහි මින් මත "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) භාණ්ඩ හා සේවා බද්ද යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි වූ ද අවස්ථාවෝචිත පරිදි සපයන ලද භාණ්ඩ හෝ සේවාවල හෝ ආනයනය කරන ලද භාණ්ඩ හෝ සේවාවල හෝ ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට යොමු කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණයක් මත වූද බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ හෝ ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ඊට පසු දිනයක ක්‍රියාත්මක විය යුතු ය. ඒ සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන එවැනි යම් නියමයක් එහි අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය . ඒ නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සැලකෙන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) භාණ්ඩ ආනයනය මත වූ බද්ද එය තීරු බද්දක් වූ කලෙක මෙන් ද ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලු භාණ්ඩ බද්දට හා තීරු බද්දට යටත් වූ කලෙක මෙන් ද පනවා අය කරගත යුතු ය. අපනයන ප්‍රවර්ධනයට අදාළව තීරු බදු ආඥාපනත යටතේ වූ සියලු නියෝග සහ කාර්ය පටිපාටි, ශ්‍රී ලංකාවේ දී අපනයනකරුවකුට සැපයීම පිණිස වන යම් භාණ්ඩයක් සෑදීම සඳහා ආනයනය කර පාවිච්චි කරනු ලැබූ භාණ්ඩ හැර, බද්දට යටත් භාණ්ඩවලට අදාළ විය යුතු ය.

3. 2 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇතද යම් තොග හෝ සිල්ලර වෙළෙඳාම මත කිසිම බද්දක් ඒ භාණ්ඩවල නිෂ්පාදන හෝ ආනයනකරු විසින් කරන තොග හෝ සිල්ලර සැපයුම මත හැර අය නොකළ යුතු ය:

එසේ වුවද 10 වන වගන්තියේ හෝ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ තොග හෝ සිල්ලර භාණ්ඩ සැපයුම මත ඒ බදු මුදල අය කර ගනු ලැබිය යුතු ය.

4. (1) භාණ්ඩ සැපයුම -

(අ) සැපයුම්කරු විසින් භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කළ විට : හෝ

(ආ) සැපයුම්කරුට භාණ්ඩ සඳහා ගෙවීමක් ලැබුණු විට : හෝ

(ඇ) ඒ සැපයුම සම්බන්ධයෙන් සැපයුම්කරුට භාණ්ඩ සඳහා මුදල් අයවිය යුතුව ඇති විට: හෝ

(ඇ) භාණ්ඩ භාරදීම සිදුකර ඇති විට

යන අවස්ථාවල දී කලින් එළඹෙන අවස්ථාවේ සිදුවිය යුතුය

(2) සේවා සැපයුම

(අ) සේවා ඉටුකළ විට; හෝ

(ආ) සේවා හෝ අනාගත සේවා සඳහා ගෙවීමක් කළ විට ; හෝ

(ඇ) සේවා හෝ අනාගත සේවා සඳහා ගෙවීමක් අයවිය යුතු වූ විට ; හෝ

(ඈ) සේවා සම්බන්ධයෙන් ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කළ විට

යන අවස්ථාවලින් කලින් එළඹෙන අවස්ථාවේදී සිදු විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කුමක් සඳහන්ව ඇත ද පහත දැක්වෙන අවස්ථාවල දී සැපයුමක් සිදු වන ලෙස සලකනු ලැබිය යුතු ය:-

(අ) සැපයුමක්, කුලී සින්නක්කර ගිවිසුමක් හැර, කලින් කල ගෙවීම්වලට විධිවිධාන සලස්වන ගිවිසුමක් යටතේ වන අවස්ථාවක, ගෙවීම අයවිය යුතු වන විට හෝ ගෙවීම ලැබුන විට, යන මේ දෙකින් වඩා කලින් එළඹෙන අවස්ථාවේ දී , සහ

(ආ) භාණ්ඩ කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සපයන අවස්ථාවක, ගිවිසුමට එළඹුන අවස්ථාවේදී ය..

5. (1) භාණ්ඩ හෝ සේවා සැපයුමක වටිනාකම -

(අ) සැපයුම මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා වන්නේ නම් එම ප්‍රතිෂ්ඨාවෙන් මෙම පනත යටතේ අය කළ යුතු යම්කිසි බදු මුදලක් ද, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් සහ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු යම් ජාතික ආරක්ෂක බද්දක් ද අඩු කළ පසු, ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොලේ වටිනාකමට නොඅඩු විය යුතු එම ප්‍රතිෂ්ඨාව විය යුතු ය :

(ආ) සැපයුම මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා නොවේ නම් හෝ සම්පූර්ණයෙන් මුදලින් සංයුක්ත නොවේ නම්, ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොලේ වටිනාකම විය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, භාණ්ඩ හෝ සේවා සැපයුමක් ලියාපදිංචි තැනැත්තකු විසින් විවෘත වෙළෙඳපොලේ වටිනාකමට අඩු වටිනාකමකට කරන්නා වූ ද, ලැබුම්කරු ලියාපදිංචි තැනැත්තෙකු නොවන්නා වූ ද, අවස්ථාවක ඒ සැපයුම සම්බන්ධයෙන් වටිනාකම ඒ සැපයුමේ විවෘත වෙළෙඳ පොලේ වටිනාකම විය යුතු ය

(3) භාණ්ඩ හෝ සේවා, සේවායෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තයට සේවා නියුක්තියෙන් ලැබෙන ප්‍රතිලාභයක් වශයෙන් සපයන අවස්ථාවක, ඒ සැපයුම සඳහා මුදල් වටිනාකම ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොලේ වටිනාකම හෝ ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොලේ වටිනාකම නිශ්චය කළ නොහැකි අවස්ථාවක ඒ සැපයුම සඳහා මුදල් වටිනාකම වෙනත් යම් තැනැත්තකු විසින් භුක්ති විඳිනු ලබන රට සමාන ප්‍රතිලාභයක, තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලබන පරිදි, පිරිවැය විය යුතු ය.ත

(4) සේවා සැපයුමක් යම් ලොතරැයියක් හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම්වලට ඇතුළත්වීමේ හෝ ගණුදෙනු කිරීමේ යම් බදු අය කළ හැකි කටයුත්තක් යටතේ හෝ එවැනි ම ස්වභාවයේ යම් ව්‍යාපාරයක් යටතේ කෙරෙන අවස්ථාවක, ඒ සැපයුමේ වටිනාකම, ඒ සැපයුම සම්බන්ධයෙන් ලැබිය යුතු මුළු මුදලින් අවස්ථාවෝචිත පරිදි ඒ ලොතරැයියේ දී හෝ ඒ ගිවිසුම් වල දී හෝ එවැනි ම ස්වභාවයේ යම් ව්‍යාපාරයකදී දෙනු ලබන තෑගි හෝ දිනුම්වල ප්‍රතිෂ්ඨාව අඩු කළ විට ලැබෙන මුදල විය යුතු ය.

(5) භාණ්ඩ හෝ සේවා -

(i) 16 වන වගන්තිය යටතේ ලියාපදිංචි අවලංගු කරන වේලාවේ දී තැනැත්තකු විසින් සපයන අවස්ථාවක; හෝ

(ii) 8 වන වගන්තිය යටතේ නිදහස් කළ සැපයුම් කරන යම් තැනැත්තකුට සපයන අවස්ථාවක; හෝ

(iii) ලියාපදිංචි තැනැත්තකු නොවන්නා වූ හෝ 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති ලියාපදිංචි තැනැත්තකු වන්නාවූ ද යම් තොග හෝ සිල්ලර වෙළෙඳාමක් කරගෙන යන්නා වූ ද තැනැත්තකුට සපයන අවස්ථාවක; හෝ

(iv) සැපයුම්කරු විසින් ඔහුගේ පුද්ගලික පාවිච්චියට හෝ බදු අය කළ හැකි සැපයුමක් හැර වෙනත් කාර්යයකට යොදා ගන්නා අවස්ථාවක,

ඒ සැපයුමේ වටිනාකම ලෙස විවෘත වෙළෙඳ පොලේ වටිනාකමට අඩු ප්‍රමාණයක් නොසැලකිය යුතු ය

(6) භාණ්ඩ හෝ සේවා සැපයුමක් සම්බන්ධයෙන් වූ ප්‍රතිෂ්ඨාව බදු අය කළ හැකි සැපයුමකට සහ බදු අය කළ නොහැකි සැපයුමකට අදාළ වන අවස්ථාවක ඒ බදු අය කළ හැකි සැපයුම සඳහා වූ ප්‍රතිෂ්ඨාව ඒ බදු අය කළ හැකි සැපයුමට ආරෝපණය කළ හැකි වටිනාකමේ කොටස වශයෙන් සලකනු ලැබිය යුතු අතර එය ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොලේ වටිනාකමට අඩු නොවිය යුතු ය.

(7) සැපයුම්කරුගේ හෝ වේවා වෙනත් තැනැත්තකුගේ හෝ වේවා වෙනත් භාණ්ඩ ප්‍රයෝජනයට ගෙන භාණ්ඩ සාදනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවක, එකී වෙනත් භාණ්ඩ දෙවනුව සඳහන් කළ භාණ්ඩවලට ඒකාබද්ධ කළ ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ සාදනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල සැපයුමේ වටිනාකම සහ ඒ සෑදීමට හෝ නිෂ්පාදනයට සම්බන්ධ සේවා සැපයුමේ වටිනාකම ඒ සැපයුමේ විවෘත වෙළඳ පොලේ වටිනාකම හෝ ඒ සැපයුමට ලැබුනු ප්‍රතිෂ්ඨාව යන මේ දෙකින් වඩා වැඩි මුදල විය යුතු ය.

කෙසේ වුවද, භාණ්ඩ සැපයුම සහ සේවා සැපයුම වෙනම සැපයුම් දෙකක් බව තක්සේරුකරු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ විට තක්සේරුකරු විසින් ඒ එක් එක් සැපයුම වෙනම සැපයුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ සැපයුමක වටිනාකම 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද මුදල් මිල විය යුතු අතර, විවෘත වෙළෙඳපොලේ වටිනාකමට අඩු නොවිය යුතු ය.

(9) ඉඩම් සැපයුමේ වටිනාකම නියමිත දිනයට පසුව ඒ ඉඩමට කරන ලද වැඩිදියුණු කිරීම්වල වටිනාකම විය යුතු අතර විවෘත වෙළෙඳපොලේ වටිනාකමට අඩු නොවිය යුතු ය.

(10) ටිකට්පත් නිකුත් කිරීම මත හෝ මුදල් තැන්පත් කිරීම මගින් භාණ්ඩ හා සේවා සපයන අවස්ථාවක ඒ සැපයුමේ වටිනාකම අවස්ථාවෝචිත පරිදි ඒ ටිකට් පතට ගෙවූ මුදල හෝ ආපසු ගෙවිය යුතු යම් මුදලක් නොවන, තැන්පත් කළ මුදල විය යුතු ය.

6. (1) ආනයන කරන ලද භාණ්ඩවල වටිනාකම -

(අ) තීරු බදුවල කාර්ය සඳහා තීරණය කරන ලද භාණ්ඩවල වටිනාකම ;

(ආ) යම් අධිභාරයක් ද භාණ්ඩ මත සෙස් බද්දක් ද ඇතුළුව ගෙවිය යුතු තීරු බද්දේ ප්‍රමාණය,

යන මේ දෙකේ එකතුව විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් භාණ්ඩවල වටිනාකම ගණන් බැලීමේ දී පහත දැක්වෙන දේ සම්බන්ධයෙන් අයකරනු ලබන යම් මුදලක් ඊට ඇතුළත් විය යුතු ය:-

(අ) අදාළ භාණ්ඩ අඩංගු වී ඇති යම් එතුමක්, ඇසුරුමක්, පෙට්ටියක්, බෝතලයක් හෝ වෙනත් බහලුවක්; සහ

(ආ) එම එතුමේ, ඇසුරුමේ, පෙට්ටියේ, බෝතලයේ හෝ වෙනත් බහලුවේ අඩංගු හෝ ඊට අනුබද්ධ යම් වෙනත් භාණ්ඩ ; සහ

(ඇ) ප්‍රචාරණය, මුලසකරණය, සේවාකරණය, ප්‍රතිඥාභාරය, වට්ටම්, ප්‍රවාහනය, ඉදිකිරීම් හෝ වෙනත් කාරණයක් සඳහා හෝ එවැන්නකට ප්‍රතිපාදන සැලසීම සඳහා අයකරනු ලබන යම් මුදලක් ඇතුළුව (එකම අවස්ථාවේ දී හෝ වෙනත් යම් අවස්ථාවක දී ගෙවිය යුතු වුවද) මිල වශයෙන් අය කරන මුදලට අතිරේකව විකිණීම හේතුවෙන් හෝ විකිණීම සම්බන්ධයෙන් ගැනුම් කරුවකු විසින් විකුණුම්කරුට ගෙවිය යුතු වන යම් මුදලක්.

7. (1) භාණ්ඩ සැපයුමක් -

(අ) එම භාණ්ඩ සැපයුම සැපයුම්කරුවකු විසින් අපනයනය කරනු ලැබ ඇති අවස්ථාවක ද ශුන්‍ය අනුප්‍රමාණ ගත කළ යුතු ය;

(ආ) සේවා සැපයුමක් සෑපුවම

(i) ශ්‍රී ලංකාවෙන් පිටත යම් නිශ්චල හෝ චංචල දේපළක් සම්බන්ධයෙන් වන විට ;

(ii) යම් විදේශීය නෞකාවක් හෝ ගුවන් යානයක් අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වන විට හෝ මුහුදු නැව් බඩු කන්ටේනරයක් යථාවත් කිරීම සම්බන්ධයෙන් වන විට, හෝ නැවත අපනයනය කිරීම සඳහා ආනයනය කර ඇති වෙනත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් වන විට;

(iii) ප්‍රකාශන අයිතියක්, පේටන්ට් අයිතියක්, බලපත්‍රයක්, වෙළෙඳ ලකුණක් හෝ ඒ හා සමාන බුද්ධිමය දේපළ අයිතිවාසිකමක් ශ්‍රී ලංකාවෙන් පිටත දී භාවිත කරන අවස්ථාවක දී සහ එසේ භාවිත කරන තාක් කල්,

එම සේවා සැපයුම ශූන්‍ය අනුප්‍රමාණ ගත කළ යුතු ය.

(2) ලියාපදිංචි තැනැත්තකු විසින් යම් භාණ්ඩ හෝ සේවා සපයා ඒ සැපයුම ශූන්‍ය අනුප්‍රමාණගත කර ඇති අවස්ථාවක-

(අ) ඒ සැපයුම සම්බන්ධයෙන් කිසිම බද්දක් අය නොකළ යුතු ය;

(ආ) අනිකුත් සියලු අංශවලින් ඒ සැපයුම බදු අය කළ හැකි සැපයුමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ සැපයුම මත බදු අයකරනු ලැබුවේ යැයි සැලකෙන අනුපාතිකය ශූන්‍ය විය යුතු ය.

8. මේ පනතේ විධිවිධාන, 7 වන වගන්තිය යටතේ ශූන්‍ය අනුප්‍රමාණගත යම් භාණ්ඩ කිසිවක් හැර, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සැපයුමට හෝ එසේ දක්වා ඇති භාණ්ඩ ආනයනයට අදාළ නොවිය යුතු ය.

9. සැපයුම්කරු, බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් ශ්‍රී ලංකාව තුළ කර ගෙන යන විට සහ සපයනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ ශ්‍රී ලංකාවේ ඇති විට හෝ සැපයුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් ශ්‍රී ලංකාව තුළ සේවා සපයනු ලබන අවස්ථාවක, මේ පනතේ කාර්ය සඳහා, ඒ භාණ්ඩ හෝ සේවා ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

II වන පරිච්ඡේදය
ලියාපදිංචි කිරීම

10. (1) නියමිත දිනයේ හෝ ඉන්පසු යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් ශ්‍රී ලංකාව තුළ කරගෙන යන හෝ කරන සෑම තැනැත්තකු ම -

(අ) යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසානයේ දී ඔහුගේ බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම් ඒ බදු අය කළ හැකි කාලසීමාව ඇතුළත ශ්‍රී ලංකාව තුළ සපයන ලද මුළු වටිනාකම රුපියල් ලක්ෂ දෙකක් ඉක්මවා ඇත්නම් ; හෝ

(ආ) එවකට අවසාන වන බදු අය කළ හැකි කාලසීමා හතර තුළ ඔහුගේ බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම ශ්‍රී ලංකාව තුළ සපයන ලද මුළු වටිනාකම රුපියල් ලක්ෂ හතක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) බදු අය කළ හැකි කාලසීමාවක ඔහුගේ බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ දෙකක් ඉක්මවන බව හෝ ඉන් ඉක්බිතිව වූ බදු අය කළ හැකි කාලසීමා හතර තුළ එකී මුළු වටිනාකම රුපියල් ලක්ෂ හතක් ඉක්මවන බව විශ්වාස කිරීමට යම් අවස්ථාවක හේතු ඇත්නම්,

ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් සෑම තැනැත්තකු ම ඔහු එසේ යටත් වීමෙන් දින පහළොවකට වඩා පමා නොවී නියමිත ආකෘතියේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතු ය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා සැපයුම්වල මුළු වටිනාකම භාණ්ඩ නිෂ්පාදකයකු වශයෙන් හෝ ආනයන කරුවකු වශයෙන් එම භාණ්ඩ සම්බන්ධයෙන් කරනු ලබන වෙළෙඳ කටයුත්තක් නොවන යම් තොග හෝ සිල්ලර වෙළෙඳ කටයුත්තක සැපයුම් ඇතුළත් නොවිය යුතු ය.

11. (1) ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කරන්නකු වන සෑම තැනැත්තකු ම ඒ භාණ්ඩ නිශ්කාෂණය කිරීමට පෙර දින දහ හතරකට වඩා පමා නොවී කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමටද ඒ භාණ්ඩ නිශ්කාෂණය කිරීම සඳහා හඳුනා ගැනීමේ අංකයක් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබා ගැනීමට ද යටත් විය යුතු ය;

එසේ වුවද, ස්වකීය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා භාණ්ඩ ගෙන්වන තැනැත්තකු හෝ 10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමට යටත් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාට දැන්වීමට හා හඳුනා ගැනීමේ අංකයක් ලබා ගැනීමට යටත් සෑම ආනයනය කරන්නකු ම කොමසාරිස් ජනරාල්වරයා වෙත නියමිත ආකෘතියේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතු ය.

12. 3 වන වගන්තියේ හෝ 10 වන වගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන්ව ඇතද ආනයන කරන්නකු ඇතුළු බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා නිශ්චිත ආකෘතියේ ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ හැකි ය.

13. (1) යම් තැනැත්තකු -

අ) 10 වන හෝ 12 වන වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ අවස්ථාවක එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය;

(ආ) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නැති නමුත් ඔහු විසින් කරගෙන යනු ලබන ගණුදෙනු හා ඒවායේ ස්වභාවය ගැන සලකා බලනවිට ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක කරුණු කියා සිටීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට ලබා දීමෙන් පසු, ඔහු විසින් තීරණය කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි,

ඒ තැනැත්තා ලියාපදිංචි කළ යුතු ය.

14. 13 වන වගන්තිය යටතේ තැනැත්තකු ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කවර හෝ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන, යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට අදාළව තොරතුරු ඒ තැනැත්තාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

15. (1) තැනැත්තකු ලියාපදිංචි කිරීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) බදු ලියාපදිංචි කිරීමේ අංකයක්; සහ

(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

ඒ තැනැත්තාට නිකුත් කළ යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ සහතිකයේ ලියාපදිංචි තැනැත්තාගේ නම සහ අනිකුත් අදාළ විස්තර ද ලියාපදිංචිය ක්‍රියාත්මක වන දිනය ද ඒ තැනැත්තාගේ බදු ලියාපදිංචි අංකය ද දක්වා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සහතිකයක් ලද තැනැත්තා ඒ සහතිකය ඔහු විසින් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කරන හෝ කරගෙන යනු ලබන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය. ව්‍යාපාර ස්ථාන එකකට වඩා ඇති අවස්ථාවක ඒ සහතිකයේ පිටපත් ප්‍රදර්ශනය කළ හැකි ය.

(4) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පනස් දහසකට නොවැඩි දණ්ඩන මුදලක් එම තැනැත්තාට පැනවිය හැකි අතර එම දණ්ඩනය පැනවීම ගැන ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැනුම් දිය හැකි ය;

(ආ) ලිඛිත දැන්වීමක් මගින් -

(i) එම දණ්ඩන මුදල ගෙවන ලෙස; සහ
(ii) එම දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාව තුළ (3) වන උපවගන්තිය යටතේ වූ නියමයන්ට එකගව ක්‍රියා කරන ලෙස,

එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු (3) වන උපවගන්තියේ නියමයන්ට එකගව ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනයෙන් තොර අවස්ථානුගත කරුණු නිසා බවත් පසුව එම නියමයන්ට එකගව ඔහු ක්‍රියාකර ඇති බවත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි එම තැනැත්තා ඔප්පු කරන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් (4) වන වගන්තියේ (අ) ඡේදය යටතේ එම තැනැත්තා වෙත පනවන ලද දණ්ඩන මුදල අඩු කිරීම, හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

16. (1) ලියාපදිංචි තැනැත්තකු බදු අයකළ හැකි ක්‍රියකාරකමක් කිරීම හෝ කරගෙන යාම නතර කර ඇති අවස්ථාවක, එමෙන් ම ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඔහුගේ බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම 10 වන වගන්තියේ දක්වා ඇති වටිනාකම නොඉක්මවන අවස්ථාවක ලියාපදිංචි කිරීමේ දිනයෙන් පසුව වන අනුගාමී බදු අය කළ හැකි කාලසීමා අටක් අවසානවීමෙන් පසුව කවර හෝ අවස්ථාවක ඔහුගේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ තැනැත්තා බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීම හෝ කරගෙන යාම නතර කර ඇති බවට හෝ ඔහුගේ මුළු බදු අය කළ හැකි සැපයුම් 10 වන වගන්තියේ දක්වා ඇති වටිනාකම නොඉක්මවන බවට සෑහීමට පත් වූ විට, ඔහුගේ ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.

(3) 10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි යම් තැනැත්තකු බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීම, කරගෙන යාම නතර වී නැතිබව හෝ ආදායම ආරක්ෂා කිරීම සඳහා ඔහුගේ ලියාපදිංචිය දිගටම පවත්වාගෙන යාම අවශ්‍ය හා උචිත බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක ඔහුගේ ලියාපදිංචිය අවලංගු කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගු කරන අවස්ථාවක, ඔහු විසින් ඒ අවලංගු කිරීමේ දිනය ලියාපදිංචි තැපෑලෙන් ඒ ලියාපදිංචි තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(5) ලියාපදිංචිය අවලංගු කිරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලැබූ බදු අය කළ හැකි ක්‍රියාකාරකමක වත්කම්වල කොටසක් සංයුක්ත කරන යම් භාණ්ඩ හෝ සේවා අවලංගු කිරීමේ දිනයට පෙරාතුව ම වූ කාලයක බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීමේ දී හෝ කරගෙන යාමේ දී ඒ තැනැත්තා විසින් සපයන ලද ඒවා වශයෙන් එකී සියලු වත්කම් ඇතුළු එම බදු අය කළ හැකි ක්‍රියාකාරකම් ලියාපදිංචි තැනැත්තකු වන වෙනත් තැනැත්තකු විසින් කරනු ලැබේ නම් හෝ කරගෙන යනු ලබන්නේ නම් මිස, සලකනු ලැබිය යුතු ය.

17. (1) යම් තැනැත්තකුගේ ලියාපදිංචිය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කර ඇති අවස්ථාවක ඒ තැනැත්තා -

(අ) ලියාපදිංචිය වලංගුව තිබූ අන්තිම බූ අය කළ හැකි කාල සීමාවේ අවසාන දිනයෙන් පසු දින දහහතරකට වඩා පමා නොවී, ඔහුට නිකුත් කරනු ලැබ තිබූ ලියාපදිංචි කිරීමේ සහතිකය කොමසාරිස් ජනරාල්වරයාට ආපසු දිය යුතු ය;

(ආ) ඒ බදු අය කළ හැකි කටයුත්ත සිදු කරන කවර හෝ ස්ථානයක, ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එහි පිටපතක් ප්‍රදර්ශනය නොකළ යුතු ය;

(ඇ) අවස්ථාවෝචිත පරිදි යම් බදු ඉන්වොයිස් පත්‍රයක්, බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් නිකුත් නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පනස් දහසකට නොවැඩි දණ්ඩන මුදලක් එම තැනැත්තාට පැනවිය හැකි අතර එම දණ්ඩන මුදල පැනවීම පිළිබඳව එම තැනැත්තාට ලිඛිතව දැනුම් දිය හැකි ය;

(ආ) ලිඛිත දැන්වීමක් මගින්-

(i) එම දණ්ඩන මුදල ගෙවන ලෙස; සහ

(ii) එම දැන්වීමේ නිශ්චිතව දන්වනු ලැබිය හැකි කාල සීමාව තුළ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ නියමයන්ට එකගව ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනයෙන් තොර අවස්ථානුගත කරුණු නිසා බවත් පසුව එම නියමයන්ට අනුකූලව ඔහු ක්‍රියා කර ඇති බවත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි එම තැනැත්තා ඔප්පු කරන්නේ නම් කොමසාරිස් ජනරාල් වරයා විසින් (2) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ එම තැනැත්තා වෙත පනවන ලද දණ්ඩන මුදල අඩු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

18. 16 වන වගන්තිය යටතේ ලියාපදිංචි අවලංගු කරනු ලැබුව ද, ලියාපදිංචි තැනැත්තකු, ඔහු ලියාපදිංචි තැනැත්තකුව සිටි කාලයේ දී ඔහු විසින් කරන ලද බදු අය කළ හැකි සැපයුම් සම්බන්ධයෙන්, කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවකට වගකිව යුතු ය.

19. සෑම ලියාපදිංචි තැනැත්තකු ම-

(අ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකමක නමෙහි, ලිපිනයෙහි හෝ කරගෙන යන ස්ථානයෙහි යම් වෙනසක්;

(ආ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකමක ස්වභාවයේ යම් වෙනසක්

(ඇ) වාර්තා සහ වෙනත් ලේඛන අත්සන් කිරීමට බලය ලත් තැනැත්තාගේ යම් වෙනසක් ;

(ඈ) බදු අය කළ හැකි ක්‍රියාකාරකමේ අයිතියේ යම් වෙනසක්,

ඒ වෙනස සිදුවීමෙන් දින දහහතරකට වැඩි කාලයක් පමා නොවී කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

20. (1) බදු අය කළ හැකි සැපයුමක් කරන ලියාපදිංචි තැනැත්තකු ඒ සැපයුම ලබන වෙනත් ලියාපදිංචි තැනැත්තකුට ඒ සැපයුමේ වේලාවෙන් දින දහහතරකට වැඩි කාලයක් පමා නොවී බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ යුතු ය.

(2) බදු ඉන්වොයිස් පත්‍රයේ -

(අ) සැපයුම්කරුගේ නම, ලිපිනය සහ ලියාපදිංචි කිරීමේ අංකය ;

(ආ) ඒ සැපයුම ලබන්නාගේ නම, ලිපිනය සහ ලියාපදිංචි අංකය ;

(ඇ) බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ දිනය සහ එහි අනුක්‍රමික අංකය ;

(ඈ) සැපයුම කළ දිනය සහ සපයන ලද භාණ්ඩ හෝ සේවාවවල විස්තරය ;

(ඉ) සැපයුමේ ප්‍රමාණය හෝ ධාරිතාව; සහ

(ඊ) සැපයුමේ වටිනාකම, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බදු ප්‍රමාණය, 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු යම් ආරක්ෂක බද්දක්, අය කළ බද්ද සහ සැපයුම සඳහා ප්‍රතිශතය

දක්වා තිබිය යුතු ය.

(3) භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක, රේගු භාණ්ඩ ප්‍රකාශනය හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සත්‍යායනය කරන ලද වෙනත් ලේඛනයක් බදු ඉන්වොයිස් පත්‍රය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) ඒ ඉන්වොයිස් පත්‍රයේ මුල් පිටපත ඒ සැපයුම ලැබූ තැනැත්තාට නිකුත් කළ යුතු අතර ඒ ඉන්වොයිස් පත්‍රයේ දෙවැනි පිටපත, ඒ සැපයුම කරන තැනැත්තා විසින් ඒ ඉන්වොයිස් පත්‍රය නිකුත් කරන ලද බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසු අවුරුදු පහක කාලයක් තබා ගත යුතු ය.

(5) එක් සැපයුමක් සඳහා බදු ඉන්වොයිස් පත්‍ර එකකට වඩා නිකුත් කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය. බදු ඉන්වොයිස් පත්‍රයෙහි මුල් පිටපත නැති වූ බව ලියාපදිංචි තැනැත්තා කියා සිටින්නේ නම්, "පිටපතක් පමණයි" යන්න පැහැදිලිව ලකුණු කරන ලද පිටපතක් එම ලියාපදිංචි තැනැත්තා වෙත සැපයුම්කරු විසින් නිකුත් කළ හැකි ය.

(6) ලියාපදිංචි තැනැත්තකු විසින් ලියාපදිංචි නොවූ තැනැත්තකුට බදු අය කළ හැකි සැපයුමක් කරනු ලබන අවස්ථාවක, එම සැපයුමේ බද්ද ඇතුළු ප්‍රතිශතය සහ එම සැපයුමට අදාළ බදු අනුප්‍රමාණයද සඳහන් කරමින් එම ලියාපදිංචි තැනැත්තා විසින් ලියාපදිංචි නොවූ තැනැත්තා වෙත ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් විසිපන් දහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂ පණස් දහසක් නොඉක්මවන දඩයකට සහ ඉන් පසුව වරද දිගට ම සිදු කරන්නේ නම් ඒ වරද දිගට ම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් පන්සියය බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු වූ යම් තැනැත්තකු, එසේ වරදකරු වූ දින සිට දින දාහතරකට පසු දිගට ම වරද සිදු කරන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින් ව්‍යාපාරය වැසීම සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් එම ව්‍යාපාරය වැසීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවකට එකඟව ක්‍රියා කිරීමට එම තැනැත්තා අපොහොසත් වන්නේ නම්, එම ආඥාව නිකුත් කිරීමේ දින සිට දින තුනකට නො අඩු සහ දින හතකට නො වැඩි දිනයක් නිශ්චිතව දන්වමින් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයා වෙත ආඥාවක් නිකුත් කරමින් එම දිනයට පෙර එම ව්‍යාපාරය වසා දමන ලෙස එම පිස්කල්වරයාට නියම කොට බලය පවරනු ලැබිය යුතු ය. එකී පිස්කල්වරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද යම් පොලිස් නිලධරයකුට සහ එකී පිස්කල්වරයා හෝ පොලිස් නිලධරයා විසින් අවශ්‍ය යයි සලකන වෙනත් සහායකයන් ද සමග එකී ව්‍යාපාරය පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයට ඇතුළු වී එම ව්‍යාපාරය වසා දැමීම [illegible] ප්‍රමාණවත් අධිකාර පත්‍රයක් වන්නේ ය.

III වන පරිච්ඡේදය

වාර්තා සහ බදු ගණන් බැලීම

21. (1) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත්වීමෙන් පසු දින පහළොවකට වඩා පසු නොවී ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයීම් පිළිබඳව වාර්තාවක් සැපයිය යුතු ය. ඒ සෑම වාර්තාවක් ම නිශ්චිත ආකෘතියේ විය යුතු අතර ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද-

(i) ලියාපදිංචි තැනැත්තකු වන, අපනයනකරුවකු විසින් :
හෝ

(ii) 26 වන වගන්තිය යටතේ එක් එක් මාසයේ දී කරන ලද බදු අය කළ හැකි සැපයුම මත වූ බද්ද ගෙවීමට යටත් වූ ලියාපදිංචි තැනැත්තකු විසින් : හෝ

(iii) ලියාපදිංචි තැනැත්තකුව සිටිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග මේ පනතේ උපලේඛනයේ විෂයාංක (XXVII) හි හෝ (XXVIII) හි සඳහන් ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු විසින්,

බදු අය කළ හැකි කාලසීමාවේ පලමුවන සහ දෙවන මාසයෙහි ඔහු විසින් කරන ලද බදු අය කළ හැකි සැපයුම සම්බන්ධයෙන් එක් එක් මාසය සඳහා එම මාසය අවසන් වී දින පහළොවක් ගතවීමට පෙර වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) තක්සේරුකරුවකු විසින් ඔහුගේ විනිශ්චය පරිදි, ලියාපදිංචි කරනු ලැබුව ද නොලැබුව ද බදු අයකරනු ලැබිය හැකි යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත නිශ්චිත ආකෘති පත්‍රයේ විස්තර ඇතුළත් වාර්තාවක් සපයන ලෙස නියම කළ හැකි ය.

(4) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ කාර්ය සඳහා තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමකින් -

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එවැනි යම් අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් සකස් කළ ආකෘතියක හෝ ඒවායේ සංයෝජනයක අන්තර්ගත වූ ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවිලි තුණ්ඩු, ගිණුම්, විගණක වාර්තා හෝ ඔහු සන්තකයෙහි ඇති නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් ලේඛන, ඒ පොත්වල ලේඛනවල සහ ගිණුම්වල ඇති සටහන් සත්‍යායනය කිරීම සඳහා පරීක්ෂණයකට ඉදිරිපත් කිරීමට හෝ තක්සේරුකරු වෙත එවීමට :

(ආ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි කටයුත්ත සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට, යම් දිනයක හා යම් වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයකු මගින් පැමිණීමට නියම කරනු ලැබිය හැකිය.

(5) මේ පනතේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමකින් -

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත යම් පොත්පත්, අතින් ලියූ, යන්ත්‍රානුසාරයෙන් හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් සකස් කළ ආකෘතියක හෝ ඒවායේ සංයෝජනයක අන්තර්ගත වුවද ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ ඔහු සන්තකයෙහි ඇති ඒ දැන්වීමේ නිශ්චිතව ඇති වෙනත් ලේඛන ඉදිරිපත් කිරීමට හෝ ඒ නියෝජ්‍ය කොමසාරිස් වෙත එවීමට :

(ආ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් කරුණක් පිළිබඳව ඔහු පරීක්ෂා කරනු ලැබීම සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට යම් දිනයක හා යම් වේලාවක තමා ම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණීමට,

නියම කරනු ලැබිය හැකි ය.

(6) 5 වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමකට අනුකූලව පැමිණෙන යම් තැනැත්තකුට එසේ පැමිණීමෙහි ලා අවශ්‍යයෙන්ම දරන්නට සිදු වූ යම් සාධාරණ වියදමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

(7) නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමතය ඇතිව තක්සේරුකරුවකු විසින් හෝ තමා සන්තකයෙහි ඇති, අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් ආකෘතියක හෝ ඒවායේ යම් සංයෝජනයක වූ යම් ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, බැරපත්, ගිණුම්, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන නිශ්චිතව සඳහන් පරිදි, පොත්වල, ලේඛනවල සහ ගිණුම්වල සටහන් සහපායනය කිරීම සඳහා අවශ්‍ය තරම් කාලයක් මෙම පනතේ කාර්ය සඳහා තම භාරයෙහි රඳවා ගත හැකි ය.

(8) තක්සේරුකරුවකු විසින්, අවශ්‍ය යයි අදහස් කරනු ලබන අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය අතුළත, තක්සේරුකරුගේ මතය අනුව යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද සඳහා අවශ්‍ය හෝ අදාළ යම් කාරණයක් පිළිබඳව -

(අ) සම්පූර්ණ හෝ වැඩිදුර වාර්තා ; හෝ

(ආ) සම්පූර්ණ හෝ වැඩිදුර තොරතුරු,

සපයන ලෙසට ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය හැකි ය.

(9) යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ පනත යටතේ සපයන ලදැයි අදහස් කෙරෙන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සැපයූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ වාර්තාවට, ප්‍රකාශයට හෝ ආකෘතියට අත්සන් කරන යම් තැනැත්තකු එහි සඳහන් සියලු කරුණු ගැන දැන සිටි බව සලකනු ලැබිය යුතු ය.

(10) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත වාර්තාවක් සපයන ලෙස ඔහුට විධාන කරමින් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පණස් දහසකට නොවැඩි මුදලක දණ්ඩනයක් ඒ තැනැත්තා වෙත පැනවිය හැකි අතර ඒ දණ්ඩනය පැනවීම ගැන ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය හැකි ය ;

(ආ) පහත දැක්වෙන දේ කරන ලෙස ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ හැකි ය ;

(i) ඒ දණ්ඩනය ගෙවීම ; සහ

(ii) ඒ දැන් වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව සපයා නැත්නම් එය සැපයීම හෝ (3) වන උපවගන්තිය යටතේ ඔහුට දෙන ලද දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කර නැත්නම් ඒවාට අනුකූලව ක්‍රියා කිරීම.

(11) අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ නියමයන්ට හෝ (3) වන උපවගන්තිය යටතේ විධානයට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වූයේ තමාගේ පාලනයෙන් බැහැර වූ හේතු නිසා බවත් ඊට පසුව ඔහු විසින් ඒ නියමයන්ට හෝ විධානයට අනුකූලව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා ඔප්පු කළහොත් (10) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් තැනැත්තකුට පනවන ලද යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කිරීම, හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(12) (11) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සැපයීම හෝ (3) වන උපවගන්තිය යටතේ විධානයකට අනුකූලව කටයුතු කිරීම හෝ පැහැර හැරීම සඳහා (10) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් පනවනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා ඒ වාර්තාවට හෝ දැන්වීමට අදාළව 68 (ට) වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා නඩු පවරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

22. (1) ලියාපදිංචි තැනැත්තකු තමා විසින් කරන ලද බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව සඳහන් ආකාරයකින් සහ එසේ සඳහන් කරනු ලබන කාලයක දී එසේ සඳහන් කරනු ලබන බදු අය කළ හැකි කාලසීමාවන්ට යොමු කොට ගිණුම් පෙන්වීම සහ බදු ගෙවීම කළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ එක් එක් කාලසීමාව අවසානයේ දී මේ පනත යටතේ ඉඩ දෙනු ලැබිය හැකි තමාගේ යෙදවුම් බද්දේ ප්‍රමාණයක් සඳහා බැර වාසියට ද ඊට පසු ඒ මුදල තමාගෙන් අය විය යුතු යම් නිමැවුම් බද්දකින් අඩු කිරීමට ද ලියාපදිංචි තැනැත්තකුට හිමිකම් ලැබිය යුතු ය.

(3) ලියාපදිංචි තැනැත්තකුට සපයන ලද භාණ්ඩ හෝ සේවා හෝ ඔහු විසින් ආනයනය කරන ලද භාණ්ඩ ඔහු විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකමට කොටසක් භාවිත කරන හෝ කොටසක් වෙනත් කාර්ය සඳහා භාවිත කරන හෝ අවස්ථාවක, සැපයුම් සහ ආනයන කිරීම් මත වූ බද්ද ඒ සැපයුමෙන් හෝ ආනයනය කිරීමෙන් ඔහුගේ බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට යොමු කළ හැකි ප්‍රමාණය පමණක් ඔහුගේ යෙදවුම් බද්ද වශයෙන් ගණන් ගැනුන පරිදි වෙන් කර දිය යුතු ය.

(4) 21 වන වගන්තිය යටතේ යම් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක සහ යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසානයේ දී යෙදවුම් බද්දේ ප්‍රමාණය නිමැවුම් බද්දේ ප්‍රමාණය ඉක්මවන්නේ නම් යෙදවුම් බද්දේ අතිරික්තය ආපසු නොගෙවිය යුතු නමුත් ඊළඟ බදු අය කළ හැකි කාලසීමාවේ නිමැවුම් බද්දට යනාදී වශයෙන් හිලව් කළ යුතු ය. එම අතිරික්තය පළමුවෙන් ඇති වූ කාලසීමාවේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත එසේ හිලව් නොකර ඇති ඒ අතිරික්තයේ යම් ශේෂයක් 58 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව ආපසු ගෙවිය යුතු ය. තවද එය එසේ ආපසු ගෙවා නැති අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් 59 වන වගන්තිය යටතේ නියමිත අනුප්‍රමාණයක් අනුව ඒ මුදල මත ඒ ආපසු ගෙවීම ඇතිවූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට මාස එකක් ගත වූ තැනින් ආරම්භව ආපසු ගෙවීමේ දිනයෙන් අවසාන වන කාලසීමාව සඳහා පොලිය ගෙවිය යුතු ය;

එසේ වුව ද බදු අය කළ හැකි කාලසීමාවක යම් මාසයක -

(අ) ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම්වල වටිනාකම, ඒ මාසය සඳහා වූ බදු අය කළ හැකි මුළු සැපයුම් ප්‍රමාණයෙන් සියයට පණහකට අඩු නොවූ අවස්ථාවක, ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම, බදු අයකළ හැකි මුළු සැපයුම් ප්‍රමාණයට දරන අනුපාතයට සමාන අනුපාතයක් දරන, (පූර්ව මාසයකින් ඉදිරියට ගෙන ආ යම් අතිරික්තයක්ද, ඇතුළුව) යෙදවුම් බද්දේ අතිරික්තයෙන් යම් කොටසක් ; හෝ

(ආ) මේ පනතේ උපලේඛනයේ (xxvi) හෝ (xxvii) ඡේදයාංකවල සඳහන් කාලය තුළ, 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ වන ඡේදයේ සඳහන් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ බදු අය කළ හැකි කාලසීමාවේ, ඒ මාසයේ යෙදුම් බද්දෙහි අතිරික්තයක් වේ නම්, ඒ අතිරික්තය

58 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අතිරික්තය ඇති වූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසුව මාස එකකට වඩා පසු නොවී ආපසු ගෙවනු ලැබිය යුතු ය. එම කාලසීමාව තුළ දී එකී අතිරික්තයේ කොටස ආපසු ගෙවීමට අපොහොසත් වූ අවස්ථාවක, ඒ අතිරික්තයේ කොටස ආපසු ගෙවීමට නියමිත දින සිට ඒ මුදල ගෙවනු ලබන දිනය දක්වා 59 වන වගන්තියෙන් නියම කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව වූ පොලියක් ද ඒ මත ගෙවනු ලැබිය යුතු ය.

(5) භාණ්ඩ හෝ සේවා සැපයීමට ආරෝපණය කළ හැකි යම් යෙදවුම් බද්දක් පහත දැක්වෙන දේ සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ අඩු නොකළ යුතු ය:-

(i) සැපයුම, මෝටර් සයිකල්, බයිසිකල්, සේවායෝජකයකු විසින් තම සේවා නියුක්තයන් ප්‍රවාහනය කිරීම සඳහා සපයා ඇති මෝටර් කෝච් රථ, සංචාරක ගමන් සඳහා හෝ සංචාරකයන් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන මෝටර් වාහන, කුලී මෝටර් රථ වශයෙන් හෝ යම් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන වාහන හැර වෙනත් මෝටර් වාහන සම්බන්ධයෙන් නම්;

(ii) ඒ භාණ්ඩ හෝ සේවා සැපයුම බදු අය කළ හැකි කටයුත්තකට සම්බන්ධ නැති නම්;

(iii) බදු ඉන්වොයිස් පත්‍රයකින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රේගු භාණ්ඩ ප්‍රකාශ පත්‍රයකින් හෝ වෙනත් සත්‍යායනය කරන ලද ලේඛනයකින් සැපයුම සනාථ කර නැත්නම්

23. සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම ඉන්වොයිස් පදනම මත බදු සඳහා ගිණුම් දැක්විය යුතු ය:

එසේ වුවද ලියාපදිංචි තැනැත්තකු විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත නියම කරනු ලැබිය හැකි කොන්දේසි මත ගෙවීමේ පදනමක් මත බදු සඳහා ගිණුම් දැක්වීම කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට විධාන කළ හැකි ය.

24. යම් බදු අය කළ හැකි කාලසීමාවක ගෙවිය යුතු බද්දේ ප්‍රමාණය නිශ්චය කිරීමේ දී, ලියාපදිංචි තැනැත්තකුගේ බදු අය කළ හැකි ක්‍රියාකාරකමෙහි ලා ඇති කර ගන්නා වූ ද ඒ බදු අය කළ හැකි කාලසීමාව ඇතුළත බොල් බවට පත් වූද යම් බොල් ණයක් සම්බන්ධයෙන් ඊට අනුරූප බදු ප්‍රමාණයක් අඩු කළ යුතු ය. අඩු කළ හැකි බද්දේ ප්‍රමාණය කපා හැරීමට ඇති බොල් ණය සම්බන්ධයෙන් කලින් බදු අය කළ හැකි කාලසීමාවක දී බදු වශයෙන් ගෙවූ ප්‍රමාණය නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද එසේ කපා හරින ලද බොල් ණයක් වෙනුවෙන් යම් බදු අය කළ හැකි කාලසීමාවක දී ඒ තැනැත්තාට යම් මුදලක් ලැබුණහොත්, 33 වන වගන්තියේ විධිවිධාන කුමක් වුව ද ලැබුණු මුදල එය ලැබුණු බදු අය කළ හැකි කාලසීමාවේ ලැබුණු බදු අය කළ හැකි සැපයුමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එය බද්දට යටත් විය යුතු ය.

25. (1) ලියාපදිංචි තැනැත්තකු බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කර වෙනත් ලියාපදිංචි තැනැත්තකුට කරන ලද සැපයුමක් මත බද්ද අඩුවෙන් අය කිරීමෙන් හෝ වැඩියෙන් අය කිරීමෙන් හෝ වැරදි බදු ප්‍රමාණයක් සඳහා ගිණුම් දක්වා ඇති අවස්ථාවක, එසේ අඩුවෙන් අය කරන ලද හෝ වැඩියෙන් අය කරන ලද බදු ප්‍රමාණය ගැලපීමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් ඒ අනික් තැනැත්තාට නිකුත් කිරීමට ඔහුට හිමිකම ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් සැපයුමක් වෙනුවෙන් ඒ නෝට්ටුව නිකුත් කළ කාලසීමාවට අදාළව නිකුත් කළ විට-

(අ) ගිණුම් පෙන්වන ලද ගණනට වැඩියෙන් ඒ සැපයුම වෙනුවෙන් අය කළ හැකි බද්දේ ප්‍රමාණය සැපයුම්කරු විසින් නිමැවුම් බදු වශයෙන් ගෙවිය යුතු ය. එසේ නැතහොත් නිමැවුම් බදු වශයෙන් ගිණුම් පෙන්වන ලද අය කළ හැකි බද්දට වැඩියෙන් වූ නිමැවුම් බද්ද සැපයුම්කරු විසින් යෙදවුම් බද්ද වශයෙන් අඩු කළ යුතු ය:

(ආ) ලැබුම්කරු විසින් ඔහු විසින් යෙදවුම් බද්ද වශයෙන් අඩු කරගත් මුදල අඩු කළ යුතුව තිබූ නිසි මුදලට වැඩි වන ප්‍රමාණය නිමැවුම් බද්ද වශයෙන් ගෙවිය යුතු ය. එසේ නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, අඩු කළ යුතුව තිබූ මුදලේ ඔහු විසින් අඩු කරගත් මුදලට වැඩි ප්‍රමාණය යෙදවුම් බද්ද වශයෙන් අඩු කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් බදු හර නෝට්ටුව හෝ බදු බැර නෝට්ටුව නියමිත ආකෘතියේ විය යුතු ය.

IV වන පරිච්ඡේදය
බදු ගෙවීම

26. (1) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද ඒ බදු අය කළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු ය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් බද්දක් එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා මේ පනතේ කාර්යය සඳහා ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද යම් බදු අය කළ හැකි කාලසීමාව සඳහා වූ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකම රුපියල් මිලියන පහක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් මුදලක් ඉක්මවන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි කාලසීමවට පසුව එළඹෙන සෑම මාසයේ ම කරන ලද බදු අය කළ හැකි සැපයුම් වෙනුවෙන් 22 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ගණන් බලන ලද බද්ද බදු අය කළ හැකි කාලසීමාවක් තුළ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකම රුපියල් මිලියන පහක් හෝ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් මුදල් ප්‍රමාණයක් ඉක්මවීම නතර වනතෙක්, ඊලඟ මාසයේ පහළොස්වන දින පසු නොවී ගෙවනු ලැබිය යුතු අතර එසේ ගෙවනු නොලැබූ යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, 21 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, බදු අය කළ හැකි යම් කාලසීමාවක පළමුවන හෝ දෙවන මාසය සඳහා යම් තැනැත්තකු විසින් වාර්තාවක් සපයා නොමැති අවස්ථාවක, ඒ මාසය සඳහා, ගෙවීම පැහැර හැර ඇති බද්ද, බදු අය කළ හැකි ඒ කාලසීමාව සඳහා ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

27. (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන්-

(අ) ගෙවීම පැහැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) ගෙවීම පැහැර ඇති මුදල් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම අරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ පහළොස් වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක ගෙවීම පැහැර හැර තිබෙන කාලසීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි පහළොස් වන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්,

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර ඇති බද්දෙන් සියයට සියයක් කවර අවස්ථාවක දී හෝ නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදු වී ඇති යම් විශේෂ කාරණා හේතු කොට ගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩු කිරීම කළ හැකි ය.

(2) VI වන පරිච්ඡේදය යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීම මත (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කරන ලද යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක ඒ මුදල හෝ මුදල් එසේ අඩු කරන ලද බද්ද මත ගණන් බැලිය යුතු ය.

V වන පරිච්ඡේදය
බදු තක්සේරු කිරීම

28. (1) තක්සේරුකරුවකුගේ මතය අනුව-

(අ) යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා වාර්තාවක් සැපයීම පැහැර හරින අවස්ථාවක : හෝ

(ආ) යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා වාර්තාවක් සපයන නමුත් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක : හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා සපයන ලද යම් වාර්තාවක යම් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා ගෙන් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින අවස්ථාවක.

තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවිය යුතුව තිබුණු බද්දේ ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ යුතු ය. යම් තැනැත්තකු සම්බන්ධයෙන් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එසේ තක්සේරු කරන ලද මුදල, ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා සඳහා ගෙවිය යුතු බදු මුදල වශයෙන් සැලකිය යුතු ය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා (1 වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවකින් ඒ තක්සේරු කරන ලද මුදල් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඔහුගෙන් අයවිය යුතු බදු මුදල වූවාක් සේ සලකා 27 වන වගන්තිය යටතේ දණ්ඩනයකට ඒ තැනැත්තාගේ බැඳීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

(3) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වාර්තාවක් නොසපයන ලද තැනැත්තකු විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවන ලද බදු මුදල තක්සේරුකරුගේ මතය අනුව, ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු නියම මුදලට වඩා අඩු වූ අවස්ථාවක, තක්සේරුකරුගේ විනිශ්චය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන දිනයකට පෙර, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(4) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා 26 වන වගන්තියේ විධිවිධාන පරිදි බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවීම පැහැර හරින ලද බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුනේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

29. යම් තැනැත්තකු විසින් 21 වන වගන්තිය යටතේ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් 28 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ 31 වන වගන්තිය යටතේ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් එම වාර්තාව පිළිනොගන්නේ ඇයි දැයි තැපෑලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැන්විය යුතු ය.

30. ලියාපදිංචි තැනැත්තකු විසින් බදු අය කළ හැකි සැපයුමක් සම්බන්ධයෙන් බදු ගෙවීම මග හැරීම සඳහා විවෘත වෙළෙඳ පොළේ වටිනාකමට අඩු වටිනාකමකට හෝ කිසිම වටිනාකමක් නොමැතිව සපයා ඇති බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, ඒ සැපයුමේ විවෘත වෙළෙඳපොළේ වටිනාකම ඔහු විසින් තීරණය කළ යුතු ය.

31. (1) බද්ද අය කළ හැක්කේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා විසින්, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා බද්ද වශයෙන් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඔහු විසින්, ගෙවිය යුතු හෝ ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා අයකර ගත හැකි නියම මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතුව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකට ද ඒ අතිරේක මුදල් ප්‍රමාණය එකී තැනැත්තාගෙන් අයවිය යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකි ය. තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලැබිය යුතු ය.

(2) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා නොගෙවා පැහැර හරින ලද බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ඒ බදු අය කළ හැකි කාලසීමාව

සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

32. මේ පනත යටතේ සපයන ලද හෝ කරන ලද යම් වාර්තාවක හෝ තක්සේරුවක පිටපතක් හෝ උද්ධෘතයක් යනුවෙන් අදහස් කරමින් කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන යටතේ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම සියලු අධිකරණවල ආවේශ්‍ය විය යුතු අතර එය මුල් ලේඛනය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

33. (1) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් ලියාපදිංචි තැනැත්තකු විසින් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක, හෝ ඒ කාල සීමාව සඳහා ඔහු තක්සේරු කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි තක්සේරුව කරනු ලැබුවේ හෝ වාර්තාව සපයනු ලැබුවේ යම් බදු අය කළ හැකි කාලසීමාවක් වෙනුවෙන්ද ඒ කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු තක්සේරුකරුවකු විසින් තක්සේරුවක්-

(අ) කරනු ලැබ නැති අවස්ථාවක තක්සේරුවක් කිරීම ; හෝ

(ආ) කරනු ලැබ ඇති අවස්ථාවක නම් අතිරේක තක්සේරුවක් කිරීම,

නීත්‍යානුකූල නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ගෙවිය යුතු බද්ද නිර්ණය කිරීම පිණිස අවශ්‍ය කරන්නා වූ සියලු වැදගත් වන කරුණු පිළිබඳව පූර්ණ හා සත්‍ය හෙළිදරව් කිරීමක් කිරීම යම් තැනැත්තකු විසින් සිතාමතා ම හෝ වංචනිකව පැහැර හැර ඇති බව තක්සේරුකරුගේ මතය වූ අවස්ථාවක තක්සේරුකරු විසින් තක්සේරුවක්-

(අ) කර නැති අවස්ථාවක, කවර හෝ වේලාවක තක්සේරුවක් කිරීම ; හෝ

(ආ) කර ඇති අවස්ථාවක, කවර හෝ වේලාවක අතිරේක තක්සේරුවක් කිරීම,

නීත්‍යානුකූල විය යුතු ය.

VI වන පරිච්ඡේදය
අභියාචනා

34. (1) මේ පනත යටතේ යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් කරනු ලද යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩනයක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තා අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම භාරදීමේ දිනයට පසු දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට විරුද්ධව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි ය. අභියාචනය කරනු ලැබුව ද මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද බද්ද ගෙවිය යුතු ය :

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුරවීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා අභියාචනයකට ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) සෑම අභියාචනයක් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද විටෙක නිසියාකාරව පිළියෙළ කරන ලද වාර්තාවක් සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් බදු අය කළ හැකි කාලසීමාවන් සඳහා වූ තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කරන සෑම තැනැත්තකු විසින් ම, (ඒ වන විටත් ඔහු විසින් එසේ කර ඇත්තේ නම් මිස) ඒ කාලසීමාව සඳහා ඔහු විසින් සපයා ඇති වාර්තාවේ පදනම මත ඔහු විසින් ගෙවිය යුතු බද්ද, ඒ තක්සේරු දැන්වීමේ දිනය තෙක් ඒ මත, එකතු වූ යම් දණ්ඩනයක් ද සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. තව ද ඒ ගෙවීම සනාථ කරනු පිණිස රිසිට්පතක් ඔහු විසින් අභියාචනා පෙත්සමට අමුණා තිබිය යුතු ය:

එසේ වුව ද ඒ තක්සේරු දැන්වීමේ කාලයේ දී හෝ ඊට ආසන්න කාලයේ දී අභියාචක විසින් විඳින ලද බලවත් මුදල් දුෂ්කරතා හේතු කොට ගෙන හෝ වෙනත්

සාධාරණ හේතුවක් කරණ කොට ගෙන අභියාචක ඒ බද්ද හෝ දණ්ඩනය ගෙවීමෙන් වළක්වා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වීමෙන් පසු ඒ බද්ද සහ ගෙවීමේ දිනය තෙක් ඒ මත එකතු වූ දණ්ඩනය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් දෙනු ලැබිය හැකි ය. ඒ දීර්ඝ කරන ලද කාලය තුළ දී ඉදිරිපත් කරන ලද රිසිට් පත මේ උපවගන්තියේ කාර්ය සඳහා අභියාචන පෙත්සමට අමුණන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(5) 1 වන, 2 වන, 3 වන හා 4 වන උපවගන්තිවලට අනුකූල නොවන සෑම අභියාචනයක් ම වලංගු නොවිය යුතු ය.

(6) වලංගු අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේ දී එකඟ වීමකට එළඹුණහොත් තක්සේරුව අවශ්‍ය පරිදි ගලපා ගත යුතු ය.

(7) (6) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(8) සෑම අභියාචකයකු ම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියෙහි පැමිණ සිටිය යුතු ය. පුද්ගලික හෝ බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචනයක විභාගය අඩාලව කල්තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා කල්පනා කරන්නේ නම්, තමා විසින් නියම කරනු ලැබූ වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය කලින් කල අඩාලව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාළව කල් තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, අඩාලව කල් තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණ සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ යම් අඩාලව කල් තැබූ විභාගයක් සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්තිසහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචනයේ විභාගයේ දී හෝ අඩාළව කල් තැබූ යම් අභියාචනයක විභාගයක දී ඔහු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබුයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකි ය.

තවදුරටත් එසේ වුව ද මේ පරිච්ඡේදය යටතේ වූ සෑම අභියාචනා පෙත්සමක් සම්බන්ධයෙන් ම ඒ අභියාචනය අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු විසින් හැර යම් තැනැත්තකු විසින් යම් ලේඛනයක් සැපයීම හෝ යම් ක්‍රියාවක් ගැනීම මත රැඳී ඇත්තේ නම් මිස, ඒ අභියාචන පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුනේ යම් දිනයක ද ඒ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත ඒ ගැන එකගත්වයට පැමිණීමට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කිරීම කරනු ලැබිය යුතු ය. ඒ කාලසීමාව තුළ දී ඒ අභියාචනය ගැන එකගත්වයට නොපැමිණ හෝ තීරණය කරනු නොලැබූ අවස්ථාවක, ඒ අභියාචනයට ඉඩ දෙනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර, බද්ද ඒ අනුව අයකරණු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ වූ යම් අභියාචනයක් ලැබුනු බව දන්වා සිටිය යුතු අතර, එසේ ලැබුණු බව දන්වා යැවූ ලිපියේ දිනය, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය. මෙම අතුරු විධානයේ කායඝ් සඳහා (4) වන උපවගන්තිය යටතේ බදු ගෙවීම සඳහා අභියාචකයකුට කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇති අවස්ථාවක, එම බදු ගෙවීම ඔප්පු කිරීම සඳහා වන රිසිට්පත ලැබුන දිනය, එම අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්තිසහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(10) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එසේ කිරීම අවශ්‍ය යයි සලකතහොත්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද ඒ දැන්වීමෙහි නිශ්චය කරනු ලබන්නා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, ගෙවීලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(11) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳව වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(12) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචනා කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීම පිළිබඳව අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

35. 34 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනවලට අදාළ ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වන අභියාචනයකට අදාළ විය යුතු ය.

36. (1) සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය:

එසේ වුව ද, අභියාචනාධිකරණයේ මතය සඳහා නීති ප්‍රශ්නයක් ගැන කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) අභියාචනාධිකරණය වෙත හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අදාළ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ අභියාචනයකට අදාළ විය යුතු ය.

VII වන පරිච්ඡේදය
තක්සේරුවල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සඳහා දණ්ඩන

37. බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ පනතේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, අභියාචනයේ දී අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව, ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

එසේ වුව ද, මේ වගන්තියේ කිසිවකින්, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙන් තක්සේරුකරුවකු වළක්වනු නොලැබිය යුතු ය.

38. යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවක දී, බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත බදු අය කළ හැකි සැපයුම සම්බන්ධයෙන් අයවිය යුතු බද්ද ලෙස ඔහු විසින් දැනටමත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ ද, තක්සේරුව 37 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ස්වකීය වාර්තාවේ බදු අය කළ හැකි සැපයුම එළිදරව් කිරීමේ දී වංචාවක් හෝ ඕනෑකමින් ම පැහැර හැරීමක් සිදුවී නොමැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් විසිපන් දහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් හිමිකම් පා සිටින මුළු බද්ද සහ වාර්තාව මත ගෙවනු ලබන බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

VIII වන පරිච්ඡේදය
බදු අයකර ගැනීම

39. (1) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා "බද්ද" යන්නට මේ පනත යටතේ පනවන ලද හෝ දරන ලද යම් දණ්ඩනයක් ද ඇතුළත් වේ.

(2) 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ සහතිකයක් හෝ 44 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන කවර හෝ අවස්ථාවක, පැහැර හැරි තැනැත්තා වෙත ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය : එහෙත් පැහැර හැරි තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

40. ගෙවීම් පැහැර හරිනු ලැබූ යම් බද්දක් පැහැර හැරිය තැනැත්තාගේ සියලු ම චංචල හා නිශ්චල දේපළ...

එසේ වුව ද-

(i) 42 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හැරිය තැනැත්තා විසින්, වටිනාකම සඳහා සද්භාවයෙන් මිල දී ගන්නකුට විකුණන ලද යම් වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතු ය : නැතහොත් බල නොපෑ යුතු ය :

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, දේපළ තහනම් කරන ලද දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් බද්දට නොලැබිය යුතු ය : තව ද,

(iii) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, බදු අය කළ හැකි කාල සීමාවන් හතරකට වැඩි කාලයක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගතයුතු බදු අය කළ හැකි කාලසීමාවන් හතරක් පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කර ගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

41. (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට පෙර-

(අ) ඒ බද්දේ විස්තර ; සහ

(ආ) ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව

සඳහන් කරමින් පැහැර හැරිය තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) පැහැර හරිනු ලැබ ඇති බද්ද පැහැර හැරිය තැනැත්තා මත කරන ලද තක්සේරුවක් සම්බන්ධයෙන් නම්, සහ පැහැර හැරිය තැනැත්තා විසින් ඒ තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති නම් පැහැර හැරිය තැනැත්තා විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අය කරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තවද, 37 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

42. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ කාර්යයන් සඳහා බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ ලිපිනය ද ඇතුළත් සහතිකයක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා වෙත හෝ පිස්කල්වරයකු වෙත හෝ නියෝජ්‍ය පිස්කල්වරයා වෙත හෝ බදු එකතු කරන්නකු වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැරිය තැනැත්තාගේ චංචල දේපල තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් බද්ද අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය ලැබූ නිලධරයාට මෙයින් බලය පවරා එසේ කරන ලෙසද නියම කරනු ලැබේ.

(3) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා කල්පනා කරන ආකාරයකට 2 වන උපවගන්තියේ සඳහන් එකී තහනම සිදු කළ යුතු අතර එලෙස තහනමට ගත් දේපළ, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම් හා ගාස්තු ගෙවීමට යටත්ව, දින හතක කාලයක් තබා ගත යුතු ය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින හත ඇතුළත ගාස්තු සහ අයකිරීම් ද සමග නොගෙවුවහොත් ප්‍රාදේශීය ලේකම්වරයා, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා, පිස්කල්වරයා, නියෝජ්‍ය පිස්කල්වරයා හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(4) ඒ විකිණීමෙන් ලැබෙන මුදල්-

(1) පළමුව දේපළ තහනම් කිරීමේ , තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා අය කිරීම් ගෙවීම සඳහා ද;

(11) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද යෙදිය යුතු ය. ශේෂයක් වෙතොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(5) තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබුව ද මේ වගන්තිය යටතේ පැහැර හැරිය තැනැත්තකුට විරුද්ධව නඩු කටයුත්තක ද බදු එකතු කරන්නකු විසින් දරන ලද යුක්ති සහගත වියදම්, ඔහු විසින් යම් පැහැර හැරිය තැනැත්තකුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. මුදල් තහනමට ගනු ලැබූ අවස්ථාවක, එවැනි යුක්ති සහගත වියදම් එසේ තහනමට ගනු ලැබූ මුදලින් පළමුව හිලව් කරනු ලැබිය යුතු ය.

(6) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරිය තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින් ද ඒ තැනැත්තා ගේ හෝ තැනැත්තන් ගේ නම සහ ලිපින නැතහොත් නම් සහ ලිපිනයන් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින් ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල්වරයා සලකන ඉන් යම් කොටසක් හෝ ත.හනම් කොට විකිණීමට බලයදෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්තිවල විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපළ" යන්නට පිරියත සහ යන්ත්‍ර ඇතුළත් විය යුතු ය.

43. (1) නොගෙවා පැහැර හැරිය බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරි තැනැත්තාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරි තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ යුතු වරදක් සඳහා ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට, එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය.

එසේ වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් සලකා බැලීම, විභාග කිරීම හෝ තීරණය කිරීම සඳහා මේ වගන්තියෙහි කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හැරි තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා පැහැර හැරි තැනැත්තා බන්ධනාගාරගත කිරීමකට නියම කරනු ලැබුවා වූ යම් අවස්ථාවක ඒ දඩ මුදල ගෙවීම සඳහා මහේස්ත්‍රාස්වරයා විසින් කල් දිය හැකිය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකිය.

(4) (1) වන උප වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උප වගන්තිය යටතේ කල් දීමෙහි හෝ (3) වන උප වගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල්දීමෙන් වූ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකිය. තවද පැහැර හැරිය තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

(5) (3) වන උපවගන්තිය යටතේ ගෙවීම් වාරික මගින් ගෙවීමට නියම කරනු ලැබ තිබියදී ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියළුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකිය.

44. (1) යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා පැහැර හැර ඇත්තාවූද -

(අ) යම් තැනැත්තෙකු, පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම් ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ආ) යම් තැනැත්තෙකු, පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා නැතහොත් ඔහු වෙනුවෙන් මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඇ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙන යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් තැනැත්තෙකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඇ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන් කිසි තැනැත්තෙකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූද අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපැලෙන් යැවිය යුතුය.) ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දිය හැකිය. ඒ දැන්වීම ලැබූ දිනයෙහි දී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල් වලට ද දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සුදානම් වන හෝ සියලු මුදල් වලටද ඒ දැන්වීම අදාළ විය යුතුය.

(2) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ ද සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තවද යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකගවීමක කවර විධිවිධානයක් තිබුණ ද සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු වල දී ඒ ගෙවීම සම්බන්ධයෙන් වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ .

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දැන්වීමක් දෙනු ලැබූ අවස්ථාවක (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත් වීමෙන් දින දහහතරක් ඇතුළත ඒ කරුණු දන්වා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ අවස්ථාවක (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද, අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩු කරගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකිව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත්වීමෙන් දින දහ හතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ තැනැත්තා ද ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ අනෙක් ප්‍රධාන නිලධරයා ද, අඩු කර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පෞද්ගලිකව වගකිව යුතු ය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ සෑම මාර්ගයකින්ම අවස්ථාවෝචිත පරිදි ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අය කරගත හැකි ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ අනුයෝජිතයකු ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතු විය හැකිව තිබූ බද්ද ගෙවීමට පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද එබඳු අවස්ථාවකට එම විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා (1) වන උප වගන්තියේ "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමෙන් -

(අ) නැසීගිය තැනැත්තකුගේ පොල්මාකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු;
හෝ

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාර ගන්නා හෝ එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රායි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ නැතැත්තෙක්

අදහස් වේ.

45. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, එකී බද්දේ විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන ආකාරයට ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහේස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරන වේලාවෙහි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනය පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ ලියාපදිංචි කරනු ලැබූ ලිපියක් තැපැලෙන් යැවීමෙන් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි යම් නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බදු ගෙවූ බවට හෝ බදු ගෙවීම සඳහා ඇප තැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම නැතහොත් පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ බදු මුදල් ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතු ය.

(4) යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

46. මේ පනත යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු සම්පූර්ණ බද්ද මේ පනතේ සලසා ඇති විධිවිධාන එකක් යටතේ අයකර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස් ජනරාල් වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් 43 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණ ද ඒ නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අය කර ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

47. යම් තැනැත්තකුගෙන් අය විය යුතු බද්ද අයකර ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල් වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඕනෑම තැනැත්තකු වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

48. (1) ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට කලින් සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් විසින් යම් බද්දක් ගෙවා නොමැති අවස්ථාවක ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ පැහැර හැරීම සඳහා ඒ නිලධරයා වගකිව යුතු වුව ද නොවුව ද ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයේ කළමනාකරුවකුට, අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයාට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකුට විරුද්ධව මේ පරිච්ඡේදයේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට කලින්, හවුල් ව්‍යාපාරයක් හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් විසින් බද්ද ගෙවා නොමැති අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද ඒ පැහැර හැරීම සඳහා ඒ තැනැත්තා වගකිව යුතු වුව ද නොවුව ද යම් හවුල්කරුවකුට හෝ ඒකාබද්ධ ව්‍යාපාරයේ යම් සාමාජිකයකුට විරුද්ධව මේ පරිච්ඡේදයේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

49. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනැමුණු හෝ පැවරුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවකු විසින් ම ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව යටත්ව කරනු ලැබිය යුතු ය.

IX වන පරිච්ඡේදය
විශේෂ අවස්ථා

50. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්‍යතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍යතාවට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය.

51. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක දී ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ කොටස්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ ඔහු සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

52. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය:

එසේ වුව ද සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනත යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මන්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකුම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය අනුව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියාකළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔප්පු කරතහොත්, මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

53. (1) මින් මතු සලසා ඇති ඇති විධිවිධානවලට යටත්ව, බදු අය කල හැකි කාලසීමාවක් තුළ දී බද්ද අය කළ හැකි වූ තැනැත්තකු, ඒ බද්ද අය කළ හැකි වනුයේ යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් අවසන් කරන අවස්ථාවක, බදු අය කළ හැකි ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණා ද, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ දී ඔහු ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් පවත්වා ගෙන ගිය කාලසීමාව සඳහා ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටිය යුතුය.

(2) බදු අය කළ හැකි ක්‍රියාකාරකම් පවත්වා ගෙන යන යම් තැනැත්තකු විසින්, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් යම් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක අයිතිය වෙනස්වීමේ ප්‍රතිඵලය ඇති වන පරිදි වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරුමට පෙරාතුව වූ කාලසීමාව සඳහා ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ යම් බද්දක් ඒ පැවරුම්කරුගෙන් අය කර ගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ තිබන ද පැවරුම්ලාභියාගෙන් අය කර ගත හැකි වන අතර, බද්ද එකතු කිරීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

54. (1) බද්ද අය කළ හැකි වූ යම් තැනැත්තකු මියයන අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව වූ සියලු ම බදු අය කළ හැකි කාලසීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කළ හැකි වූ බද්ද ඒ තැනැත්තාගේ පොල්මා:කරුගෙන් අය කරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා, ජීවත්ව සිටියේ නම් මේ පනත යටතේ වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේවල් සම්බන්ධයෙන් ද වගකිව යුතු ය.

එසේ වුව ද, -

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මා:කරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය;

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදු වූ දිනට පෙරාතුව වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන්, මරණය සිදු වූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු තුනකට පසුව කිසිදු තක්සෙරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය ; සහ

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මා:කරුගේ වගකීම -

(i) මේ වගන්තිය යටතේ බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට පොල්මා:කරුට දැන්වීම් දෙනු ලබන දිනය වන විට ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවැති මිය ගිය තැනැත්තාගේ බුදලේ ප්‍රමාණයට : සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ බුදලයේ යම් කොටසක ප්‍රමාණයට සීමා විය යුතු ය.

(2) පොල්මා:කරුවකු විසින් මියගිය තැනැත්තකුගේ බුදලය වෙනුවෙන් ඒ බුදලයේ කොටසක් වන යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කර ගත හැකිව තිබුණු බද්ද, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, ඒ පොල්ම කරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

55. බද්දක් ගෙවිය යුතු යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් යම් තැනැත්තකු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජිත වශයෙන් පවත්වා ගෙන යනු ලබන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන්, මේ පනත යටතේ පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අය කළ යුතු ආකාරයට ම හා ප්‍රමාණයට ම, බද්ද අය කර ගත යුතු ය.

56. තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ මිය ගිය තැනැත්තකුගේ බුදලයේ පොල්මා:කරුවන්ගේ තත්ත්වයෙහිලා හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ පනත යටතේ ඔවුන්ගේ අය කල හැකි වන බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකි වන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

57. 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන් වුව ද, සමාගමක් ඈවර කරනු ලබන අවස්ථාවක හා ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් බද්දක් අයකර ගත නොහැකි වූ අවස්ථාවක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකු ම බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දළ නොසැලකිල්ලට, ව්‍යතික්‍රමයකට හෝ යුතුකම් පැහැර හැරීමකට පැවරිය නොහැකි බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධ හා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු වන අතර, බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

X වන පරිච්ඡේදය
බදු ආපසු ගෙවීම

58. (1) යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසන් වී අවුරුදු තුනක් ඇතුළත ලියාපදිංචි තැනැත්තකු විසින් වැඩිපුර ගෙවා ඇති යම් බදු මුදලක් හෝ දඩ මුදලක් ආපසු අයකර ගැනීම සඳහා ඉල්ලුම් කරමින් එම කාලසීමාව සඳහා ගෙවීමට තමා යටත්ව සිටි මුදලට වඩා වැඩි මුදලක් ඒ තැනැත්තා විසින් බදු

වශයෙන් හෝ දඩ මුදලක් වශයෙන් ගෙවා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරයි නම්, (3) වන උපව ගන්තියේ විධිවිධානවලට යටත්ව, බදු අය කළ හැකි කාලසීමාව තුළ දී වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු ලබා ගැනීමට එම තැනැත්තාට හිමිකම් ඇත. :

එසේ වුව ද තවදුරටත්,

(i) අපනයනකරුවකු හෝ

(ii) 21 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (111) වන ඡේදයේ සඳහන් යම් ලියාපදිංචි තැනැත්තකුට,

ඉල්ලීම ලැබීමෙන් දින තිහක කාලයක් ඇතුළත වැඩිපුර ගෙවා ඇති බදු මුදල හෝ දඩ මුදල ආපසු ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හිමිකම්පෑමක් කිරීමට හිමිකම් ඇති ලියාපදිංචි කළ තැනැත්තකුට මරණය, අශක්‍යතාව, බුන්වත් බව, ඈවර කිරීම හෝ වෙනත් හේතුවක් නිසා, හිමිකම්පෑමක් කිරීමට නොහැකි වූ අවස්ථාවක, (1) වන උපවගන්තියේ අර්ථානුකූලව වැඩිපුර ගෙවා ඇති යම් බදු මුදලක් හෝ දඩ මුදලක් ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ බූදලයේ වාසිය සඳහා ආපසු ලබාගැනීමට, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ පොල්මංකරුට, භාරකරුට හෝ දේපළ ලබන්නාට හිමිකම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද -

(අ) යම් ලියාපදිංචි කළ තැනැත්තකු විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් හෝ බදු අය කල හැකි කාල සීමාවක මාසයක් වෙනුවෙන් වූ යම් බද්දක් නියමිත දිනයට කලින් මුළු ප්‍රමාණයම හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීම පැහැරහැර ඇති අවස්ථාවක, ඒ තැනැත්තාට නිසි දැන්වීම කිරීමෙන් පසු, ඒ නොගෙවා ඇති බද්දට එරෙහිව, ඒ තැනැත්තාට අන්‍යාකාරයෙන් ආපසු ගෙවිය යුතු යම් මුදලක් හෝ යම් මුදලක කොටසක් හෝ 59 වන වගන්තිය යටතේ ගෙවිය යුතු පොලී මුදලක හෝ පොලී මුදලක යම් කොටසක් හිලව් කරනු ලැබිය හැකි අතර එසේ හිලව් කරන ලද යම් මුදලක් ඒ ලියාපදිංචි කළ තැනැත්තාගෙන් ලැබුණු ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

(ආ) ලියාපදිංචි කළ යම් තැනැත්තකු විසින් බදු ගෙවිය හැකි යම් කාලසීමාවක් හෝ බදු ගෙවිය හැකි කාලසීමාවක යම් මාසයක් වෙනුවෙන් වූ වාර්තාවක් බදු අය කළ හැකි යම් කාලසීමාවක හෝ බදු අය කළ හැකි කාලසීමාවක යම් මාසයක සපයා නොමැති අවස්ථාවක, ඒ ලියාපදිංචි කළ තැනැත්තා විසින් ඒ වාර්තා සපයන තෙක්, අන්‍යාකාරයෙන් ආපසු ගෙවිය යුතු යම් මුදලක් හෝ මේ පනතේ 59 වන වගන්තිය යටතේ ගෙවිය යුතු පොලියක යම් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවීම කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හිටුවනු ලැබිය හැකි ය.

59. (1) මේ පනත යටතේ ලියාපදිංචි කළ තැනැත්තකුට ආපසු ගෙවිය යුතු යම් මුදලක් ඒ ආපසු ගෙවීම කළ යුතු නියමිත දිනයේ සිට දින තිහක කාලයක් ඇතුළත ආපසු ගෙවා නොමැති අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියමිත දිනයේ සිට තිස් වන දිනයෙන් ආරම්භව, මේ පනත යටතේ ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් ආපසු ගෙවීමට නියම කරනු ලැබ ඇති මුදල ආපසු ගෙවන දිනය තෙක්, එම ප්‍රමාණය මත කලින් කල අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණයන් අනුව පොලිය ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "නියමිත දිනය" යන්නෙන් -

(i) අභියාචනය කරනු ලැබූ තක්සේරුව සම්බන්ධයෙන් තක්සේරුකරු සමග එකගත්වයකට පැමිණි දිනයේ සිට හෝ අභියාචනය නිශ්චය කරනු ලැබූ දිනයේ සිට : හෝ

(ii) 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ලියවිල්ලකින් කරන ලද ආපසු ගෙවීමක් සඳහා වූ හිමිකම්පෑමක් නොවන, ඒ තැනැත්තාගෙන් ලියවිල්ලකින් වූ හිමිකම්පෑමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දිනයේ සිට

දින අනූවකින් අවසන් වන කාලසීමාව අදහස් වේ.

XI වන පරිච්ඡේදය
ගෙවීම් වලින් බද්ද අඩු කිරීම

60. (1) ගිවිසුමට එළැඹියේ නියමිත දිනයට පෙර වුව ද, නොවුව ද, යම් තැනැත්තකු විසින් තමා පාර්ශ්වයක්ව සිටින්නා වූ ගිවිසුමක් ප්‍රකාර හෝ ගිවිසුමකට පාර්ශ්වයක් වන්නා වූ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ ගිවිසුම ප්‍රකාර හෝ යම් ගෙවීමක් කරන ලද අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණයකට, ඒ ගෙවීමේ ප්‍රතිශතයක් විය යුතු බද්දක්, ඒ ගෙවීම කරන සෑම තැනැත්තකු විසින් ම ඒ ගෙවීමෙන්

අඩු කර ගනු ලැබිය යුතු ය. තවද එසේ අඩු කර ගන්නා ලද බදු මුදල ඒ තැනැත්තාගෙන් ජනරජයට අය විය යුතු ණයක් විය යුතු අතර, ඒ ණය මුදල වහා ම අය කර ගනු ලැබිය හැකි විය යුතු ය. නැතහොත් ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් වේ ද ඒ බද්දට අමතරව ඒ ණය මුදල තක්සේරු කර ඒ තැනැත්තාගෙන් අය කර ගත හැකි ය.

එසේ වුව ද, ඒ ගිවිසුම ඉටු කිරීමෙහි ලා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව රුපියල් ලක්ෂ දහයක් නොඉක්ම වන්නේ නම් එවැනි අඩු කිරීමක් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව බද්ද අඩු කර ගනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින්-

(අ) ඒ අඩු කර ගනු ලැබීම කරන ලද්දේ යම් තැනැත්තකුගේ ගෙවීමකින් ද ඒ තැනැත්තාට-

(i) එසේ ගෙවන ලද දළ මුදල් ප්‍රමාණය ;

(ii) එසේ අඩු කර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය ; සහ

නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල

දක්වෙන ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අඩු කර ගැනීම කරනු ලැබ දින හතක් ඇතුළත එසේ අඩු කර ගන්නා ලද මුදල-

(i) ගෙවීම කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය සහ ඇත්නම් ලියාපදිංචි අංකය ;

(ii) එසේ ගෙවන ලද දළ මුදල් ප්‍රමාණය ;

(iii) එසේ අඩු කර ගන්නා ලද බදු අනුප්‍රමාණය සහ බදු මුදල් ප්‍රමාණය ;

(iv) නියම වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල ; සහ

(v) ගෙවනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය සහ ලියාපදිංචි අංකය

දැක්වෙන ප්‍රකාශයක් සමග කොමසාරිස් ජනරාල්වරයාට යවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව බද්ද අඩු කර ගන්නා ලද්දේ යම් මුදලකින් ද ඒ මුදල යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි සැපයුමට ඇතුළත් වන අවස්ථාවක, (2) වන උපවගන්තියට අනුකූලව ඒ මුදල සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් ඒ අඩු කර ගන්නා ලද බදු මුදල වශයෙන් ඒ ප්‍රකාශයේ දක්වා ඇති මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු බද්දට හිලව් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, "ගිවිසුම" යන්නෙන් -

(i) සේවා නියුක්ති ගිවිසුමක් නොවන, කවර වූ හෝ ස්වභාවයක ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් වූ යම් ගිවිසුමක් ; හෝ

(ii) (i) ඡේදයේ සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ බඩු සහ සේවාවන් සැපයීම සඳහා වූ ගිවිසුමක් ; හෝ

(iii) (i) වන හෝ (ii) වන ඡේදවල සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක් ; හෝ

(iv) ප්‍රසංගකරුවකුගේ හෝ කලාශිල්පියකුගේ සේවාවන් සැලසීම සඳහා වූ ගිවිසුමක් ඇතුළු එහෙත් සේවා නියුක්ති ගිවිසුමක් නොවන සේවය සැලසීම සඳහා වූ යම් ගිවිසුමක් ; හෝ

(v) සිනමා ටෝග්‍රාප් සේවා පට සැපයීම සඳහා වූ යම් ගිවිසුමක්

අදහස් වේ.

(5) (1) වන උපවගන්තිය අනුව බද්ද අඩු කර ගැනීම පැහැර හරින හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත යම් බද්දක් (2) වන උපවගන්තිය යටතේ යවනු

ලැබීම පැහැර හරින හෝ යම් තැනැත්තකු ගෙවීම පැහැර හරින ලද සේ සලකනු ලැබිය යුතු අතර බදු අයකර ගැනීමට අදාළ වන්නා වූ මේ පනතේ විධිවිධාන එවැනි පැහැර හැරීමක් සම්බන්ධයෙන් ඒ ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් අඩු කිරීමක් හෝ (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් ප්‍රේෂණයක් හෝ සිදුකර ඇති යම් තැනැත්තෙක්, බදු ගෙවිය යුතු වූ තැනැත්තාගේ හෝ අදාළ සියලු තැනැත්තන්ගේ බලය යටතේ ක්‍රියා කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟතාවක කුමක් සඳහන් වුව ද, ඒ තැනැත්තා ඒ අඩු කිරීම හෝ ප්‍රේෂණය සම්බන්ධයෙන් සියලු අපරාධ හෝ සිවිල් නඩු කටයුතු වලට එරෙහිව වගකීමෙන් මෙයින් නිදහස් කරනු ලැබේ.

(7) යම් තැනැත්තකු ගිවිසුම් දෙකකට හෝ රට වැඩි ගණනකට ඇතුළත් වී සහ ඒ ගිවිසුම්වල ස්වභාවය හා ඒවායේ පාර්ශ්වකරුවන් සැලකිල්ලට ගෙන ඒ ගිවිසුම් සම්බන්ධයෙන් ගෙවීම් කරනු ලැබුවේ කවර තැනැත්තන්ට ද ඒ තැනැත්තන් එකම සහ එක් තැනැත්තකුගේ ඔහුගේ අනුයෝජිතයා බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, ගෙවන ලද හෝ ගෙවිය යුතු මුදල (1) වන උපවගන්තියේ කාර්යය සඳහා සමුහණය කරනු ලැබිය යුතු ය.

XII වන පරිච්ඡේදය
විවිධ කරුණු

61. (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවකු විසින් දිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමකම කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබුණහොත්, වලංගු විය යුතු ය.

(2) මේ පනතේ බලය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළ වන කාලසීමාව ඇතුළත ඔහු බදු අය කළ හැකි ක්‍රියාකාරකමෙහි නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාර දීමෙන් නැතහොත් තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාර දිය හැකි ය.

(3) තැපෑලෙන් යවනු ලැබූ සෑම දැන්වීමක් ම, තැපෑලට ගත වන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපෑලෙන් භාරදීම ඔප්පු කිරීමේ දී දැන්වීම් ඇතුළත් ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(5) මේ පනතේ කාර්යය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ, අත්සන් කර හෝ තිබේ ද, නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේ ද ඒ සෑම නමක් ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

62. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක්, එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන තැනැත්තා, පොදු අධ්‍යාශයට හෝ වැටහීමට අනුව ඒ දැන්වීමෙහි, තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කටයුත්තෙහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිශ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම බදු අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි භාර දී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමෙහි සඳහන් කර ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක්-

(අ) බදු අයකර ගනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකමේ ප්‍රමාණය හෝ අයකළ හැකි බදු ප්‍රමාණය පිළිබඳව හෝ යම් වරදක් ඒ තක්සේරුවෙහි තිබීම ; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් මත රට විරුද්ධ නොවිය යුතු ය.

63. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය:-

(අ) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ කටයුත්ත අදාල වන්නේ යයි ඔහු අදහස් කරන ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම එවැනි ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලිය කියවිලි සොයාගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම :

(ආ) එවැනි ගිණුම් පොත්, ලේඛණ, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ එවායේ හඳුනාගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම :

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුත්තකට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තව ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම් වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ සෝදිසි කිරීම් වලට ද හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

මේ උපවගන්තියෙහි "සාම නිලධරයා" යන්නෙහි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිළධරයකුට බලය දීමට පෙර ඒ නිළධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වීමට තුඩුදුන් හේතු කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තාගත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් තම සන්තකයට ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අවශ්‍ය තාක් කල් ඒ නිලධරයාගේ සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

64. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය :-

(අ) මෙම පනතේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේදැයි තීරණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් බදු අය කල හැකි ක්‍රියාකාරකමක් පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම .

(ආ) එහි දී සොයාගනු ලැබිය හැකි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහිදී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම .

(ඇ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම හා පිටපත් හෝ උධෘත ගැනීම :

(ඈ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් සන්තකයට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම :

(ඉ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන් කොට ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම :

(ඊ) මේ පනත යටතේ වූ කරුණු සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් සැපයීමට බලය ඇති යම් තැනැත්තකු ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ සිට සොයා ගනු ලැබූ විට, තමා දන්නා ඒ තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම :

(උ) තමා යෝග්‍ය යයි අදහස් කරන පරිදි, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී මේ පනතේ කරුණු සම්බන්ධයෙන් එබඳු ස්ථානයක් හෝ ගොඩනැගිල්ලක සිට තමා විසින් සොයා ගනු ලැබූ සෑම තැනැත්තකු ම පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම්ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල ඒ නිලධරයා සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

65.(1) බදු ගෙවීමට ඇති වගකීම කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකුට දැන ගැනීමට හැකිවන පරිදි සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම කරගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අයකළ හැකි කටයුතු සම්බන්ධයෙන් වාර්තා තබා ඒවා පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තබාගත යුතු වාර්තාවල ආකෘති පත්‍ර සහ ඒවායේ දැක්විය යුතු විස්තර නියම කරනු ලබන පරිදි විය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "වාර්තා" යන්නට -

(අ) ලැබීම හෝ ආදායම හෝ වියදම සටහන් කර ඇති (අතින් ලියන ලද හෝ යන්ත්‍රානුසාරයෙන් යුක්ත වූ හෝ විද්‍යුත් ආකෘතියක ආකාරයට වූ නැතහොත් ඒවායේ සංයෝජකයන් වන්නා වූ) ගිණුම් පොත් ඇතුළත් වන අතර, වවුචර්, බැංකු ප්‍රකාශ, ඉන්වොයිස් පත්‍ර, බදු ඉන්වොයිස් පත්‍ර, බදු බැර සටහන් නෝට්ටු, බදු හර සටහන් නෝට්ටු, ලදුපත් සහ එවැනි ගිණුම් පොත්වල සටහන් සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ලියකියවිලි ද

(ආ) යම් භාණ්ඩ තොග තබා ඇත්තේ අවස්ථාවෝචිත පරිදි යම් ගුදමක, ගබඩාවක හෝ වෙනත් යම් ස්ථානයක ද එම ගුදම, ගබඩාව හෝ වෙනත් යම් ස්ථානය පිළිබඳ විස්තර හා ඒවායේ ඇති තොග පිළිබඳ විස්තර;

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව පවත්වා ගැනීමට හෝ තබා ගැනීමට නියමිත යම් ලැයිස්තුවක් හෝ වාර්තාවක් ; ඇතුළත් වේ.

XIII වන පරිච්ඡේදය
වැරදි සහ දණ්ඩන

66.(අ) 72 වන වගන්තිය රහස්‍යභාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටියදී එසේ දිවුරුම් දීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) 72 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කටයුතු කරන්නා වූ ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන වලින් යම් විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ පොළඹවන්නා වූ ;

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක්, නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

67.(අ) මේ පනතේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් හෝ අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ; හෝ

(ආ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ ;

(ඇ) මේ පනත යටතේ යම් අසත්‍ය වාර්තාවක් සපයන්නා වූ හෝ මේ පනත යටතේ සපයනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ

සහ එමගින් බදු ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකුට ඒ බදු ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට හෝ ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට -

(1) වරද කරනු ලැබුවේ යම් බදු අය කළ යුතු කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ බදු අය කළ යුතු කාලසීමාව සඳහා අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ යටත්ව සිටින්නා වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත්කළා වූ ද බදු ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලින් ; සහ

(ii) රුපියල් විසි පන්දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයට බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

68. දැන දැනම -

(අ) 1 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම පැහැර හරින්නා වූ : හෝ

(ආ) 19 වගන්තිය යටතේ දැනුම්දීමට නියමිත ඇනැම් කරුණු කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම පැහැර හරින්නා වූ : හෝ

(ඇ) 20 වන වගන්තිය මගින් නියමිත පරිදි බදු ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීම පැහැර හරින්නා වූ : හෝ

(ඈ) බදු අය කළ හැකි සැපයුමක් සඳහා බදු ඉන්වොයිස් පත්‍ර එකකට වැඩි ගණනක් නිකුත් කරන්නා වූ : හෝ

(ඉ) 20 වන වගන්තිය යටතේ ඒ බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් නැති අවස්ථාවක බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ : හෝ

(ඊ) 21 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීම හෝ 21 වන වගන්තිය යටතේ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ : හෝ

(උ) 21 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් මෙම පනත යටතේ නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම සැහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ : හෝ

(ඌ) බද්දට තමා යටත්වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සපයන්නා වූ : හෝ

(එ) 44 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් කොමසාරිස් ජනරාල්වරයාට හැර වෙනත් යම් තැනැත්තකුට ගෙවීමට අවසර දෙන්නා වූ : හෝ

(ඒ) 60 වන වගන්තිය යටතේ නියමිත යම් අඩු කිරීමක් කිරීමට පැහැර හරින හෝ 60 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ : හෝ

(ඔ) 63 වන වගන්තිය හෝ 64 වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට සිතා මතා බාධා කරන හෝ ඔවුන් ප්‍රමාද කරන්නා වූ : හෝ

(ඕ) 65 වන වගන්තියෙන් නියමිත වාර්තා පවත්වාගෙන යාම පැහැර හරින්නා වූ : හෝ

(ක) මේ පනත යටතේ ලියාපදිංචි නොවුණු තැනැත්තකු වශයෙන් බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ

යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

69. මේ පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතු ය.

70. මේ පනත යටතේ වූ වරදක් සිදු කරන ලද්දේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද ඒ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් පාර්ශවයන්ගේ කැමැත්ත ඇතිව මේ පනත යටතේ ඒ වරද සඳහා පැනවිය හැකි උපරිම දඩ මුදලින් තුනෙන් එකක් නොඉක්මවන මුදලක් සඳහා ඒ වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කිරීමෙන් කොමසාරිස් ජනරාල්වරයාට ලැබුනා වූ මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

XIV වන පරිච්ඡේදය
පරිපාලනය

71. (1) අවශ්‍ය විය හැකි දේශීය ආදායම් කොමසාරිස්වරුන්, දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරුන්, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්, දේශීය ආදයම් තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් බදු නිලධරයන් සංඛ්‍යාවකගේ සහාය ඇතිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මේ පනතේ පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ ,නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් කොමසාරිස්වරයකුට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට බලය පවරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කරන දේශීය ආදායම් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට, ඒ කොමසාරිස්වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට බලය දෙනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ යම් විධිවිධානයක් මගින් තක්සේරුකරුවකු වෙත, පවරනු ලැබූ නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ හෝ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් දේශීය ආදායම් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කිරීම ද, ඉටු කිරීම ද කරනු ලැබිය හැකි ය.

72. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයේ නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හාර ආරක්ෂා කිරීමෙහිලා සහාය වීම කළ යුතු ය. තව ද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හැර, වෙන යම් තැනැත්තකුට එවැනි යම් කරුණක් නොදැන්විය යුතු අතර කොමසාරිස් ජනරාල් වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට අවසර දීම හෝ ඉඩ හැරීම නොකළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් හා මුදල් විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරයකු ඉදිරිපිට දී රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක් හෝ ලේඛනයක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ යම් කාරණයක් හෝ දෙයක් අධිකරණයට හෙළිදරව් කිරීමට නැතහොත් දැක්වීමට හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනුලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ හෝ එවැනි වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය නම්, ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට දැනුම් දීම කළ හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇත ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක් හෝ ලේඛනයක පිටපතක්, එය සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබූ මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය :

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය :

එසේ ම තවදුරටත් එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කරන ලෙස කවර හෝ අවස්ථාවක දී කොමසාරිස් ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්යය කිරීමට අවශ්‍ය විය හැකි යම් වාර්තා හෝ ලේඛන ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දිය හැකි ය. විගණකාධිපතිවරයා හෝ මේ උපවගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන් මෙම වගන්තියෙහි (2) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, රේගු ආඥා පනත හෝ සුරාබදු ආඥාපනත හෝ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වරදක් කර ඇති බව මේ පනත යටතේ තමාගේ කාර්යය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණායකින් කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, ඒ වරද කිරීම හා සම්බන්ධව යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් යම් ලේඛන පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, සුරාබදු කොමසාරිස්වරයාට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් දැනුම් දීම හෝ ඒවා භාරදීම කළ හැකි ය.

73. (1) මේ පනතේ සියලු කාර්ය හෝ ඉන් කිසිවක් සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර කොමසාරිස් ජනරාල් වරයා විසින් කලින් කල නිශ්චය කොට දක්වනු ලැබිය හැකි අතර එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතිපත්‍රයක් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතිපත්‍රයක් වෙනුවට වෙන යම් ආකෘතිපත්‍රයක් ආදේශ කිරීම හෝ කොමසාරිස් ජනරාල් වරයා විසින් කළ හැකි ය.

74. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් පහසු දිනයක අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

XV වන පරිච්ඡේදය
අන්තර්කාලීන විධිවිධාන

75. (1) නියමිත දිනයට පෙරාතුව වූ මාස හයක කාලසීමාවෙන් අවසන් වන මාස දොළහේ කාලය තුළ වූ යම් කාර්තුවක් සඳහා 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ ස්වකීය පිරිවැටුම රුපියල් ලක්ෂ දෙක ඉක්මවන සෑම තැනැත්තකු ම, නියමිත දිනයේ දී එම තැනැත්තා බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරනු ලබන හෝ කර ගෙන යනු ලබන්නේ නම්, ඔහු මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඔහු සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව ඔහුට අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස සලකනු ලබන යම් තැනැත්තකු විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා තමාගේ බදු අය කළ හැකි සැපයුම් 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණය නොඉක්මවන බව සඳහන් කරමින්, එම ලියාපදිංචිය පිළිබඳ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත විරෝධතා ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) ප්‍රකාශය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක 16 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.

XVI වන පරිච්ඡේදය
අර්ථ නිරූපණය

76. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"තක්සේරුකරු" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරනු ලැබූ තක්සේරුකරුවකු හෝ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු අදහස් වේ ;

"බලයලත් නියෝජිතයා" යන්නට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත මගින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"සමාලෝචන මණ්ඩලය" යන්නට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත මගින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"පුද්ගල මණ්ඩලය" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක්, යම් හවුල් ව්‍යාපාරයක් සහ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් ඊට ඇතුළත් වේ :

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ කොමසාරිස්වරයෙක් සහ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ :

"කොමසාරිස්වරයා" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය අදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් අදහස් වේ :

"සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවේ හෝ අන්කිසි තැනක හෝ බල පවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වේ :

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි වූ අධ්‍යක්ෂවරයකු අදහස් වන අතර ඊට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ද ඇතුළත් වේ :

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු අදහස් වේ :

"පොල්මකරු" යන්නට අද්මිනිස්ත්‍රාත්කරුවකුද ඇතුළත් වේ :

"භාණ්ඩ" යන්නෙන් සියලු වර්ගවල චංචල හෝ නිශ්චල දේපළ අදහස් වන නමුත් ඊට මුදල් අයත් නොවේ :

"අශක්‍යතාවට පත් තැනැත්තා" යන්නෙන් යම් බාල වයස්කරුවකු, උම්මත්තකයකු, මුග්ධයකු හෝ සිහිවිකල් තැනැත්තකු අදහස් වේ :

"ආනයනය කිරීම" යන්නෙන් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට පිටතින් ශ්‍රී ලංකාවට භාණ්ඩ රැගෙන ඒම හෝ රේගු බන්ධිත ගුදමකින් භාණ්ඩ ලැබීම අදහස් වන අතර බදු සහ වෙනත් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලබන විකිණීමක දී භාණ්ඩ මිල දී ගැනීම ද ඊට ඇතුළත් වේ :

"යෙදවුම් බද්ද" යන්නෙන් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට-

(අ) බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ දී ලියාපදිංචි තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒ තැනැත්තා වෙත සපයනු ලබන භාණ්ඩ හා සේවා මත ගෙවනු ලබන බද්ද : හෝ

(ආ) බදු අය කළ හැකි සැපයුම් ලබා දීමේ කාර්ය සඳහා ඔහු විසින් ප්‍රයෝජනයට ගනු ලැබූ භාණ්ඩ ආනයනය කිරීම මත ඔහු විසින් ගෙවන ලද බද්ද

එයින් අදහස් වේ.

"නිෂ්පාදනය" යන්නෙන් භාණ්ඩයක් සෑදීම, කවර හෝ ක්‍රමයකින් භාණ්ඩයක කොටස් එකතු කිරීම හෝ සම්බන්ධ කිරීම, යම් භාණ්ඩයක් විකිණීම සඳහා පිළියෙල කිරීම, භාණ්ඩයක් ඇසිරීම, බෝතල්වලට පිරවීම, පෙට්ටිවලට දැමීම, කැපීම, පිරිසිදු කිරීම, ඔප දැමීම, එතීම, ලේබල් ගැසීම හෝ තොග හෝ සිල්ලර වෙළඳම් ක්‍රියාකාරකමක දී විකිණීම හැර, විකිණීම සඳහා වෙනත් ආකාරයකින් පිළියෙල කිරීම අදහස් වේ :

"නිමැවුම් බද්ද" යන්නෙන් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ඒ තැනැත්තා විසින් සපයන ලද හෝ සපයන ලදැයි සැලකෙන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් අය කළ යුතු බද්ද අදහස් වේ :

"විවෘත වෙළෙඳපොල වටිනාකම" යන්නෙන් යම් දිනකට වූ භාණ්ඩ හෝ සේවා සැපයුමක වටිනාකම සම්බන්ධයෙන් වන විට, ආශ්‍රිත තැනැත්තන් නොවන තැනැත්තන් අතරෙහි අර්පණය කරනු ලැබූ සහ සිදු කරනු ලැබුවා වූ ද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු නිෂ්පාදන බද්දක් සහ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු යම් ආරක්ෂක බද්දක් ඇතුළත් නොවන්නා වූ ද සැපයුමක් වන සමාන අවස්ථාගත කරුණු යටතේ ඒ දිනයේ දී ශ්‍රී ලංකාව තුළ දී සපයනු ලැබුවේ නම්, ඊට සමාන සැපයුමක් විසින් සාමාන්‍යයෙන් ඉපයීමට හැකි මුදලින් වූ ප්‍රතිෂ්ඨාව අදහස් වේ :

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ :

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් නියම කිරීම අදහස් වේ ;

"ලියාපදිංචි තැනැත්තා" යන්නෙන් මේ පනතේ 10 වන වගන්තිය හෝ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තෙක් හෝ ලියාපදිංචි විය යුතු යයි සලකනු ලබන තැනැත්තෙක් අදහස් කරන අතර, මේ පනත යටතේ ලියාපදිංචි වීමට යටත් තැනැත්තෙක් ද රට ඇතුළත් වේ ;

"නිශ්චිත" යන්නෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත කරන ලද යන්න අදහස් වේ ;

"භාණ්ඩ සැපයුම" යන්නෙන් චංචල හෝ නිශ්චල දේපළ අයිතිකරු වශයෙන් එය බැහැර කිරීමේ අයිතිය පැවරීම අදහස් වේ ;

"සේවා සැපයුම" යන්නෙන් භාණ්ඩ සැපයුමක් නොවන ඕනෑම සැපයුමක් අදහස් වේ ;

"සැපයුම්කරු" යන්නෙන් භාණ්ඩ සහ සේවා සැපයුම සම්බන්ධයෙන් වන විට, සැපයුම කරනු ලබන තැනැත්තා අදහස් වේ ;

"බදු අය කළ හැකි කාලසීමාව" යන්නෙන් පිළිවෙලින් එක් එක් අවුරුද්දේ ජනවාරි මස පලමුවන ද, අප්‍රේල් මස පළමුවන ද, ජුලි මස පළමුවන ද සහ ඔක්තෝබර් මස පළමුනදා පටන්ගන්නා වූ මාස තුනක කාලසීමාවක් අදහස් වේ ;

"බදු අය කළ හැකි ක්‍රියාකාරකම" යන්නෙන් -

(අ) ස්වනියුක්තියක ක්‍රියාවලිය තුළ හැර, ව්‍යාපාරයක්, වෙළදාමක්, වෘත්තියක් හෝ රැකියාවක් ලෙස පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යනු ලබන යම් ක්‍රියාකාරකමක් හෝ වෙළෙඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් හෝ ආයතනයක් ;

(ආ) සමාජ ශාලාවක්, සංගමයක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් වන විට, ප්‍රතිෂ්ඨාවක් හා දයක මුදල ගෙවීම සඳහා එහි සාමාජිකයන්ට හෝ අන් අයට පහසුකම් සැලසීමක් ;

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් ක්‍රියාකාරකමක් හෝ පහසුකම් සැලසීමක් ආරම්භ කිරීමට, නැවැත්වීමට හෝ අදාළව කරනු ලබන යම් දෙයක්

(ඈ) යම් චංචල දේපළක් කුලියට හෝ බද්දට දීමක් හෝ නිශ්චල දේපළක් කුලියට හෝ බද්දට දීමක් ;

(ඉ) පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශක අයිති වැනි අස්පෘශ්‍ය දේපළ හෝ ඒ හා සමාන වෙනත් වත්කම් ප්‍රයෝජනයට ගැනීම.

"බදු අය කළ හැකි සැපයුම" යන්නෙන් මේ පනත යටතේ බදු අය කළ හැකි වූ ද ශ්‍රී ලංකාවේ දී සලසනු ලැබුවා වූ ද හෝ සලසනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද නිදහස් සැපයුමක් හැර, ශුන්‍ය ප්‍රතිශතයට අය කරන ලද සැපයුමක් ද ඇතුළුව යම් භාණ්ඩ සහ සේවා සැපයුමක් අදහස් වේ.

උපලේඛණය

(i) පොල්, කපාපු පොල්, පොල් කෙඳි, පොල් කෙඳි, පොල් පුන්නක්කු, කොප්පරා, රබර්, තේ, තේ දළු, කරදමුංගු, කුරුඳු කරාබු නැටි, සාදික්කා, ගම්මිරිස් හෝ යම් කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක, සත්ව පාලන, කුකුළන් ඇති කිරීමේ හෝ මත්ස්‍ය ව්‍යාපාරයක සැකසුම් නොකළ නිෂ්පාදන සැපයුම ;

(ii) අර්තාපල්, ලූනු සහ මිරිස් ආනයනය කිරීම හෝ එළවලු බීජ සැපයුම හෝ ආනයනය කිරීම ;

(iii) සහල්, සහල් පිටි, තිරිඟු හෝ තිරිඟු පිටි සැපයුම හෝ ආනයනය කිරීම ;

(vi) රෝස් කළ පාන්, සුදුලූනු පාන්, ප්‍රෙන්ච් බ්‍රෙඩ්, බනානා බ්‍රෙඩ්, බ්‍රෙඩ් රෝල්, හාඩ් බ්‍රෙඩ් රෝල් ආදී විසිතුරු පාන් හැර, පාන් සැපයුම ;

(v) කිරිවලින් සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩයක් හැර, කිරි හෝ පිටි කළ හෝ උකු කළ කිරි සැපයුම හෝ ආනයනය කිරීම ;

(vi) වසන ලද භාජනවල හෝ බෝතල්වල පුරවන ලද වතුර හැර වතුර සැපයුම ;

(vii) ඖෂධ නිෂ්පාදන හෝ ආයුර්වේද, සිද්ධායුර්වේද, යුනානි හෝ හෝමියෝපති බෙහෙත් වර්ග හෝ එවැනි නිෂ්පාදන සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් අමු ද්‍රව්‍යයක් සැපයුම හෝ ආනයනය කිරීම ;

(viii) රජයේ අරමුදල්වලින් දැනට මුදල් ගෙවනු ලබන හෝ කලින් එසේ රජයේ අරමුදල් ගෙවනු ලැබ දැනට එසේ මුදල් ගෙවනු නොලබන අධ්‍යාපනික ආයතන හෝ පාසැල් මගින් සපයනු ලබන යම් සේවාවන් සැපයුම :

(ix) පුවත්පත්, වාර ප්‍රකාශන හෝ සඟරා හැර පොත් සැපයුම හෝ ආනයනය කිරීම :

(x) කරවල හෝ උම්බලකඩ සැපයුම හෝ ආනයනය කිරීම :

(xi) සීනි, හකුරු හෝ සක්කර සැපයුම හෝ ආනයනය කිරීම :

(xii) භූමිතෙල්, ඩීසල් සහ පෙට්රෝලියම් ගෑස් ද්‍රාවණය සැපයුම හෝ ආනයනය කිරීම :

(xiii) ක්ලින්කර් සහ සිමෙන්ති සැපයුම හෝ ආනයනය කිරීම :

(xiv) රොක් පොස්ෆේට් ඇතුළු පොහොර සැපයුම හෝ ආනයනය කිරීම :

(xv) බොරතෙල් ආනයනය කිරීම :

(xvi) පහත දැක්වෙන මූල්‍ය සේවා සැපයීම -

(අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාම :

(ආ) මුදල් හුවමාරුව :

(ඇ) නෝට්ටුවක් හෝ ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, එකතු කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම :

(ඈ) යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ යම් සම්බන්ධතාවක් ඇත්තා වූ යම් ණය සුරැකුම් පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහණය හෝ පිටසන් කිරීම :

(ඉ) යම් සම කොටස් සුරැකුම්පතක් හෝ සහභාගි සුරැකුම් පතක් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ අයිතිය පැවරීම' :

(ඊ) සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගි සුරැකුම්පතක් නිකුත් කිරීම ප්‍රාරක්ෂණය කිරීම හෝ උප ප්‍රාරක්ෂණය කිරීම :

(උ) යම් ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැර පතක් සැපයීම :

(ඌ) භාණ්ඩ සැපයුම්ලාභියාට දැනුම් දුන්නා වූ ද, වෙනම වැය බරක් කරනු ලැබුවා වූ ද පහසුකමක් වන්නා වූ කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමක දී හෝ ණය විකිණීමේ ගිවිසුමක දී කොටස් වශයෙන් ණය මුදල ගෙවීමේ පහසුකම් සැලසීම :

(ඍ) ජීවිත රක්ෂණය :

(xvii) වරප්‍රසාද හා විදේශ මුක්තිවලට අදාළ, විදේශ දූත මණ්ඩල සම්බන්ධතා පිළිබඳ වියානා සම්මුතිය (1961) යටතේ වරප්‍රසාද හා විශේෂ මුක්තිවලට හිමිකම් ලබන විදේශ දූත මණ්ඩලවලට, එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ එහි විශේෂ අනුයෝජිත ආයතනවලට හා ඒ දූත මණ්ඩලවල සහ ආයතනවල කාර්ය මණ්ඩලවල සාමාජිකයන්ට, ප්‍රති අපනයනය සඳහා වූ තාවකාලික පිළිගැනීමේ සහතිකයක් යටතේ ආනයනය කිරීම ද ඇතුළු ව, භාණ්ඩ හා සේවා ආනයනය කිරීම හෝ සැපයීම්: එසේ වුව ද, ඉහත කී දූත මණ්ඩලවල, සංවිධානයේ ආයතනවල හා සාමාජිකයන්ගේ ශ්‍රී ලංකාවෙන් නියුක්ත ප්‍රතිරූපකයන්ට ද අන්‍යොන්‍ය ලෙස ප්‍රතිලාභ තිබිය යුතු අතර, එලෙස ඒ ප්‍රතිලාභ කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගෙන තිබිය යුතු ය;

එසේ වුව ද මෙම සාමාජිකයන්ට මෙම අන්‍යොන්‍ය ප්‍රතිලාභ ලබා දෙන්නේ ඔවුන්ගේ ශ්‍රී ලාංකික ප්‍රතිරූපකයන්ට ද නැවත ආනයනය සඳහා විදේශ දූත මණ්ඩල සම්බන්ධතා පිළිබඳ වියානා සම්මුතිය (1961) යටතේ තාවකාලික ආනයනය හෝ සැපයුම ද ඇතුළු අන්‍යොන්‍ය ප්‍රතිලාභ ලබා දී ඇත්නම් පමණි.

විදේශීය මුදලින් ගෙවීම සඳහා තීරුබදු රහිත සාප්පු වලට භාණ්ඩ ආනයනය කිරීම හෝ එම භාණ්ඩ සැපයුම :

(xix) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට අයත් පාවිච්චි නොකරන ලද තැපැල් හා ආදායම් මුද්දර ආනයනය කිරීම හෝ සැපයුම :

(xx) රේගු ආඥා පනතේ 107 වන වගන්තිය යටතේ සාදන ලද මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීමේ) නියෝග යටතේ බදු රහිතව නිෂ්කාශනය කරගැනීමට හිමිකම් ඇති යම් භාණ්ඩයක් හෝ රේගු ආඥාපනතේ උපලේඛණයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි නැවත ආනයනය කිරීමේ සහතිකය මත බදු රහිතව ලබාගත් යම් භාණ්ඩයක් හෝ නැවත අපනයනය කිරීම සඳහා බැදුම්කරයක් නොමැතිව ලත් යම් භාණ්ඩයක් හෝ නැවත ගබඩාවේ පදිංචිය සඳහා වූ භාණ්ඩ ආනයනය කිරීම:

(xxi) ස්වාභාවික හෝ වෙනත් විපත් නිසා ඇති වූ ආපදාවලට සහන සැලසීම සඳහා පිටරට තැනැත්තන්ගෙන් හා සංවිධානවලින් ත්‍යාග වශයෙන් ලැබුන බවට මුදල් මුදල් විෂය භාර අමාත්‍යවරයා සෑහීමට පත් වී ඔහු විසින් අනුමත කරන ලද භාණ්ඩ යම් සංවිධානයක් විසින් ආනයනය කිරීම :

(xxii) ගුවන් යානා ඉන්ධන හා කටාල ඉන්ධන සැපයීම

(xxiii) (සංචාරකයන් ප්‍රවාහනය කිරීම හෝ ගුවන් හෝ ජල ප්‍රවාහන සේවා හෝ විනෝද චාරිකා වශයෙන් හෝ කුලිරථ සේවා සැපයීම හෝ හැර) ජනතා මගී ප්‍රවාහන සේවා සැපයීම හෝ ජනතා මගී ප්‍රවාහන සේවා සඳහා මෝටර් කෝච් රථයක් හෝ මෝටර් කෝච් රථයක වැසියක් හෝ බදක් ආනයනය කිරීම හෝ සැපයුම :

(xxiv) කෘෂිකාර්මික කටයුතු සඳහා අනන්‍ය ලෙස පාවිච්චි කිරීම සඳහා පමණක් ට්‍රැක්ටර් ආනයනය කිරීම හෝ සැපයුම :

(xxv) නැවක හෝ ගුවන් යානයක අයිතිකරු විසින් හෝ නැවක් හෝ ගුවන් යානයක් බද්දට ගත් තැනැත්තකු විසින් අයිතිකරු හෝ බදුගත් තැනැත්තාගේ තත්ත්වයෙන් සේවා සැපයීම :

(xxvi) 1950 අංක 19 දරන විදුලිබල පනතේ අර්ථ කථනය. කර ඇති පරිදි එක් පාරිභෝගිකයකුට මසකට කිලෝවොට් පැය 75 දක්වා විදුලිබලය සැපයීම :

(xxvii) (අ) 1996 මැයි මස 16 වන දිනට පෙර හෝ :

(ආ) මුළු පිරිවැය රුපියල් මිලියන 500ට නොඅඩු ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නියමිත දිනයට පෙර ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මන්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විසින් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නියම කර ඇති යම් භාණ්ඩයක්, ඒ ගිවිසුමේ සඳහන් පරිදි ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ හෝ ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ දිනය දක්වා

යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා ආනයනය කිරීම :

(xxviii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විසින් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නියම කර ඇති යම් භාණ්ඩයක්,

(අ) නියමිත දිනයේ සිට අවුරුදු තුනක කාලයක් තුළ : හෝ

(ආ) ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තෙක් සහ කාලසීමා අවසන් වන දින යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් ආනයනය කිරීම :

(xxix) යම් ව්‍යාපෘතියක මුළු පිරිවැය රුපියල් මිලියන 500 ට අඩු නොවන අවස්ථාවක.

(අ) නියමිත දිනයේ සිට අවුරුදු තුනක කාලයක් තුළ : හෝ

(ආ) ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන දිනය තෙක්, යන මේ කාලසීමා අවසන් වන දින දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් ඒ ව්‍යාපෘතියේ ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නයම කර ඇති යම් භාණ්ඩයක් යම් තැනැත්තකු විසින් ආනයනය කිරීම :

(xxx) 1979 අංක 28 දරන දේශිය ආදායම් පනතේ අර්ථානුකූලව නිර්වාසික තැනැත්තකු විසින් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් සමාගමක් සමග ද ඒ සමාගමට, ඒ ගිවිසුම් අදාළ වන ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ට හෝ ඊට සමාන මුදලට නොඅඩු නම්, වාස්තු විද්‍යාත්මක, ඉංජිනේරුමය, ප්‍රධාන සමීක්ෂක හෝ ඉදිකිරීම් කළමනාකරණ සේවා නියමිත දිනයේදී හෝ එදිනට පෙර ශ්‍රී ලංකාවේ දී සැපයීම :

(xxxi) ශ්‍රී ලංකාවේ තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට, ඒ වෙනත් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සම්පූර්ණයෙන් ම පරිභෝජනය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම පිණිස සේවා සැපයීම.

77. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 35 දරන විසර්ජන පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 23 වන දින]

1997 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද, ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට සැලසීම සඳහා ද, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1996 අංක 35 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙන යම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1997 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1997 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී 1997 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් විසි දහස් අටසිය පහළොස් කෝටි හැටහය ලක්ෂ එකොළොස් දහසක් විය යුතු ආණ්ඩුවේ වියදම-

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් : හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් නවදහස් හත්සිය පනස් අට කෝටි දහසය ලක්ෂ විසිහය දහසක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් විසි දහස් අටසිය පහළොස් කෝටි හැටහය ලක්ෂ එකොළොස් දහසක් වූ මුදල, මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) 1997 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල එකතුව, ඒ උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. ඒ කටයුත්තෙන් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1997 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) යම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් : සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1997 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුලදී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතුය.එහෙත් ඒ වියදම් ඒ උපලේඛණයේ II තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන් 1997 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒ කටයුත්තේ මුළු බැරකම්, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 1997 මුදල් වර්ෂය තුල යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන

ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ, ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකි ය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේ ම මූල ධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේ ම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන්කිරීමකට හෝ, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක්, ඒ මුදල් වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (i) බලය දෙනු ලැබූ වියදම දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට : හෝ

(ii) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

7. (i) අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව -

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් :

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දැක්වෙන අවම සීමා

නියමයක් මගින්, 1998 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

(3) එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම්, එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

8. පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ -

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් :

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව, එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 36 දරණ ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 31 වන දින]

1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1996 අංක 36 දරණ ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ දීර්ඝ නාමයේ "පිළිවෙලින්, 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1996 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින්," 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1996 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1997 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1996 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන්, 1996 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1997 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් : සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි -

(අ) (ඊ) ඡේදයෙහි "යම් රත්රන් ප්‍රමාණයක වටිනාකම : සහ" යන වචන වෙනුවට "යම් රත්රන් ප්‍රමාණයක වටිනාකම :" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) (උ) ඡේදයෙහි "ඒ භාණ්ඩයේ වටිනාකම" යන වචන වෙනුවට "ඒ භාණ්ඩයේ වටිනාකම : සහ" යන වචන ආදේශ කිරීමෙන් :

(ඇ) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:

"(ඌ) යම් ගුවන් සේවයක් හෝ නැව් සමාගමක් විසින් ආනයනය කරන ලද අමතර කොටසක්, ජාත්‍යන්තර ගමනාගමන කටයුතුවල භාවිත කෙරෙන්නා වූ සහ ඒ ගුවන් සේවය හෝ නැව් සමාගම විසින් අයිතිය දරන්නා වූ හෝ කුලියට ගන්නා ලද්දා වූ යම් ගුවන් යානයක් හෝ නැවක් අළුත්වැඩියා කිරීම හෝ එහි නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ දී භාවිත කරන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ඔප්පු කරනු ලැබුවේ නම්, ඒ අමතර කොටසේ වටිනාකම.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙහි (ඊ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඊ) 1996 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1997 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා-

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා-

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට : සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට දෙකකට

සමාන වන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා -

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට;

සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට දෙකකට සමාන වන මුදලක්: සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ විට ලැබෙන මුදල : සහ

(උ) 1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1998 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා -

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා -

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් :

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා -

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට : සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් : සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (1) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ පසු ලැබෙන මුදල."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයෙහි 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"7. 1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1998 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා-

(i) මේ අයිතමයේ (11) වන ඡේදයේ සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත සියයට 4.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන පිරිවැටුම මත සියයට 0.5"

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1996 අංක 37 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 31 වන දින]

1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1996 අංක 37 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක මුදල් පනතේ දීර්ඝ නාමයෙහි යෙදෙන "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහාම" යන යන වචන හා ඉලක්කම් වෙනුවට " පිළිවෙලින්, 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහාම " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ ඡේදය (ii) වන අනුඡේදයෙහි "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු වශයෙන්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු වශයෙන් හෝ;" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(iii) ශ්‍රීලංකාවෙන් පිටත දී ඇතුළත් වූ සේවා ගිවිසුමක් අනුව, යම් ශ්‍රී ලංකා දූත මණ්ඩලයක ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත කරනු ලැබූ පුද්ගලයකු වශයෙන්".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි යෙදෙන " 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ වල" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

1996 අංක 38 දරණ මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 31 දින]

1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1.- මේ පනත 1996 අංක 38 දරණ මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1993 අංක 63 දරණ පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ වගන්තියේ (20අ) ඡේදයේ "1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක හෝ 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (20 ආ) ඡේදයේ "1990 අංක 18 දරණ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක හෝ 1990 අංක 18 දරණ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා 1996 නොවැම්බර් මස 7 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.